රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

# වාර්ෂික වාර්තාව

# 2022

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# පටුන


- සංස්ථාව සම්බන්ධව සැකෙවින් 01
- ආයතනික තොරතුරු 02
- දැක්ම, මෙහෙවර සහ අරමුණු 03
- සභාපතිතුමාගේ පණිවුඩය 04
- අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය 05
- ඉදිකිරීම් ව්‍යාපෘති පිහිටි ස්ථාන 06-07
- 2022 වසරේ සංස්ථාව මුහුණ දුන් අභියෝග 08
- ආයතනික පාලනය 10-14
- 2022 වසරේ කාර්ය සාධනය 15
- මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සමාලෝචනය 16-23
- මානව සම්පත් සමාලෝචනය 25-26
- විගණන කමිටු වාර්තාව 27-28
- මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල වගකීම දැක්වෙන ප්‍රකාශනය 29
- විගණකාධිපති වාර්තාව 30-39
- විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය 41
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 42
- හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 43
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 44
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 45-56
- ගිණුම් සටහන් 57-79
- වැඩි දියුණුව සඳහා වූ කෙටි කාලීන සහ දිගු කාලීන උපාය මාර්ග 80
- කළමනාකරණ විගණන වාර්තාව සහ එහි පිළිතුර 81
- අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමුවිය යුතු කරුණු 116 - 119
- දස අවුරුදු කාර්ය සාධන සාරාංශය 120















# රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

1957 අංක 49 දරණ කර්මාන්ත සංයුක්ත මණ්ඩල පනතට අනුව මහා පරිමාණ සිවිල් ඉංජිනේරුමය කොන්ත්‍රාත්තු කටයුතු කිරීම සඳහා 1971 වර්ෂයේ දී රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පිහිටුවා තිබේ. සංස්ථාවේ එකම කොටස්කරු වශයෙන් කටයුතු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයයි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පාලම්, මහා මාර්ග , ජලාශ, වාරිමාර්ග පද්ධති ජල විදුලි බලාගාර, උමං හා ඇළ මාර්ග, ජල සැපයීම් ව්‍යාපෘති, ගොඩනැගිලි හා ඉදිකිරීම් ව්‍යාපෘති යන ඉංජිනේරුමය කාර්‍යයන්හි නිරතව සිටී.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදන අයිතම් වල සිට පෙරසවි කොන්ක්‍රීට් පාලම් කදම්භ(BEAMS), සම්ප්‍රේෂණ කුළුණු සහ දුම්රිය පාකඩ (Raliway Sleepers) දක්වා වන සියලුම කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනයේ පුරෝගාමී ආයතනයකි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව ඉහත ඉදිකිරීම් කටයුතු වලට අමතරව මුළු දිවයිනම ආවරණය වන පරිදි මාර්ග සංඥා ලාම්පු පද්ධති සහ විදි ලාම්පු සැපයීම සවි කිරීම නඩත්තු කිරීම් කටයුතු කරනු ලබයි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව රටේ යටිතල පහසුකම් සංවර්ධන කාර්‍යයෙහි ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් ජාතික ආර්ථිකයට සෘජුවම දායකත්වය ලබා දෙන අතර, මීට අමතරව රජයේ කිසිම ආධාරයක් නොමැතිව ඉංජිනේරුවන් හා අනෙකුත් තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීම තුලින් ද ඉදිකිරීම් ක්ෂේත්‍රයට හා පොදුවේ රටට මිල කල නොහැකි සේවාවක් සපයමින් සිටී.



# ආයතනික තොරතුරු

- ආයතනයේ නම : රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
- ආයතනයේ නෛතික තත්ත්වය : රාජ්‍ය සංස්ථා
- සංස්ථාපන පනත : 1971.03.29 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 14.951/4
- පාලනය : 1957 අංක:49 දරණ කාර්මික ආඥා පනත යටතේ
- සංස්ථාපනය කරන ලද දිනය : 1971.10.01
- ලියාපදිංචි කාර්යාලය : අංක:7, බොරුපන පාර, රත්මලාන.<br>දු.ක. 0112-607560
- කොන්ක්‍රීට් අංගන :
  - i. රත්මලාන කොන්ක්‍රීට් අංගනය<br>දු.ක. 0112-632786
  - ii. බෝපිටිය කොන්ක්‍රීට් අංගනය,පන්නල<br>දු.ක. 037-2288415
  - iii. වේරගංතොට කොන්ක්‍රීට් අංගනය<br>දු.ක. 055-2257101
  - iv මැදවච්චිය කොන්ක්‍රීට් අංගනය<br>දු.ක. 081-2387056
  - v. ලුණුගම්වෙහෙර කොන්ක්‍රීට් අංගනය,<br>දු.ක. 047-3144880
- සංචාරක බංගලා
  - i. පේරාදෙණිය<br>දු.ක. 081-2387056 0112-607560
  - ii. මැදවච්චිය<br>දු.ක. 025-3899916
- විගණක : විගණකාධිපති දෙපාර්තමේන්තුව
- බැංකුකරුවෝ : ලංකා බැංකුව<br>මහජන බැංකුව

# ආයතනයේ ඉදිරි දැක්ම, ගමන් මග හා අරමුණු

## ඉදිරි දැක්ම

*"ජාතික ආර්ථිකයට වටිනාකම් එකතු කරන යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ නියුතු හොඳම ආයතනය වීම."*

## ඉදිරි ගමන් මග

*ජාතික යටිතල පහසුකම් සංවර්ධනය හා විවිධ ඉදිකිරීම් කටයුතු වලට සහභාගී වීම හා එම කටයුතු ඉහලම තත්ත්වයෙන් කර ගෙන යැමත් මගින් රටේ ආර්ථික සංවර්ධනයට උදව් කිරීම හා සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් හා පෙරසවි / පෙරනිමි කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍ර වල වෙළඳ පොළ පෙර ගමන්කරු වීම.*

## අරමුණු

(1) ලංකාව තුල හෝ විදේශයකදී ඕනෑම පාර්ශවයකට අයිති ගොඩනැගිලි සිවිල් ඉංජිනේරුමය කාර්යයන්, අනෙකුත් ඉංජිනේරුමය ව්‍යාපෘති හෝ අනෙකුත් ව්‍යාපාර තනිව හෝ අනෙකුත් දේශීය සමාගමක් සමග එක්ව හෝ වෙනත් විදේශීය සමාගමක් සමග එක්ව හෝ අනෙකුත් එවැනි ආයතනයක් පවරා ගැනීමෙන් හෝ කොටස් ලබා ගැනීමෙන් විමර්ශනය, ආයෝජනය, සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම..

(2) ඉහත සඳහන් ව්‍යාපෘති කාර්යයන් ශ්‍රී ලංකාව තුල හෝ විදේශයකදී ක්‍රියාත්මක කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා තනිව හෝ අනෙකුත් දේශීය හෝ විදේශීය සමාගමක් සමග එකතුව හෝ එවැනි සමාගමක් පවරා ගැනීමෙන් හෝ කොටස් අත්පත් කර ගැනීම තුලින් කටයුතු කිරීම

(3) ඉහත සඳහන් කරුණු 01 හෝ 02 අවශ්‍ය කරන යාන්ත්‍රික හා විද්‍යුත් කාර්‍යයන් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හෝ තැනීම් කිරීම.

(4) ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය කොන්ක්‍රීට්, සවි ගැන්වූ හා පෙරසවි කොන්ක්‍රීට් දේශීයව හෝ විදේශීයව නිෂ්පාදනය හා අලෙවි කිරීම.

(5) ඉංජිනේරුමය ව්‍යාපෘති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය උකහා ගැනීම සහ ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර සහ අමු ද්‍රව්‍ය නිෂ්පාදනය, අලෙවි කිරීම, ආනයනය සහ අපනයනය කිරීම.

(6) ඉහත සඳහන් අංක 1 2 3 හා 4 කාර්යයන් සඳහා අවශ්‍ය ඉදිකිරීමේ ද්‍රව්‍ය, ක්‍රම සහ උපයෝගි කරගන්නා තාක්ෂණය සම්බන්ධව පර්යේෂණ කිරීම.

(7) ඉහත අංක 1 2 3 හා 4 සඳහා අවශ්‍ය වන කළමණාකාරිත්ව දැනුම, කුසලතාවය හා නවීන තාක්ෂණික දැනුම යනාදිය කළමණාකරුවන්ට/ ඉංජිනේරුවන්ට/ තාක්ෂණික නිලධාරීන්ට පුහුණු වීමේ අවස්ථා මගින් ලබාදීම.

(8) ශක්තිමත් ස්වයං මූල්‍ය හැකියාවක් ඇති ආයතනයක් වශයෙන් පවත්වා ගැනීම.

(9)ලාභදායි සහ ජව්‍ය ආයතනයක් වීම.

(10) ස්ථාවර පිරිවැටුම් වර්ධනයක් ලගා කර ගැනීම.

(11) අවදානම හඳුනා ගැනීම හා ක්‍රමානුකූලව කළමණාකරණය කිරීම.

# සභාපතිතුමාගේ පණිවුඩය



2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම ඉමහත් සතුටට පත් වෙමි.

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය 7.8% කින් හැකිලී ගිය අතර, තීව්‍ර වූ ආර්ථික අර්බුධය හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රය පෙර වසරට සාපේක්ෂව 20.09% ක හැකිලීමකට ලක් විය.

උග්‍ර ඉන්ධන සහ අමුද්‍රව්‍ය හිඟය, වේගවත් උද්ධමනය, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණයට ලක්වීම, ආනයනික අමුද්‍රව්‍ය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරමින් ආදාන පිරිවැය ඉහළ යාම, ප්‍රධාන උපයෝගිතා මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම, විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ආනයන සීමා කිරීම්, සැපයුම්කරුවන්ගේ හිඟ ණය ආදී කරුණු නිසා ඉදිකිරීම් කර්මාන්තය අඩාල විය. රජයේ අරමුදලින් ක්‍රියාත්මක වූ, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවීම් ප්‍රමාද වීම, රජයේ ව්‍යාපෘති අත්හිටුවීම, ඉහළ පොලී අනුපාත නිසා පෞද්ගලික ආයෝජන සීමා වීම ආදිය පෙර වසර වල නොවූ විරූ ලෙස අභියෝගවලට හේතු විය.

මෑත ඉතිහාසයේ අප අත්විඳින ලද වඩාත්ම අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් වුවද, අපගේ නොපසුබස්නා අධිෂ්ඨානය තුලින් රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව නව මාවත් ඔස්සේ ඉදිරියට ගෙන ගිය අතර, 2021 වසර තුල උපයා ගත් රු. බි. 4.2 ක ආදායම හා සැසඳීමේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පසුබෑම හමුවේ වුවද රු. බි. 2.5 ක ආදායමක් ලබා ගැනීමට සමත් විය. ප්‍රධාන වශයෙන් ආදායම අඩුවීම මෙන්ම විකුණුම් පිරිවැය වැඩිවීම හේතුවෙන් රු. මි. 27 ක ශුද්ධ ලාභයක් පමණක් උපයා ගැනීමට සංස්ථාව සමත් විය. රජය සතු ව්‍යවසායයක් වශයෙන්, අපි සියලු නියාමන අවශ්‍යතා පිළිපදින අතර ඒවාට අනුකූලව කටයුතු කරන අතරම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ශක්තිමත් පාලන ක්‍රමෝපායන් සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් තුලින් පාලනය සහ වගවීම පිළිබඳ ගැටලු නිරාකරණය සඳහා උත්සුක වෙමු,

රජය සහ එහි අමාත්‍යාංශ ආදිය රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාවේ ප්‍රධාන සේවාදායකයින් ලෙස තවදුරටත් පවතින අතර නව වෙළඳපළ තත්ත්වයන්ට අනුගත වෙමින් පෙර සවි කොන්ක්‍රීට් නිශ්පාදන, වානේ සැකිලි සැකසීම, වාහන වල අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකිරීම ආදී, පාළම් ඉදිකිරීම වැනි සාම්ප්‍රදායික ඉදිකිරීම් ව්‍යාපෘති වලින් පරිබාහිර ව්‍යාපෘති වල නියැලීමට රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව කටයුතු කරනු ලබයි.

අවසාන වශයෙන්, මෙම ආයතනය වෙනුවෙන් ලබාදෙන මගපෙන්වීම සහ සහාය වෙනුවෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා සහ ලේකම් වෙත කෘතවේදීත්වය පල කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ වටිනා මගපෙන්වීම වෙනුවෙන් ස්තූතිවන්ත වෙමි. තවද, ආයතනයේ සාමානයාධිකාරීතුමාගේ සහයෝගය සහ දායකත්වය වෙනුවෙනුත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කැපවීම වෙනුවෙනුත්, අප ආයතනයේ වටිනාම සම්පත වන අපගේ කාර්ය මණ්ඩලය වෙතත් මාගේ විශේෂ ස්තූතිය පිරිනැමීමට කැමත්තෙමි.

S. M. K.

ඉංජි. කුෂාන් දේවින්ද
සභාපති

# අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| 1. ඉංජි. එස්. එම්. කුශාන් දේවින්ද මහතා | සභාපති |
| 2. මහාචාර්ය පී. බී. රංජිත් දිසානායක මහතා | අධ්‍යක්ෂ |
| 3. ආචාර්ය සුනිල් පී. ලියනාරච්චි මහතා | අධ්‍යක්ෂ |
| 4. කේ. කේ. චන්ද්‍රිකා මිය | අධ්‍යක්ෂ |
| 5. කුශාන් වැගොඩපොල මහතා | අධ්‍යක්ෂ |
| 6. දිනුශ කෝන්කඩුව මහතා | අධ්‍යක්ෂ |
| 7. ඩබ්. ඒ. එන්. තුෂාරී මිය | භාණ්ඩාගාර නියෝජිත |

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

| | |
|---|---|
| 1. ඉංජි. ඩී. එස්. ඩී .ඩී .සී .රාජසිංහ මහතා | සාමාන්‍යාධිකාරි |
| 2. ඉංජි. ඩබ්. ඒ. ඩී. ආර්.ශාන්ත කුමාර මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්) |
| 3. ඉංජි. ඩී. ඒ. පී. දමයන්ති මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රගති සමාලෝචන) |
| 4. ඉංජි. ඊ. ඩී. එන්. රංජිත් මහතා | වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (යාන්ත්‍රික) |
| 5. ඉංජි. යූ. ආර්. හේමජිත් මහතා | වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( සංවර්ධන හා සැලසුම්) |
| 6. ජයති මායාදුන්නේ මෙනෙවිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) |
| 7. සී. එන් බෝගහවත්ත මිය (එල්.එල්.බී.) | වැ. බ. ජ්‍යෙෂ්ඨ කළමණාකාර (මානව සම්පත් හා පරිපාලන) |
| 8. ආර් .ඒ. කේ. නිශාන්ත මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 9. අසංක මොහාන් මහතා | වැ.බ. සැපයුම් කළමණාකරු |


SD&CC ව්‍යාපෘති
2022
ඉදිකිරීම් ව්‍යාපෘති
ග්‍රාමීය පාළම් ව්‍යාපෘති
1288
1278
1296
1301
1300
1317/1318
1319/1320
1327
1294
1322
1373
1371
1321
1285
1267
1373
1283
1264
1280
1299
1190
1289
1269
1330
1328
1329
1279
1286
1372
1378
1379
1178
1172/1185
1333
1381
1186
1178
1268
1177
1171
1184
1163
1161
1207
1180
1179
1188

# ව්‍යාපෘති ලැයිස්තුව - 2022

1121 හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය වාට්ටුව සහ ශල්‍යාගාර සඳහා යෝජිත ගොඩනැගිලි
1161 කිරිදි ඔය හරහා මෝදරපැලැස්ස පාලම
1163 වලවේ ගඟ හරහා තාලිගල සහ රිදියාගම පාලම
1171 කිරිදි ඔය හරහා උඩුවිල හා රබර්වත්ත පාලම
1172 ඌරුබොක්ක ඔය හරහා කෙසෙල්වත්ත කටුවාන පාලම
1174 රඹුක්වැව කොට්ඨාසයේ වැලිගත්තර හරහා පාලම
1175 මුවන්වැව සහ වීරවිල් ආර අතර වීරවිල් ආර හරහා පාලම
1176 අභයපුර කොට්ඨාසය සහ පන්නෙගමුව කොට්ඨාසය අතර දියබණ්ඩිය පාලම
1177 වලවේ ගඟ හරහා බැඳිගන්තොට හා ලියන්ගස්තොට පාලම
1178 මලලආර රන්මඩුවැව හරහා තණමල්විල පාර පාලම
1179 යාය වලස්මුල්ල පල්ලේකන්ද පාර පාලම
1180 ඌරුබොක්ක ඔය හරහා කුඹුක්මුල්ල මැදගොඩ පාලම
1181 තලුන්න අදුපැලැන හරහා පාලම
1184 තරුණසේවා කීරම ඔය හරහා හඳුගල පාලම
1190 හංවැල්ල පාලමේ අලුත්වැඩියා කටයුතු
1205 සූරියවැව රෝහල පිටුපස ඇළ හරහා පාලමක් ඉදිකිරීම.
1206 වලස්මුල්ල ජාතික පාසල සඳහා පදික පාලම
1207 වරාපිටිය දෙයියන්දර මාර්ගයේ පාතේගම දිඹුල්ගහහේන දොළ හරහා පාලම
1238 කටුගස්තොට බඹරැල්ල පාළම
1264 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හි මැකලම් ඇල හරහා වානේ පාලමක් ඉදිකිරීම
1265 ගිරිදර මංසන්ධියේ වැඩිදියුනු කිරීමේ කටයුතු
1266 කටුවන පාර, රුක්මල්පිටිය, හුලංකන්ද, හැගොඩ පාර වැඩි දියුණු කිරීම.
1267 ජා-ඇල - ඒකල පාර, පැලියගොඩ පුත්තලම පාර සහ ගම මැද පාරේ මංසන්ධිය
1268 අංක. 62/5 ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ පාලම ප්‍රතිසංස්කරණය කිරීම
1269 පනාගොඩ හේන්පිට පාරේ අංක. 1/3 පාලම ප්‍රතිසංස්කරණය කිරීම (B354)
1271 කළුගඟ දකුණු ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය සකස් කිරීම
1272 නාඋල - ඇලහැර පල්ලේගම පාරේ මාඔය හරහා පාලම අංක 36/6
1278 පරන්තන් –කරච්චි මුලතිව පාරේ අංක 12/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම
1279 හොරවල පාලම
1280 මැක්ඩොනල්ඩ්ස් අසල රාජගිරියේ පාලම 5/1
1283 අළුත් මාවත සි පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම
1284 වත්තල - හේකිත්ත මාර්ගය වැඩිදියුණු කිරීම
1285 මොරොන්තොට - අරන්දර මාර්ගය වැඩිදියුණු කිරීම
1286 ඇඹිලිපිටිය - පනාමුර - බුළුතොට පාර වැඩිදියුණු කිරීම
1287 කන්දෙවිහාර හන්දිය පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම (අදියර 1/ අදියර 2)
1288 වේලනෙයි PS හි ග්‍රාමීය මාර්ග - යාපනය දිස්ත්‍රික්කය

1289 නාවල අංගම්පිටිය පාලම
1290 කොළඹ වැල්ලවාය පාරේ පාලම් අංක 105/2
1291 කැනියොන් උමං මාර්ගයේ අලුත්වැඩියා කටයුතු
1294 මහනුවර යාපනය පාරේ රැඳවුම් තාප්ප ඉදිකිරීම
1295 මහවලි බී කලාපයේ වැව්වල අවසාදිත ඉවත් කිරීම
1296 වැලිඔය සම්පත්නුවර මාර්ගය වැඩිදියුණු කිරීම
1298 මීගමුව ශාන්ත නිකලස් පාරේ සිරිකුරුස පාලමේ අලුත්වැඩියා කටයුතු
1299 ආරක්ශක මූලස්ථානයේ VVIP ප්‍රවේශ පාලම
1300 අනුරාධපුර ග්‍රාමීය මාර්ග (P22)
1301 අනුරාධපුර ග්‍රාමීය මාර්ග (P23)
1317 දඹුල්ල-බකමූණ-කලගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම
1318 දඹුල්ල-බකමූණ-කලගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම
1319 මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P26)
1320 මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P27)
1321 පන්සිල්ගොඩ පාලම
1322 රඹුක්කන මාර්ග ව්‍යාපෘතිය
1327 හුන්නස්ගිරිය මීමුරේ පාරේ හීන් ගඟ හරහා පාලම ඉදිකිරීම
1336 කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1337 මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1338 නුවර එළිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1339 රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1340 නුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1341 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1342 පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1343 මොනරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1344 බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1347 කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1348 ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1349 කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1350 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1351 ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1352 මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1353 පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1354 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1355 අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1356 මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1357 යාපනය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1358 මන්නාරම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1359 මුලතිව් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1360 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1361 වව්නියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1365 කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්
1366 ඇඹිලිපිටිය ජල ව්‍යාපෘතිය
1370 UPVC බෙදාහැරීමේ මාර්ග හොරණ - පාදුක්ක පාර
1371 අංක 01 වරකාපොල අතුරු මාර්ගය ඉදිකිරීම
1372 ඉත්තපාන සහ හොරවල පාර සම්බන්ධ කරමින් බෙන්තර ගඟ හරහා පාලම
1373 ගැටඹේ මහවැලි ගඟ දිගේ ගැබියන් බැම්ම ඉදි කිරීම
1374 තිස්සමහර ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම්(දෙවන අදියර)
1375 වැව් ප්‍රතිසංස්කරණය - අනුරාධපුර දිස්ත්‍රික්කය
1376 වැව් ප්‍රතිසංස්කරණය - පොලොන්නරුව දිස්ත්‍රික්කය
1381 මාදු ගඟ පාලම
1384 කෝට්ටපිටිය පාලම
1386 වානේ පාලම අංක 1 - හපුගොඩ - කලවාන
1387 වානේ පාලම අංක 2 - හපුගොඩ - කලවාන
1391 කෙත්හේන ජල ව්‍යාපෘතිය

# 2022 වර්ෂයේ සංස්ථාව මුහුන දුන් අභියෝග

මෑත දශක කිහිපය තුළ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල නිරත වෙමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. සමස්ත ඉදිකිරීම් කර්මාන්තයම COVID 19 සහ ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම්වලට මුහුණ දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් අභියෝග වලට මුහුණ පෑමට සිදු විය.

- යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් යෙදවීම රජය විසින් සීමා කිරීම හේතුවෙන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ව්‍යාපෘති අත්හිටුවීම. (උදා: ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය)

- ආර්ථිකයේ ඉහළ උද්ධමනය හේතුවෙන් මිල ඉහළ යාමේ පූර්ව ඇස්තමේන්තු යටතේ ආවරණය නොවූ මිනිස් ශ්‍රමය, අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර ආදියේ සැලකිය යුතු මිල ඉහළ යාම.

- ආනයන සීමා කිරීම් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් ඇති අහිතකර ප්‍රතිපත්ති තීරණ හේතුවෙන් නිශ්චිත ක්‍රියාකාරකම් සඳහා ආනයනික ද්‍රව්‍ය නොමැතිකම. (උදා: පෙර- සවි කොන්ක්‍රීට් බාල්ක සඳහා වානේ කම්බි)

- ඉදිකිරීම් කර්මාන්තයට බැංකු හරහා ලබා දෙන ණය පහසුකම් අඩු කිරීම

- රජයේ සීමා සහිත ආර්ථික ප්‍රවේශය හේතුවෙන් නව ව්‍යාපෘති නොමැති වීම .

- උපයෝගිතා සේවා සඳහා අධික නඩත්තු පිරිවැය. (ඉහළ විදුලි පිරිවැය , අධික ජල පිරිවැය , ඉහළ ඉන්ධන මිල)

# නාවල - අංගම්පිටිය පාලම ඉදිකිරීම







# ආයතනික පාලනය

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාවේ අරමුණු තීරණය කිරීමත් එකී අරමුණු ලඟා කර ගන්නා අයුරින් ආයතනයේ මෙහෙයුම් කර ගෙන යාමත් සහ කාර්යය සාධනය සොයා බැලීමත් ආයතනික පාලනය යන්නෙන් අදහස් කෙරේ. එමනිසා ව්‍යාපෘති අවදානම් ඵලදායි ලෙස හඳුනාගැනීමත් ඒවා පාලනය කිරීමත්, කළමනාකරණය කිරීමත් ආයතනික පාලනය තුලින් බලාපොරොත්තු වේ.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව සම්පූර්ණයෙන් රාජ්‍ය හිමිකාරීත්වය යටතේ ඇති ආයතනයක් වන අතර, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ආමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය යටතේ ක්‍රියාත්මක වෙයි. අමාත්‍යංශය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය ඍජුවම රජයට වගකීමට බැඳී සිටී. එම නිසා ආයතනය පාලනය කරනු ලබන්නේ සහ මෙහෙය වනු ලබන්නේ සංස්ථාවේ සහ එයට සම්බන්ධ වන පාර්ශවයන්ගේ යහපත පිණිස වන බවට සහ එය පාලනය වන නීතිරීති වලට අනුකූලව ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය බැඳී සිටී.

ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතු වේ. එම නිසා රාජ්‍ය ව්‍යවසාය පාර්ලිමේන්තුව පාලනයට යටත් වේ. අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධව තීරණ ගැනීමේ වගකීමට බැඳී සිටී. රාජ්‍ය සංස්ථාවල මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වගකීමට බැඳී සිටී. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය, ආර්ථික කාර්‍යක්‍ෂමතාවය සහ ඵලදායීත්වය ඇතිකර ගැනීම සඳහා වන ඔවුනගේ වගකීම ඉටු කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍යය රෙගුලාසි, නීතිරීති, නියමයන්, මග පෙන්වීම් සහ නියෝග චක්‍රලේඛ මගින් ලබාදෙනු ලබයි.

භාණ්ඩාගාර නියෝජිත වශයෙන් කටයුතු කරනු ලබන අධ්‍යක්ෂ හැර අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත අමාත්‍යංශ ලේකම්වරයා විසින් කරනු ලබයි. කොටස් හිමිකාරිත්වය දරණ මහා භාණ්ඩාගාරය විසින් එක් අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබයි.

සංස්ථාවේ ලැදියාවන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ පුද්ගලික ලැදියාවන් අතරේ එකිනෙක ගැටෙන තත්ත්වයන් නොමැති අතර, සංස්ථාවේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන්නේ, ඉදිකිරීම් තුල වඩා හොඳ මූල්‍යමය සහ මෙහෙයුම් ශක්තියෙන් යුතු ආයතනයක් බවට පත්කිරීමටය. ආයතනික යහපාලනය උදෙසා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් ගෙන ඇති පියවරයන් පහත දැක්වේ.

# ආයතනික යහපාලනය

| යහපාලන මූලධර්ම | පවත්වාගෙන යාමේ ක්‍රමවේදය |
|---|---|
| **අධ්‍යක්ෂ මණ්ඩලය** | |
| අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, ක්‍රියාකාරි අධ්‍යක්ෂ වරයෙකුගෙන්ද, විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගෙන්ද සමන්විතය. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු පත්කරනු ලබන්නේ මහාභාණ්ඩාගාරය විසිනි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ අවශ්‍යතාවයට අනුව සහ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය වන පරිදි ප්‍රමාණවත් මග පෙන්වීමක් කල හැකි විශේෂ හා විවිධ හැකියාවන්ගෙන් යුතු කණ්ඩායමකින් සමන්විතය. |
| ක්‍රමානුකූලව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම. | විශේෂ අවස්ථාවන්හි පැවැත්විය යුතු රැස්වීම් වලට අමතරව සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ක්‍රමානුකූලව පවත්වනු ලැබේ. |
| අධ්‍යක්ෂ මණ්ඩල තිරණ ගැනීමට අයත්වන විධිමත් කාරණා ලැයිස්තුවක් පවත්වා ගැනීම. | **<u>අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වගකීමට බැඳේ</u>**<br><br>• රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයන් හැටියට සංස්ථාවේ සාර්ථක කාර්‍ය සාධනයක් සහතික කිරීම.<br>• ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් සැකසීම සහ ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරනවාද යන්න අධීක්ෂණය කිරීම.<br>• සාමාන්‍යාධිකාරි සහ ප්‍රධාන කළමණාකරන නිලධාරින් පත්කිරීම, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්ගේ කාර්‍යය සැළසුම් කිරීම සහ ආයතනයේ ව්‍යුහය අනුමත කිරීම.<br>• ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම සහතික කිරීම.<br>• උසස් නෛතික ප්‍රමිතියක් පවත්වාගෙන යාම සහතික කිරීම මේ යටතේ භාණ්ඩාගාර චක්‍රලේඛණ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ආමාත්‍යාංශයේ මගපෙන්වීම් පිළිපැදීම පිළිබඳව සලකා බැලේ.<br>• සභාපතිගේ සහ සාමාන්‍යාධිකාරිගේ පාලනය යටත් නොවන ගෙවීම් වන වාර්ෂික ප්‍රසාද දීමනා, නිවාඩු පඩි ගෙවීම් යනාදිය අනුමත කිරීම.<br>• දේපළ පිරියත සහ උපකරණ වල ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජන තීරණය කිරීම.<br>• වාර්ෂික අයවැය සහ සංයුක්ත සැළැස්ම අනුමත කිරීම.<br>• ප්‍රසිද්ධ කිරීම සඳහා වන වාර්ෂික ගිණුම් වාර්තා අනුමත කිරීම. |

| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | සංස්ථාවට ස්ථිර ලේකම්වරයෙක් නොමැත. නීති නිලධරයා මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරයි. අදාල මණ්ඩල පත්‍රිකා සහිත සියලුම මණ්ඩල රැස්වීම්වල ලිපිගොනු සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව කල්තියා බෙදා හැරීමට ඇය කටයුතු කරයි. රැස්වීම් වාර්තා අත්සන් කරන සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ ඇය සියුම ක්‍රියාදාමයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා සකස් කරනු ලබයි. |
| ස්වාධිනව තිරණ ගැනීම සහ වඩාත් සුදුසු ක්‍රම වේදය | කලමණාකරන මණ්ඩලය විසින් වටිනාකම් එකතු කරමින්ද, ස්වාධීන තිරණ ගනිමින්ද, රා.සං.හා.නි.නී. සංස්ථාවේ තිරණ ගැනිමේ ක්‍රියාවලියට සහභාගිවේ. එමෙන්ම, බාහිර බලපෑම් වලින් සහ පාලනයන්ගෙන් තොරව ඔවුන්ගේ වගකිම් ඉටුකිරිමට අධ්‍යක්ෂ මණ්ඩලය කටුයතු කරයි. |
| සංස්ථාවේ සහ මණ්ඩලයේ කාරනා සම්බන්ධයෙන් සාධාරණව කාලය සහ ශ්‍රමය වෙන්කිරිම. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ සහ සංස්ථාවේ ගැටළු සම්බන්ධයෙන් සාධාරණ කාලයක් වෙන් කරනු ලබයි. ඊට අමතරව මාසිකව පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි විම සහ විගණන සහ කලමණාකරන කමිටු, රැස්වීම් වල සාකච්ජා කරනු ලබන කාරණා සම්බන්ධයෙන් දන්වා යැවිම. |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම. | සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය ඇතුව සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව පාලනය කරනු ලබයි. |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය | අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් විධායක නොවන ස්වාධින අයවේ. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙක්ද, නීතිඥවරයෙක්, ඉංජිනේරුවරු දෙදෙනෙක් සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරයාගෙන්ද සමන්විත වේ. කලමණාකරනයේ සාමූහික දැනුම සහ පළපුරුද්ද සංස්ථාවේ අවශ්‍යතාවය හා සැසැඳෙන බව මණ්ඩලය විශ්වාස කරයි. |
| කලමණාකරන තොරතුරු ප්‍රමානවත්ව සහ කාලිනව ලබා ගැනිම. | සංවිධානය කරන ලද කලමණාකරන තොරතුරු පද්ධතියක් පැවතිම අධ්‍යක්ෂ මණ්ඩලයට නිවැරදි සහ අදාල තොරතුරු අවශ්‍ය පරිදි ලබාදීම. යම් අවස්ථාවක ඔවුන්ට ලැබෙන තොරතුරු තිරණ ගැනිම සඳහා ප්‍රමාණවත් නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තිරණය කරනු ලැබුවහොත් ඔවුන් විසින් අමතර තොරතුරු කැඳවනු ලබන අතර, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයද දැනුවත් කරනු ලබයි. |
| ශක්තිමත්, ස්වාධින විධායක නොවන පුද්ගලයන්ගෙන් මණ්ඩලය සමන්විත විම. | අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරයක් විධායක නොවන ස්වාධින අධක්ෂවරුන්ගෙන් සමන්විත වේ.. |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්‍ය්‍ය සාධනය මැන බැලිම. | මණ්ඩලය කටයුතු කරනු ලබන ආකාරය පිලිබඳව මැන බැලීමට විශේෂිත වූ ක්‍රම වේදයක් නොමැත. එමනිසා අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලයේ මූලික ක්‍රියා පටිපාටි මැන බැලිමට ස්ව අගය කිරිමක් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදි පහත දැක්වෙන ක්‍රියාකාරකම් පිලිබඳව සලකා බලනු ලබයි.<br>• ව්‍යවස්ථාපිත රෙගුලාසි වලින් පනවා ඇති වගකිම් සහ මණ්ඩලයට ඇති වගකිම් ඉටුකිරිම.<br>• ආයතනික පාලනය සහ කලමණාකරනය අධික්ෂණය. |

| | |
|---|---|
| | • වාර්ෂික තීරණ ගැනීම සඳහා තම මතය ලබාදීම<br>• අමාත්‍යාංශය යටතේ අඛණ්ඩව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.<br>• ඉංජිනේරුවන්, තාක්ෂණික ශිල්පීන්, ගණකාධිකාරීවරුන් සහ අනෙකුත් පුහුණු සේවකයන් සම්බන්ධයෙන් ඇති වන පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් සැලැස්ම නිර්මාණය කිරීම.<br>• අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරය කළමණාකරනය කිරීම සම්බන්ධයෙන් දරන පොදු මතය |
| සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩලය පිළිබඳව | සංස්ථාවේ පරමාර්ථ සහ අරමුණු වලට අදාලව මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩලය වෙනුවෙන් මූල්‍ය සහ මූල්‍ය නොවන අරමුණු දක්වනු ලැබේ. |
| | සංස්ථාවේ ආයතනික සැලැස්ම සහ අයවැය තුළ දක්වා ඇති ප්‍රධාන ආයතනික අරමුණු සහ පරමාර්ථ සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරන මණ්ඩලයේ අරමුණු ලෙස සැලකෙන අතර, ඔවුන්ගේ කාර්ය්‍ය සාධනය මැන බලනු ලබන්නේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. සංස්ථාවේ මෙහෙයුම් කළමණාකරනය සාමාන්‍යාධිකාරි වෙත පවරා ඇත. |
| **ප්‍රධාන ගනුදෙනු** | |
| ප්‍රධාන ගනුදෙනු සහ සංස්ථාවේ ඒකාබද්ධ ශුද්ධ වත්කම් කෙරෙහි ඒවායේ බලපෑම් හෙළිදරව් කිරීම. | ප්‍රධාන ගනුදෙනු සහ සංස්ථාවේ ඒකාබද්ධ ශුද්ධ වත්කම් කෙරෙහි ඒවායේ බලපෑම් අවශ්‍යය තැන්හිදි හෙළිදරව් කරඇත. |
| **ගිණුම්තැබීම සහ විගණනය** | |
| **මූල්‍ය වාර්තාකරනය** | |
| සංස්ථාවේ වර්තමාන තත්ත්වය සහ ඉදිරිය පිළිබඳව හෙළිදරව් කිරීම. | සංස්ථාවේ කටයුතු පිළිබඳව සාධාරණ ආගනනය කිරීමක් සඳහා කාර්තු වාර්තා ඔවුන් විසින් දෙනු ලැබූ විශේෂිත ආකෘති කිහිපයකට අනුව පිළියෙල කොට කාලීනව මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලබයි. මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිති පදනම් කරගෙන සකසා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතයන් අනුවය. එමනිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණවත් අයුරින් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත හා එකඟ වේ. |
| වාර්ෂික වර්තාව තුළ සභාපතිගේ ප්‍රකාශන ඇතුලත් කිරිම. | මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 04 සභාපතිගේ වාර්තාව දක්වා ඇත. |
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම් ඇතුලත් ප්‍රකාශයක් හා ඔවුන්ගේ වාර්තා කිරිමේ වගකිම් දැක්වෙන විගණකාධිපතිගේ ප්‍රකාශය | මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 29 යටතේ මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකිම් සම්බන්ධව ප්‍රකාශයක්ද පිටු අංක 30 සිට 39 දක්වා 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශය සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාවද ඇතුලත් වේ. |

| | |
|---|---|
| **අභ්‍යන්තර පාලනය** | |
| මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු වල අනුකූලතාවය සහ සංස්ථාවේ වත්කම් ආරක්ෂා වන ආකාරයේ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම. | කළමණාකාරිත්වය විසින් ඵලදායක අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර ඇති බව හා ඒ තුලින් නෛතික මූල්‍ය නීති, අමාත්‍යංශ සහ භාණ්ඩාගාරයේ මගපෙන්වීම් සහ අනෙකුත් නීති රෙගුලාසි හා එකග වන බවටත් සහතික වීම. |
| **මගපෙන්වීම.** | I. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ගනු ලබන තිරණ ක්‍රියාත්මක කිරිම සඳහා අදාල නිලධාරින්ට දන්වා සිටිම සහ පෙරලා එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.<br><br>II. මෙහෙයුම් මූල්‍ය සහ සේවකයන් සම්බන්ධව කාරනා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා සිටිය යුතු කාරනා සම්බන්ධව සාකච්ඡා කරන ජ්‍යෙෂ්ඨ සේවක රැස්වීම් මසකට වරක් පවත්වනු ලබන්නේ සියලුම අංශ ප්‍රධානීන් හා ප්‍රධාන ඉංජිනේරුවන් සහභාගීත්වයෙනි.<br><br>III. ඉදිකිරිම් අංශය සහ කොන්ක්‍රීට් අංගන සඳහා සෑම මසකම ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. මේ සඳහා සියලුම ව්‍යාපෘති සහ අංගන කළමණාකරුවන් සහභාගි වන අතර, අවසානයේ ඒ පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයටද වාර්තා කරනු ලබයි. |
| **විගණන කමිටු සහ විගණකවරු** | |
| ස්වාධින විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විගණන කමිටුව සහ ඒ පිලිබඳව වාර්ෂික වාර්තාවේ ඇතුලත් වාර්තාව | විගණන කමිටුවේ මූලසුන දරනුයේ අධ්‍යක්ෂ මෙන්ම භාණ්ඩාගාරයේ නියෝජිතවරයා විසිනි. අනෙකුත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු මෙම කමිටුවට ඇතුලත් වේ.. විගණකාධිපති දෙපාර්තමෙන්තුවේ නියෝජිතයා සහ අමාත්‍යංශ නියෝජිතයා මේ සඳහා සහභාගි වනු ලබන්නනේ ආරාධනාව මතයි. |
| විෂය මූලික බව සහ ස්වාධිනත්වය සහතික විම පිණිස බාහිර විගණකයන් සමග යෝග්‍ය අයුරින් සම්බන්ධකතා ගොඩනාගා ගෙන පවත්වාගෙන යනු ලබයි. | රා.සං.හා.නි.නී. සංස්ථාව විසින් විගණකයන්, විගණකාධිපති දෙපාර්තමෙන්තුව සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙනයනු ලබයි. |
| පරික්ෂණ මණ්ඩලය | 2022.12.31 දිනට දේපල, යන්ත්‍ර සහ උපකරණ ආගණනය කර ඇත. |
| **ආයතනික පාලනය හෙලිදරව් කිරිම.** | |
| සංස්ථාව තුල පනවා ඇති ආයතනික පාලනය හෙලිදරව් කිරිම. | ආයතනික යහ පාලනය සහ එය ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන මගපෙන්වීම් අනුව කාර්‍යක්ෂම ක්‍රියාපටිපාටි හඳුනා ගෙන ක්‍රියාත්මක කිරිම තුලින් යහ පාලනය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනුලබයි.<br><br>මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද සිද්ධාන්ත සහ ක්‍රියාවන් දැනටමත් සංස්ථාව තුල ක්‍රියාත්මක වන බව සටහන් කිරිමට කැමැත්තෙමි. දැනට සංස්ථාව තුල ක්‍රියාත්මක නොවන පරිචයක් අතලොස්සක් සඳහා ඒවා නිවැරදි කිරිමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ.<br><br>එමෙන්ම යහ පාලනය සම්බන්ධයෙන් ඇති යෝජනා සහ මග පෙන්වීම් තුලින් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල මෙහෙයුම් ආකෘතිය සහ නීති පරිසරය වැඩි දියුණු කරනු ලබන බවට විශ්වාස කෙරේ. |

# 2022 වසර තුළ කාර්ය සාධනය

මෙම වසරේ, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් සංචලන සීමා පැනවීමට හේතු වූ අතර, එය දේශීය හා ජාත්‍යන්තර වෙළඳාමට බාධා කළ අතර සැපයුම් දාම අවහිර කළේය  පාලන පියවර හේතුවෙන් කර්මාන්තශාලා සීමිත කාර්ය මණ්ඩලයක් සමඟ ක්‍රියාත්මක වීමට සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන ප්‍රමාදයන් ඇති විය  එහි ප්‍රතිඵලයක් ලෙස, ලබා ගත හැකි සැපයුම්කරුවන් සංඛ්‍යාව අඩු වූ අතර, අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී අපට අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

ඊට අමතරව, ඉදිකිරීම් අංශයට වෙන් කරන ලද අරමුදල් සඳහා රජය සීමාවන් පැනවූ අතර, එමඟින් අපගේ ග්‍රාමීය පාලම් මාර්ග ව්‍යාපෘතිය නතර කිරීමට අපට සිදුවිය  රජය කිසිදු නව ව්‍යාපෘතියක් දියත් නොකිරීම නිසා, අපගේ සමාගමට කිසිදු නව කොන්ත්‍රාත්තුවක් හෝ අවස්ථාවක් නොලැබුණි.

මෙම අභියෝග හමුවේ, අපගේ කොන්ක්‍රීට් අංගනවල ධාරිතාව වැඩි කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු.  අමුද්‍රව්‍ය හිඟයට මුහුණ දීම සඳහා, ස්ථාවර සැපයුමක් සහතික කිරීමට අපි පියවර ගත් අතර අපගේ ශ්‍රම බලකාය පුළුල් කළෙමු. එසේ කිරීමෙන්, මෙහෙයුම් පවත්වා ගැනීමට සහ තත්වය වැඩිදියුණු වූ පසු අනාගත අවස්ථාවන් සඳහා සූදානම් වීමට අපි ඉලක්ක කළෙමු.  මුහුණ දුන් දුෂ්කරතා තිබියදීත්, අපගේ සංස්ථාවේ හැකියාවන් ශක්තිමත් කිරීමට සහ පරිණාමය වන තත්වයන්ට අනුවර්තනය වීමට අපි කැපවී සිටියෙමු.

ඉහත සඳහන් කළ කොන්දේසි යටතේ 2022 වර්ෂයේදී සංස්ථාව වාර්ෂිකව රුපියල් බිලියන 2 5 ක ආදායමක් උපයා ඇත කෙසේ වෙතත්, ඉහළ විකුණුම් පිරිවැය හේතුවෙන්, ශුද්ධ ලාභය වසර සඳහා රුපියල් මිලියන 27 කට සීමා විය.

ශක්තිමත් ආදායමක් තිබියදීත්, වැඩි වූ වියදම් ලාභදායිතාවයට සැලකිය යුතු ලෙස බලපෑ අතර එමඟින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු ලාභයක් ලැබුණි.

## මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය

සංස්ථාවේ වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මගින් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සමාලෝචනය කරයි. මෙහෙයුම් සහ මූල්‍ය සමාලෝචනය මගින් ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාකාරිත්වය විග්‍රහ කරනු ලබයි.

## සංස්ථාවේ ක්‍රියාකාරීත්වය

සංස්ථාවේ පෙර වසරේ වාර්තා කල රුපියල් මිලියන 4215ට සාපේක්ෂව 2022 වර්ෂය තුල රුපියල් මිලියන 2545ක පිරිවැටුමක් වාර්තා කර ඇත. මෙම පිරිවැටුම 81% නිර්මාණ අංශයෙන් ද 11% කොන්ක්‍රීට් අංගන සහ 8% මාර්ග සංඥා පද්ධති සහ යාන්ත්‍රික සේවාවන්හි ද සමස්ත දායකත්වයකි. 2021 වසරේ ලබා ගත් රු මි 96 ක ශුද්ධ ලාභය (බදු පසු ) හා සැසඳීමේදී 2022 වසරේ රු මි 26 ක ශුද්ධ ලාභයක් (බදු පසු ) ලබා ඇත.

## පිරිවැටුම දල ලාභය සහ ශුද්ධ ලාභය පිළිබද විශ්ලේෂණය




## ආංශික කාර්යය සාධනය



## ඉදිකිරීම් අංශය

නිර්මාණ අංශය මගින් ඉදිකිරිමේ ව්‍යාපෘති කාර්ය සාධනය මෙහෙයවනු ලබන අතර, මෙහිදි වැඩ සටහන් සැකසීම, සම්පත් අවශ්‍යතාවයන් තීරණය කිරිම, බිල්පත් ඉදිරිපත් කිරිම හා අනුමත කර ගැනිමට කාල වකවානු නිර්ණය කිරිම යන ආදි කරුණු අදාල කර ගනී.

## ඉදිකිරීම් පිරිවැටුම සහ දල ලාභය




ව්‍යාපෘති මගින් ලැබූ ආදායම 2021 වර්ෂයේදි රුපියල් මිලියන 3371 සිට 2022 වර්ෂයේදි රුපියල් මිලියන 2059 දක්වා පහළ ගොස් ඇත ඉදිකිරීම් අංශය සංස්ථාවේ මුළු පිරිවැටුමෙන් 81% ක දායකත්වයක් ලබාදී ඇත. මෙම අංශය විසින් සලකා බලන වර්ෂය තුළදී රුපියල් මිලියන 417 ක් බදු පෙර ලාභයක් වාර්තා වී ඇත.

## කොන්ක්‍රීට් අංගන

රා. සං. හා. තී. නි. සංස්ථාව රත්මලාන, වේරගංතොට, බෝපිටිය, මැදවච්චිය සිහ ලුණුගම්වෙහෙර යන ස්ථාන වල කොන්ක්‍රිට් අංගන 05ක් පවත්වාගෙන යනු ලබන අතර, පේරාදෙණිය විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි. මෙම කොන්ක්‍රිට් අංගන මගින් දැනට සංස්ථාවේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කොන්ක්‍රිට් නිෂ්පාදන ලබා දෙන අතර, ලංකා විදුලි බල මණ්ඩලය, දුම්රිය දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පෞද්ගලික ආයතනයන්ට අවශ්‍ය කොන්ක්‍රිට් නිෂ්පාදන වන පි. එස්. සි. බිම්, විදුලි කණු ආර්. සි. සි. පයිප්ප, පාලම් උපාංග මෙන්ම අනෙකුත් නිෂ්පාදන වන බිම් ඇතිරුම්, කොන්ක්‍රිට් ලැලි සහ ගල් මෙන්ම කුහර ගල් ද සපයනු ලැබේ.

සලකා බලන වර්ෂය තුළදී කොන්ක්‍රිට් අංගන විසින් රුපියල් මිලියන 287 ක පිරිවැටුමක් වාර්තා කල අතර එය පසුගිය වර්ෂයේදි රුපියල් මිලියන 464ක් විය. කොන්ක්‍රිට් අංගන විසින් සංස්ථාවේ සමස්ථ පිරිවැටුමෙන් 11%ක දායකත්වයක් ලබාදී ඇත. මෙම අංශය රුපියල් මිලියන 100 දළ ලාභයක් ලබා ඇත.

## කොන්ක්‍රීට් අංගන පිරිවැටුම සහ දල ලාභය




## මාර්ග සංඥා පද්ධති හා යාන්ත්‍රික සේවා

යාන්ත්‍රික අංශය මගින් මාර්ග සංඥා පද්ධති හා යාන්ත්‍රික සේවා අධීක්ශනය කරනු ලබයි. මෙහි මූලික පරමාර්ථය වන්නේ දැනට සංස්ථාව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතිවලට අවශ්‍ය සේවා සැපයීම වේ. ඊට අමතරව මාර්ග සංඥා ඒකකය 2005 දි පිහිටුවනු ලැබූ අතර, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් මාර්ග සංඥා පද්ධතිය නඩත්තුව සහ අලුත්වැඩියාව කරනු ලබයි.

මාර්ග සංඥා සහ අනෙකුත් වැඩ සේවාවන් මගින් රුපියල් මිලියන 198 ක පිරිවැටුමක් අත්කරගෙන ඇති අතර පෙර වර්ෂයේදී මෙම අංශයේ පිරිවැටුම රුපියල් මිලියන 380 ක් විය. මාර්ග සංඥා සහ අනෙකුත් වැඩ සේවාවන් මගින මගින් සංස්ථාවේ මුලු ආදායමට 8% ක දායකත්වයක් සපයා ඇත.
මෙම අංශය රුපියල් මිලියන 1.5ක දල ලාභයක් ලබා ඇත.

## මාර්ග සංඥා පද්ධති හා යාන්ත්‍රික සේවා පිරිවැටුම සහ දල ලාභය



# දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ සාරාංශය 2022 දෙසැම්බර් 31 දිනට

| අංක | කේතය | ව්‍යාපෘතියේ නම | සේවාදායක | ව්‍යාපෘති වටිනාකම (රු. මි.) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ආදායම (රු. මි.) | භෞතික % |
| **හම්බන්තොට පාලම්** | | | | | | |
| 1 | 1161 | කිරිදි ඔය හරහා මෝදරපැලැස්ස පාලම | RDA | 205.20 | 138.22 | 75% |
| 2 | 1163 | වලවේ ගඟ හරහා තාලිගල සහ රිදියාගම පාලම | RDA | 235.61 | 144.28 | 75% |
| 3 | 1171 | කිරිදි ඔය හරහා උඩුවිල හා රබර්වත්ත පාලම | RDA | 163.69 | 103.11 | 96% |
| 4 | 1172 | ඌරුබොක්ක ඔය හරහා කෙසෙල්වත්ත කටුවාන පාලම | RDA | 55.49 | 15.88 | 40% |
| 5 | 1177 | වලවේ ගඟ හරහා බැදිගන්තොට හා ලියන්ගස්තොට පාලම | RDA | 245.71 | 62.95 | 37% |
| 6 | 1178 | මලලආර රන්මදුවැව හරහා තණමල්විල පාර පාලම | RDA | 90.19 | 39.65 | 58% |
| 7 | 1179 | යාය වලස්මුල්ල පල්ලේකන්ද පාර පාලම | RDA | 83.76 | 22.17 | 59% |
| 8 | 1180 | ඌරුබොක්ක ඔය හරහා කුඹුක්මුල්ල මැදගොඩ පාලම | RDA | 93.94 | 72.13 | 77% |
| 9 | 1181 | තලුන්න අදුපැලැන හරහා පාලම | RDA | 93.04 | 27.04 | 38% |
| 10 | 1184 | තරුණසේවා කීරම ඔය හරහා හඳුගල පාලම | RDA | 35.76 | 29.73 | 73% |
| 11 | 1185 | ඌරුබොක්ක ඔය හරහා කම්මලේ තොටුපල පාලම | RDA | 43.98 | 34.06 | 84% |
| 12 | 1186 | කොහොම්පෝරුව සහ සියඹලාමුරය අතර තුන්දොල හරහා පාලම | RDA | 39.76 | 39.99 | 97% |
| 13 | 1188 | කීරම ඔය හරහා අඟුල්මඩුව අරංවෙල පාර | RDA | 97.63 | 44.63 | 22% |
| 14 | 1205 | සූරියවැව රෝහල පිටුපස ඇළ හරහා පාලමක් ඉදිකිරීම. | RDA | 28.77 | 19.40 | 96% |
| 15 | 1206 | වලස්මුල්ල ජාතික පාසල සඳහා පදික පාලම | RDA | 22.03 | 2.53 | 15% |
| 16 | 1207 | වරාපිටිය දෙයියන්දර මාර්ගයේ පාතේගම දිඹුල්ගහහේන දොළ හරහා පාලම | RDA | 38.09 | 11.52 | 50% |
| **අනෙකුත් පාලම්** | | | | | | |
| 1 | 1190 | හංවැල්ල - පූගොඩ පාරේ පාලම් අංක 1/1 අලුත්වැඩියාව | RDA | 112.94 | 27.53 | 22% |
| 2 | 1264 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මැකලම් ඇළ හරහා වානේ පාලමක් ඉදිකිරීම. | CMC | 63.96 | 115.26 | 99% |

| අංක | කේතය | ව්‍යාපෘතියේ නම | සේවාදායක | ව්‍යාපෘති වටිනාකම (රු. මි.) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය ආදායම (රු. මි.) | භෞතික % |
|---|---|---|---|---|---|---|
| 3 | 1268 | අංක. 62/5 ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ පාලම ප්‍රතිසංස්කරණය කිරීම | RDA | 80.68 | 51.71 | 81% |
| 4 | 1269 | පනාගොඩ හේන්පිට පාරේ අංක. 1/3 පාලම ප්‍රතිසංස්කරණය කිරීම (B354) | RDA | 71.13 | 72.69 | 99% |
| 5 | 1278 | පරන්තන් –කරච්චි මුලතිව පාරේ අංක 12/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම | RDA | 109.83 | 38.93 | 53% |
| 6 | 1279 | හොරවල පාලම | RDA | 58.14 | 33.25 | 69% |
| 7 | 1280 | මැක්ඩොනල්ඩ්ස් අසල රාජගිරියේ පාලම 5/1 | RDA | 93.17 | 46.21 | 50% |
| 8 | 1290 | කොලඹ වැල්ලවාය පාරේ පාලම් අංක 105/2 | RDA | 48.47 | 33.15 | 98% |
| 9 | 1299 | ආරක්ශක මූලස්ථානයේ VVIP ප්‍රවේශ පාලම | RDA | 409.66 | 191.60 | 73% |
| 10 | 1289 | නාවල පාලම | RDA | 1,698.55 | 1,727.70 | 87% |
| 11 | 1321 | පන්සිල්ගොඩ පාලම | SMRR | 70.34 | 22.45 | 44% |
| 12 | 1327 | හුන්නස්ගිරිය මීමුරේ පාරේ හීන් ගඟ හරහා පාලම ඉදිකිරීම | SMRR | 61.01 | 15.15 | 34% |
| 13 | 1371 | අංක 01 වරකාපොල අතුරු පාලම ඉදිකිරීම | RDA | 357.87 | 58.76 | 36% |
| 14 | 1372 | ඉත්තපාන සහ හොරවල පාර සම්බන්ධ කරමින් බෙන්තර ගඟ හරහා පාලම | RDA | 484.18 | 36.97 | 6% |
| 15 | 1374 | පත්තිනිගොඩ පාලම | SMRR | 61.39 | 2.84 | 5% |
| 16 | 1381 | මාදු ගඟ හරහා පාලම | RDA | 780.75 | 39.70 | 7% |
| **මහා මාර්ග** | | | | | | |
| 1 | 1267 | ජා-ඇල - ඒකල පාර, පෑලියගොඩ පුත්තලම පාර සහ ගම මැද පාරේ මංසන්ධිය | RDA | 79.24 | 39.12 | 99% |
| 2 | 1283 | අළුත් මාවත ඉහළ ශාන්ත ඇන්ඩෲස් පාර සිට දුම්කොළ සමාගම දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | RDA | 159.40 | 49.41 | 68% |
| 3 | 1284 | වත්තල - හේකිත්ත මාර්ගය වැඩිදියුණු කිරීම | RDA | 189.94 | 115.92 | 87% |
| 4 | 1288 | යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය සභාවේ මාර්ග වැඩිදියුණු කිරීම | RDA | 112.83 | 66.71 | 83% |
| 5 | 1294 | මහනුවර/යාපනය පාර රූදවුම් තාප්ප ඉදිකිරීම | RDA | 49.55 | 11.33 | 32% |
| 6 | 1296 | වැලිඔය සම්පත් නුවර සිට ගජබාපුර පාර | RDA | 56.00 | 13.18 | 38% |

| අංක | කේතය | ව්‍යාපෘතියේ නම | සේවාදායක | ව්‍යාපෘති වටිනාකම (රු. මි.) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ආදායම (රු. මි.) | භෞතික % |
| **100,000 km මහාමාර්ග ව්‍යාපෘතිය** | | | | | | |
| 1 | 1285 | මොරොන්තොට - අරන්දර මාර්ගය වැඩිදියුණු කිරීම | RDA | 167.32 | 101.94 | 76% |
| 2 | 1286 | ඇඹිලිපිටිය - පනාමුර - බුළුතොට පාර වැඩිදියුණු කිරීම | RDA | 177.41 | 107.09 | 79% |
| 3 | 1287 | කන්දෙවිහාර හන්දිය පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම (අදියර 1/ අදියර 2) | RDA | 206.87 | 86.19 | 61% |
| 4 | 1300 | තලවැව හන්දිය සිට වරාපොතාන පාර (P-22) | RDA | 211.29 | 83.51 | 67% |
| 5 | 1301 | විලච්චිය පාර (P-23) පුනරුත්ථාපන/වැඩිදියුණු කිරීම් | RDA | 180.39 | 65.36 | 56% |
| 6 | 1317 | දඹුල්ල-බකමූණ-කලගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම | RDA | 186.62 | 47.79 | 29% |
| 7 | 1318 | දඹුල්ල-බකමූණ-කලගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම | RDA | 178.31 | 90.37 | 60% |
| 8 | 1319 | මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P26) | RDA | 203.86 | 14.57 | 10% |
| 9 | 1320 | මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P27) | RDA | 204.32 | 21.22 | 14% |
| 10 | 1322 | රඹුක්කන මාර්ග ව්‍යාපෘතිය | RDA | 176.22 | 64.75 | 75% |
| **ගොඩනැගිලි** | | | | | | |
| 1 | 1121 | හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය වාට්ටුව සහ ශල්‍යාගාර සඳහා යෝජිත ගොඩනැගිලි | MOH | 94.56 | 89.32 | 90% |
| **ජල සම්පාදන, වාරිමාර්ග, ජල විදුලි උත්පාදන** | | | | | | |
| 1 | 1366 | ඇඹිලිපිටිය ජල ව්‍යාපෘතිය | NWS&DB | 105.94 | 35.92 | 75% |
| 2 | 1370 | UPVC බෙදාහැරීමේ මාර්ග හොරණ - පාදුක්ක පාර | NWS&DB | 20.47 | 14.60 | 100% |
| 3 | 1374 | තිස්සමහර ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම්(දෙවන අදියර) | NWS&DB | 143.34 | 18.20 | 17% |
| **විවිධ** | | | | | | |
| 1 | 1373 | ගැටඹේ මහවැලි ගඟ දිගේ ගැබියන් බැම්ම ඉදි කිරීම | MASL | 213.68 | 45.26 | 37% |
| **ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය** | | | | | | |
| 1 | 1336 | කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 86.28 | 36.78 | 80% |
| 2 | 1337 | මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 51.62 | 36.04 | 64% |

| අංක | කේතය | ව්‍යාපෘතියේ නම | සේවාදායක | ව්‍යාපෘති වටිනාකම (රු. මි.) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය ආදායම (රු. මි.) | භෞතික % |
|---|---|---|---|---|---|---|
| 3 | 1338 | නුවර එළිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 66.87 | 11.00 | 51% |
| 4 | 1339 | රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 109.39 | 46.35 | 50% |
| 5 | 1340 | නුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 234.75 | 50.68 | 35% |
| 6 | 1341 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 125.45 | 38.46 | 56% |
| 7 | 1342 | පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 56.79 | 37.32 | 99% |
| 8 | 1343 | මොනරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 75.40 | 69.54 | 89% |
| 9 | 1344 | බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 71.50 | 29.20 | 67% |
| 10 | 1347 | කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 93.65 | 44.51 | 65% |
| 11 | 1348 | ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 158.28 | 48.14 | 47% |
| 12 | 1349 | කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 82.15 | 36.11 | 62% |
| 13 | 1350 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 93.01 | 46.73 | 78% |
| 14 | 1351 | ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 116.07 | 23.91 | 70% |
| 15 | 1352 | මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 65.89 | 15.25 | 50% |
| 16 | 1353 | පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 112.55 | 29.26 | 41% |
| 17 | 1354 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 274.67 | 65.86 | 77% |
| 18 | 1355 | අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 90.59 | 64.94 | 76% |
| 19 | 1356 | මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 60.71 | 36.23 | 77% |
| 20 | 1357 | යාපනය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 11.55 | 5.37 | 95% |
| 21 | 1358 | මන්නාරම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 17.56 | 1.49 | 25% |
| 22 | 1359 | මුලතිව් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 58.82 | 3.84 | 13% |
| 23 | 1360 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 14.01 | 12.18 | 95% |

| අංක | කේතය | ව්‍යාපෘතියේ නම | සේවාදායක | ව්‍යාපෘති වටිනාකම (රු. මි.) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ආදායම (රු. මි.) | භෞතික % |
| 24 | 1361 | වව්නියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 33.30 | 4.57 | 38% |
| 25 | 1365 | කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් | SMRR | 23.99 | 1.50 | 18% |

| අංක | කේතය | අංශය | අයවැයගත ආදායම 2022 (රු. මි.) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | සත්‍ය ආදායම (රු. මි.) | මූල්‍ය % |
| **උපදේශන සේවා** | | | | | |
| 1 | - | උපදේශන සේවා | 8.00 | 8.40 | 105% |
| **කොන්ක්‍රීට් අංගන** | | | | | |
| 1 | 051 | රත්මලාන | 234.00 | 69.38 | 30% |
| 2 | 053 | බෝපිටිය | 211.00 | 29.62 | 14% |
| 3 | 052 | වේරගන්තොට | 161.00 | 54.00 | 34% |
| 4 | 812 | මැදවච්චිය | 117.00 | 30.13 | 26% |
| 5 | 1276 | ලුනුගම්වෙහෙර | 77.00 | 28.06 | 36% |
| **යාන්ත්‍රික සේවා** | | | | | |
| 1 | 006 | ප්‍රවාහන අංශය | 61.90 | 42.50 | 69% |
| 2 | 005 | යාන්ත්‍රික වැඩපල | 36.00 | 18.40 | 51% |
| 3 | 005 | සැකිලි අංශය | 15.50 | 9.30 | 60% |
| 4 | 897 | විදුලි සංඥා පද්ධති | 360.00 | 167.27 | 46% |

**කෙටි යෙදුම්:**

| | |
|---|---|
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| CMC | කොළඹ මහ නගර සභාව |
| SMRR | ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය |
| MOH | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| NWS&DB | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| MASL | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |

# ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය


















# මානව සම්පත්

මානව සම්පත් සංස්ථාවේ ප්‍රධාන වත්කම වේ. සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා මානව සම්පත කායිකව හා මානසිකව තෘප්තිමත් වියයුතුය.

මානව සම්පත සංවර්ධනය කිරිම උදෙසා සංස්ථාව නිරන්තරයෙන්ම ආයෝජනය කරනු ලබන අතර, නිරන්තරයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරය තුල කාර්යය මණ්ඩල හැකියාවන් ඕනෑම ආයතනයක ශක්තිය බව අප ආයතනයේ විශ්වාසයයි. එම නිසා පුරෝකථනය කරන ලද ප්‍රතිඵල ලබාගැනිමට පුහුණු දක්ෂ ශ්‍රම බලකායක් ඇති කිරිමට සියළු උත්සාහයන් දරනු ලැබේ.

2022 වර්ෂයේ ආර්ථික අර්ධබුදකාරි තත්ත්වයන් අනුව, සංස්ථාවේ අරමුණු සහ මානව සම්පත් ප්‍රවර්ධනය සඳහා වූ බොහෝ වැඩසටහන් සැකසීමට නොහැකි විය.

1. **සේවක සුභසාධනය**

   සේවකයින් සඳහා සංස්ථාව විසින් අනුග්‍රහය දක්වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සහ සේවක වන්දි රක්ෂණ ක්‍රමය අලුත් කරන ලදි.

   කළමනාකාරිත්වය විසින් ප්‍රදානය කරන ලද පැමිණිමේ දිමනාවක් සේවකයන්ට හිමි විය ඉංජිනේරුවන් සඳහා රු. 20,000 අනෙකුත් සේවකයින් සඳහා රු. 8,500

2. **සේවක ඇගයීම**

   2022 වසරේ ආර්ථික අර්බුදය හේතුවෙන් වසර 25ක සේවා කාලය සම්පූර්ණ කළ කාර්ය මණ්ඩල සේවකයින් සඳහා විශේෂ සිහිවටනයක් සහ රන් කාසියක් පිරිනැමීම සිදු නොවීය.

3. **වැටුප් වැඩිවීම්**

   2022 වර්ශය සඳහා වැටුප් වැඩිවීමක් සිදු නොවුනි.

4. **බාහිර ආයතන සඳහා සපයන ලද පුහුණුව**

   රටේ පොදු සංවර්ධන කටයුතු වලට දායකවීමක් ලෙස විශ්ව විද්‍යාල සහ ජාතික ආධුනිකත්ව මණ්ඩල වැනි බාහිර ආයතන විසින් යොමු කරනු ලබන පුද්ගලයින් හට ඉදිකිරිමේ ක්ෂේත්‍රයේ විවිධ අංශ තුල මනා පුහුණුවක් ලබා දීම සිදුකරනු ලබයි.

## අපගේ කාර්ය මණ්ඩල ශක්තිය

| තනතුර | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරුවන් | 56 | 73 | 73 | 73 | 76 | 114 | 77 |
| යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරුවන් | 09 | 09 | 08 | 08 | 07 | 09 | 09 |
| ගණකාධිකාරීවරු | 08 | 08 | 08 | 07 | 07 | 07 | 07 |
| අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් | 20 | 22 | 21 | 21 | 17 | 21 | 20 |
| අධිකාරීවරුන් (සිවිල්/ යාන්ත්‍රික/ විදුලි) | 28 | 28 | 22 | 25 | 24 | 37 | 28 |
| සැලසුම් ශිල්පීන්/ ප්‍රමාණ සමීක්ෂක | 04 | 03 | 03 | 05 | 05 | 05 | 05 |
| ආරක්ෂක කාර්ය මණ්ඩලය | 43 | 56 | 52 | 50 | 51 | 46 | 43 |
| ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි | 105 | 107 | 105 | 104 | 99 | 95 | 92 |
| අධීක්ෂණ සහ අනෙකුත් නිපුණතා ශ්‍රේණි | 310 | 348 | 337 | 334 | 334 | 300 | 284 |
| **එකතුව** | **583** | **654** | **629** | **627** | **594** | **634** | **565** |

# විගණන කමිටු වාර්තාව - 2022

2010/12/14 දිනැති අංක PED 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රතිපාදන මත විගණන කමිටුව ප්‍රතිස්ථාපනය කර ඇත.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිතාවය තහවුරු කිරිම, අවදානම් කළමණාකරණය සහ අභ්‍යන්තර පාලනය, නීතිරීති රෙගුලාසි වලට අනුකූල වීම සහ අවශ්‍ය අවස්ථා වල සුදුසු උපදෙස් ලබාදීම වැනි වගකීම් ඉෂ්ඨ කිරිම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සහාය ලබාදීම විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වේ.

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 අනුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සහ නිරීක්ෂකවරු දෙදෙනෙකුගෙන් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ විගණන කමිටුව සමන්විත වන අතර, ඔවුන් විසින් අදාල අධිකාරි ආයතන විසින් අනුමත කරන ලද කාර්යයන් මත කමිටුවේ කටයුතු ක්‍රියාවට නංවනු ලැබේ.

| | | |
|---|---|---|
| ඩබ්.ජ්.එන්. තුෂාරි මිය | - | සභාපති /අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ භාණ්ඩාගාර නියෝජිත |
| වී.අයි. රොෂාන් දයාරත්න මයා | - | සාමාජික/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| පුණ්‍යා ජයතිලක මිය | - | සාමාජික/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| එස්. සංජීව මයා | - | නිරීක්ෂක/ජාතික විගණන කාර්යාලය |
| ඩී.ජ්. හිමාලි සෙනවිරත්න මිය | - | නිරීක්ෂක/රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක |

අවශ්‍ය අවස්ථාවන් වලදී විමර්ශණ කටයුතු සහ පැහැදිලි කරගැනීම් සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ කළමණාකාරිත්වයේ අවශ්‍ය නිලධාරීන් විගණන කමිටුවට කැඳවන ලදී.

වර්ෂය තුල අවස්ථා කිහිපයකදී අධ්‍යක්ෂක මණ්ඩලය සම්පූර්ණව නොපැවතීම/වෙනස්කම් සිදුවීම මත 2022 මූල්‍ය වර්ෂය සඳහා විගණන කමිටු 02 ක් පමණක් පවත්වන ලදී.

**විගණන කමිටුව විසින් 2022 වර්ෂය තුළදී.**

1. 2020 සහ 2021 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීම.
2. 2020 වර්ෂය සඳහා විගණකාධිපති අවසන් වාර්තාව සමාලෝචනයට ලක්කිරීම සහ ගිණුම්කරණ දෝෂ හා නීතිරීති වලට අනුකූල නොවීම් නිවැරදි කිරීම් සම්බන්ධව පසු විපරම් කිරීම.

3. අභ්‍යන්තර විගණන විමසුම් සහ විමර්ශණ වාර්තා පදනම් කරගෙන හඳුනාගත් ගැටලු නිවැරදි කිරීමට ආයතන කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන් ප්‍රතිචාර දැක්වූ ආකාරය සමාලෝචනයට භාජනය කිරීම.

මිලදී ගැනීම්, ගබඩා, වෙළඳ සහ අනෙකුත් අයවීම්, අත්තිකාරම්, දිගුකාලීන ණයහිමියන්, ව්‍යාපෘති අවසන් කිරීම, ව්‍යාපෘති මෙහෙයුම්, බිල් තැබීම්, වාහන පාලනය, මුදල් සහ මානව සම්පත් යනාදී අංශ වල අභ්‍යන්තර පාලන ක්‍රම කිහිපයක් සම්බන්ධව සමාලෝචනයට භාජනය කිරීම සහ සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම.

1. 2020 සහ 2021 වර්ෂ වල නිකුත් කර ඇති විගණකාධිපති අතුරු වාර්තා පිළිබඳව අවධානය යොමුකරන ලද අතර ගිණුම්කරණ අඩුපාඩු සහ නීතිරීති වලට අනුකූල නොවීම් නිවැරදි කිරීම් පිළිබඳව පසුවිපරම් කිරීම් සමාලෝචනයට භාජනය කිරීම.
2. රජය විසින් නිකුත් කරන ලද සියලුම අදාල නීතිරීති, රෙගුලාසි සහ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න පිළිබඳව අවධානය යොමුකිරීම.
3. කමිටුවේ නිර්දේශයන් සම්බන්ධව අදාල කළමනාකරුවන් සහ නිලධාරීන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සමාලෝචනයට භාජනය කිරීම.
4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කිරීම සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කරනු ලැබූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.
5. වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා ගත් ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් වලට අනුකූල ද යන්න සමාලෝචනය කිරීම.
6. අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ ශක්තිමත්භාවය සහ විශේෂයෙන් අවධානම් සහගත ක්ෂේත්‍රයන් සම්බන්ධ හඳුනාගැනීම් කෙරෙහි අවධානය යොමුකිරීම.
7. දැනට අනුමත සේවක සංඛ්‍යාව සම්බන්ධව පවතින ගැටළු සහ එම ගැටළු විසඳීමට ගත් ක්‍රියාමාර්ග සමාලෝචනයට භාජනය කිරීම.

විගණන කමිටුවේ සියලුම කාර්ය පැවරුම් නියමයන් ආවරණය වන පරිදි ඊට අනුකූලව කටයුතු කර ඇති බව කමිටුවේ මතය වේ.



**එච්. ඒ. එන්. තුෂාරී**
සභාපති - විගණන කමිටුව

# මූල්‍ය වාර්තාකරණය පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

පහත දැක්වෙන ප්‍රකාශනය මගින් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකීම් දක්වා ඇත. මෙය විගණන වාර්තාවේ දක්වා ඇති විගණනවරුන්ගේ වගකීම් වලින් වෙනස් වේ.

අධ්‍යක්ෂවරුන් විසින් සෑම වර්ෂයකදීම සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් වර්ෂ අවසානයේදී පැවති තත්ත්වය සහ වර්ෂය තුලදී සංස්ථාවේ ලාභ අලාභ පිළිබඳව සත්‍ය සහ සාධාරණ තත්ත්වයත් පිළිඹිබුවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කලයුතුය. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව තෝරා ගැනීම සහ භාවිතා කිරීම, සාධාරණ සහ විචක්ෂණ තීන්දු ගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම සහ අදාල ගිණුම් ප්‍රමිතීන් භාවිතා කිරීම සිදුකර ඇත.

සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව හෙළිදරව් කිරීමටත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා මහ භාණ්ඩාගාරය විසින් චක්‍රලේඛ මගින් සහ මුදල් පනත මගින් ලබාදී ඇති මාර්ග සූචක අනුගමනය කර ඇති බවටත් තහවුරු කරගැනීමට අවශ්‍යය ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. ඔවුන් විසින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ ක්‍රියාමාර්ග ගැනීමට බැඳී සිටියි. ඒ අනුව වංචා සහ අනෙකුත් අක්‍රමිකතා නැවැත්වීමට සහ හෙළිදරව් කර ගැනීමට අවශ්‍යය සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් ගොඩනැගීමට කටයුතු කල යුතුය.

ව්‍යාපාරය අඛණ්ඩව පවතී යන උපකල්පනය මත පදනම් වී අධ්‍යක්ෂවරුන් විසින් ගිණුම් පිළියෙල කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් විසින් **2022** වර්ෂය සඳහා සංස්ථාවේ අයවැය වාර්තා, මුදල් ප්‍රවාහ, අනාගත ව්‍යාපෘති සහ ණය පහසුකම් පිළිබඳව විමසා බලා ඒවා සමාලෝචනය කිරීමෙන් පසු රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව සතුව මෙහෙයුම් තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ඇති බව තීරණය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව**



ඉංජි. එස්. එම්. කුශාන් දේවින්ද
**සභාපති**

**මගේ අංකය: CAE/C/SDCC/FS/2022/12** **ඔබේ අංකය:** **දිනය: 2023 නොවැම්බර් 20**

**සභාපති**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව**

**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ** 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාචනය**

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ ("සංස්ථාව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව යථාකාලයේදී ඉදිරිපත් කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාවනය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 - මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම

(i) ප්‍රමිතියේ අංක 25 ඡේදය ප්‍රකාරව හා මූල්‍ය වාර්තාකරණ සංකල්පනාත්මක රාමුවේ 4.1 ඡේදය ප්‍රකාරව, අඛණ්ඩ පැවැත්ම සඳහා ආයතනයට ඇති හැකියාව සහ අඛණ්ඩ පැවැත්ම සඳහා ආයතනයට ඇති හැකියාව සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතා පිළිබඳව සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති කිරීමට සම්බන්ධ සිද්ධීන් හෝ තත්වයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් තක්සේරුවක් කළ යුතුය. එසේ වුවද, කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ වැදගත් යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය තුළ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අනාවරණය කර නොතිබුණි.
කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මුළු වත්කම රු.මිලියන 7,592.7 ක් වූ අතර බාහිර බැරකම් රු.මිලියන 6,754.25 ක් හෙවත් මුළු වත්කම්වලින් සියයට 88 ක් විය. තවද, මූල්‍ය අංශය විසින් දැනටමත් ආදායමක් ලෙස හඳුනාගත් නමුත් ඉන්වොයිස් නොකළ පාරිභෝගිකයන්ගෙන් අයවිය යුතු මුදල රු.මිලියන 1,898.86 ක ලැබීම අවිනිශ්චිත වූ නමුත් ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ ඡේද අංක 32ට අනුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මගින් අවශ්‍ය නම් හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ බැරකම්, ආදායම් සහ වියදම් එකිනෙකට හිලව් නොකළ යුතුය. කෙසේ වෙතත්, මිලදී ගැනීමේ අත්තිකාරම්වල හා විවිධ අත්තිකාරම්වල බැර ශේෂයන් රු.මිලියන 4.27 ක් එම ගිණුම්වල හර ශේෂයන්ට එරෙහිව හිලව් කර ඇත. ඒ අනුව, ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) ප්‍රමිතියේ ඡේද අංක 29 අනුව, ආයතනයක අසමාන ස්වභාවයේ සහ ක්‍රියාකාරීත්වයක් සහිත අයිතම ප්‍රමාණවත් නොවන්නේ නම් මිස වෙන්කර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 6.08 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙන් වෙන් වශයෙන් නොපෙන්වා දේපල, පිරියත හා උපකරණ යටතේ ඇතුළත් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉදිකිරීම් කොන්ත්‍රාත් ආදායම ලෙස මූල්‍ය අංශය විසින් හඳුනාගෙන ඇති නමුත් ගනුදෙනුකරුවන්ට ඉන්වොයිස් නොකළ, ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ලෙස රු.මිලියන 3,519.81 ක් ශේෂයක් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවලට අනුව, රු.මිලියන 1,620.95 ක මුදලක් පමණක් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු බවට තහවුරු විය. එහෙයින්, රු.මිලියන 1,898.86 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වෙනසට හේතු නිර්ණය කර නොතිබුණි. එබැවින්, මෙම වෙනස් මුදල් ප්‍රමාණය නැවත අයකර ගැනීමේ හැකියාව ඉතා අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. තවද, කාල විශ්ලේෂණයට අනුව, ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුළු මුදලින් රු.මිලියන 2,560.22 ක ප්‍රමාණයක් වසර 03ට වඩා වැඩි වූ අතර රු.මිලියන 1820.56 ක ප්‍රමාණයක් අවුරුදු 06ට වඩා වැඩි විය. කෙසේ වෙතත්, සංස්ථාව මෙම අවිනිශ්චිතතාවය හඳුනාගෙන නොතිබූ අතර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඇ) 2022 මාර්තු සිට 2024 ජනවාරි දක්වා (මාස 21) කාලය තුළ ණය වාරික සහ පොළී ආපසු ගෙවීම සඳහා කල්දැමීම් වාර දෙකක් ලංකා බැංකුව විසින් අනුමත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ණය පොළී වියදම පෙර වසරේ රු.මිලියන 199 සිට රු.මිලියන 102.82 කින් අඩු වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සංස්ථාව විසින් මෙම කරුණු හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ දී ජර්නල් සටහනක් මගින් නිමි භාණ්ඩ ආරම්භක සහ අවසාන තොගය ලෙස රු.මිලියන 53.8 විකුණුම් පිරිවැයට ගැලපුම් කර තිබුණි. ඒ අනුව, විකුණුම් පිරිවැය යටතේ අවසාන තොගය දෙවරක් සටහන් කර ඇති අතර ඒ හේතුවෙන් වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) එකතුව රු.මිලියන 961.81 ක්වූ එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ආර්ථික සේවා බදු නොගෙවීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පනවන ලද අධිභාරය සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගැනීම හෝ හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ඊ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු වූ VAT මුදල් රු.මිලියන 124.43 ඇතුලත්ව ගෙවිය යුතු වූ VAT රු.මිලියන 1,474.19 ක් විය. කෙසේ නමුත්, එම මුදල මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 1,236.19 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා, ගෙවිය යුතු VAT මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 238 ක් අඩුවෙන් දක්වා තිබුණ අතර එම වෙනසට හෙතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු ලෙස රු .මිලියන 3.81 ක් සංස්ථාව විසින් හඳුනාගෙන තිබුණි. එසේ වුවද, ඉදිරිපත් කර ඇති විස්තර අනුව, මෙම සියළු විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයට අදාළ නොවූ අතර පෙර වර්ෂ වලට අදාල ඒවා විය. එමනිසා, වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) බැදුම්කර ගාස්තුව වූ රු.මිලියන 1.54 ක් වැරදි ලෙස සුභසාධනය හා විනෝදකටයුතු වියදම්වල අන්තර්ගත කර තිබුණි.

(එ) ඉල්ලුම් කරන ලද ආධාරක ලේඛන විගණනය සඳහා ලබා දී නොමැති බැවින්, පහත සඳහන් ශේෂයන්හි නිරවද්‍යතාවය සහ වලංගුභාවය සහතික කිරීමට නොහැකි විය.

| | ගිණුම් අයිතමය | වටිනාකම රු.මිලි. | නොසැපයූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | විවිධ අත්තිකාරම් සහ මිලට ගැනුම් අත්තිකාරම් -ඉදිකිරීම් | 19.47 | කාල විශ්ලේෂණය |
| (ii) | ණයවර ලිපි ආන්තික ගිණුම | 151.08 | විස්තරාත්මක උපලේඛනය සහ ලද භාණ්ඩවල විස්තර |
| (iii) | විවිධ ණයගැතියෝ | 29.91 | විස්තරාත්මක උපලේඛන |
| (iv) | ණයගැතියෝ - Ready Mix | 34.80 | විස්තරාත්මක උපලේඛන |
| (v) | ඉදිකිරීම් - ණයගැතියෝ | 399.37 | ණයගැති සනාථ කිරීම් |
| (vi) | රඳවා ගැනීම් - ඉදිකිරීම් | 573.10 | ණයගැති සනාථ කිරීම් |
| (vii) | මාර්ග සංඥා පද්ධති - ණයගැතියෝ | 28.47 | ණයගැති සනාථ කිරීම් |
| (viii) | කොන්ක්‍රීට් අංගන ණයගැතියෝ | 52.64 | ණයගැති සනාථ කිරීම් |
| (ix) | ඇස්පෝල්ට් - ණයගැතියෝ | 1.62 | ණයගැති සනාථ කිරීම් |

ඉහත විස්තර කළ පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් වැදගත් අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මා හට නොහැකි විය.

මෙම කරුණු හේතුවෙන්, වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ ප්‍රමාණයන් සම්බන්ධයෙන් ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන මූල්‍ය ප්‍රකාශනවල අංග සම්බන්ධයෙන් ද, කිසියම් ගැලපීමක් සිදුකළ යුතුව තිබුණේද යන්න නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 **අංක** 19 **දරන ජාතික විගණන පනතෙහි, පහත සඳහන් අවශ්‍යතා සඳහා විශේෂිත විධිවිධාන ඇතුළත් වේ.**

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව , විගණන කාර්යය සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, සංස්ථාව විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇත්දැයි යන්න නිශ්චය කර ගැනීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වන වගන්තියේ අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වන වගන්තියේ අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වර්ෂයේ මා විසින් කරන ලද සියලු නිර්දේශ ඇතුළත් කර ඇත.

2.2 අනුගමනය **කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය:**

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වන වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව, පහත සඳහන් කරුණු හැර, යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| | නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 756 | 2023 ඔක්තෝබර් 31 දක්වා සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2002 අංක 14 එකතු කළ අගය මත බදු පනත | 2006 වසරේ සිට වැට් බද්ද සහ ඒ මත වන අධිභාර රු.මිලියන 2,403 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 2010 වසරේ සිට ජාතිය ගොඩනැගීමේ බදු සහ ඒ සම්බන්ධ අධිභාර වූ රු.මිලියන 7.15ක් ගෙවා නොතිබුණි. |
| (ඈ) | 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත | රු.මිලියන 101.23 ක ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. |
| (ඉ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත | සේවක අර්ථසාධක අරමුදල සඳහා වන දායක මුදල් සහ ඒ සම්බන්ධ අධිභාර වූ රු.මිලියන 143.26 ක මුදලක් 2020 සිට සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවා නොතිබුණි. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත භාර දිය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනය දින 134 ක් ප්‍රමාදයකින් පසු 2023 ජූලි 13 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ / 2006 ජනවාරි 25 දිනැති NPA චක්‍රලේඛ අංක 08 5.4.4 (iii) ඡේදය | ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ මට්ටමෙන් සියයට 90 දක්වා ළඟා වීමට පෙර ලැබුණු සචලීකරණ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම පියවිය යුතුය. එසේ වුවද, සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘති 12 ක් සම්බන්ධයෙන් වන රු.මිලියන 10.28 ක අත්තිකාරම් මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට පියවීමකින් තොරව ගිණුම් තුළ පැවතුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, සංස්ථාව එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස නියමිත කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකු දෙකකින් ලබාගෙන තිබූ කාලීන ණය ශේෂය රු.මිලියන 1,848.24 ක් වූ අතර කල්තැබූ ණය ශේෂවල වටිනාකම රු.මිලියන 1,727.18 ක් විය. මෙම ණය අතරින් භාණ්ඩාගාර ඇපකර යටතේ රු.මිලියන 990.61 ක් ලබාදී තිබූ අතර රු.මිලියන 518.60 ක් සඳහා සංස්ථාවේ ඉඩම් ඇපකර ලෙස සංස්ථාව විසින් ලබාදී තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරිය සහ සංස්ථාව අතර විධිමත් කොන්ත්‍රාත්තු ගිවිසුමකට එළැඹීමකින් තොරව 2013 වර්ෂයේදී සංස්ථාවේ වාචික උපදෙස් මත රත්නපුර මුවගම පැරණි පාලමේ ප්‍රතිකාර්මික ව්‍යාපෘතිය භාරගෙන තිබුණි. 2019 දී ප්‍රතිකාර්මික ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසු සංස්ථාව විසින් රු.මිලියන 53.63 ක ඉන්වොයිසියක් ප්‍රතිකාර්මික පිරිවැය සහ ප්‍රවාහනය කිරීමේ පිරිවැය අයකර ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණි මේ මුදල මෙතෙක් අයකරගෙන නොතිබුණි

(ඈ) සංස්ථාව විසින් සිදු කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු.මිලියන 792.83 ක බිල්පත් වට්ටම් කර සංස්ථාව මාස 03 ක කාලයක් සඳහා රු.මිලියන 596.12 ක ණය මුදලක් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණි. මෙම බිල්පත් නියමිත මාස 03ක් තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් බැංකුවට නොගෙවීම හේතුවෙන් සංස්ථාව රු.මිලියන 17.52 ක පොලියක් ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අරමුණුවලට පටහැනිව මොනරාගල මැණික් ගැරීමේ ව්‍යාපෘතියක් සඳහා සංස්ථාව විසින් රු.මිලියන 5.84 ක් වැය කර ඇතත් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර දක්වා ඉන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 114.98 ක වියදමින් මෝටර් රථ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ 39 ක් අලුත්වැඩියා කිරීමට ඉතිරිව ඇති බව රත්මලාන ප්‍රධාන කාර්යාලයේ භෞතික පරීක්‍ෂණයේ දී නිරීක්ෂණය විය. අළුත්වැඩියා සඳහා රු.මිලියන 19.23 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, එය 2023 ඔක්තෝබර් 31 දක්වා සංස්ථාව විසින් සිදු කර නොතිබුණි.

(ඊ) කොන්ක්‍රීට් අංගන ඉදිකිරීම්, මාර්ග සංඥා පද්ධති සහ ලැබිය යුතු ප්‍රමාද ගාස්තු, ලැබිය යුතු රඳවා ගැනීම් සහ මිලදී ගැනුම් අත්තිකාරම් එකතුව රු.මිලියන 691.23 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 3කට වැඩිකාලයක සිට පැවතුණි.

(උ) 2022 දෙසැම්බර් 31 දක්වා ලද රු.මිලියන 32.34 ක සචලීකරණ අත්තිකාරම් වර්ෂ 05 ක් පුරා නිරවුල් නොකර පැවතුණි.

(ඌ) ලාභ ගණනය කිරීමේ උපලේඛණය අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 92 කින් ඉදිකිරීම් ව්‍යාපෘති 17 කින් රු.මිලියන 128.91 ක අලාභ හඳුනාගෙන තිබුණි.

(එ) **මානව සම්පත් කළමනාකරණය**

(i) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව 489ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 565ක් විය. ඒ අනුව, විවිධ තනතුරු සඳහා සංස්ථාවට සේවකයින් 76ක් වැඩිපුර බඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ii) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ඉහළ කළමනාකාරිත්වයේ එක් තනතුරක් පුරප්පාඩු වී තිබුණි. මීට අමතරව ප්‍රධාන ඉංජිනේරුවන් (කොන්ක්‍රීට් අංගන) 02 ක් සහ ප්‍රධාන ඉංජිනේරු (සැලසුම්) වශයෙන් පුරප්පාඩු 03 ක් ඇති වී තිබුණි.

(iii) සිවිල් ඉංජිනේරුවන් සඳහා අනුමත සේවක සංඛ්‍යාව 19 ක් වුවද සිවිල් ඉංජිනේරුවන් 51 දෙනෙකු අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(iv) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ආරක්ෂක නිලධාරීන් 20 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඒ) සංස්ථාවේ පූර්ණ අයිතිය ඇති පරිපාලිත ආයතනය වන Devcoshowa (Pvt) Ltd කාලයක් තිස්සේ අක්‍රියව පවතින අතර, සමාගම ඈවර කිරීමට 2006 වර්ෂයේදී මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. ඈවර කිරීමේ ක්‍රියාවලිය 2023 ඔක්තෝබර් 31 වන විටත් අවසන් වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති



# 2022 වසර සඳහා මූල්‍ය ප්‍රකාශනය

**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව**
**විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය**
**දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය**

| *(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)* | සටහන | 2022 | 2021 නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| ආදයම් | 01 | 2,545,681,276 | 4,215,539,157 |
| විකුණුම් පිරිවැය | 02 | (2,182,230,696) | (3,812,409,551) |
| **දළ ලාභය/(අලාභය)** | | **363,450,580** | **403,129,606** |
| වෙනත් ආදයම් | 03 | 176,779,285 | 259,213,755 |
| **මෙහෙයුම් වියදම් වලට පෙර ලාභය/අලාභය** | | **540,229,866** | **662,343,361** |
| පරිපාලන වියදම් | 04 | (309,983,536) | (176,664,778) |
| වෙනත් වියදම් | 05 | (89,193,460) | (138,174,528) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල** | | **141,052,869** | **347,504,054** |
| මූල්‍ය ආදායම | 06 | 8,018,943 | 7,789,263 |
| මූල්‍ය වියදම | 06 | (122,150,767) | (259,168,706) |
| **බදු පෙර ලාභය** | | **26,921,045** | **96,124,611** |
| බදු වියදම | 07 | 79,329,775 | (16,734,552) |
| **වර්ෂය සඳහා ලාභය** | | **106,250,820** | **79,390,059** |
| **වෙනත් විස්තර කරන ලද ආදයම්** | | | |
| අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැලස්මේ සැබෑ ලාභ අලාභ | 17.01 | 25,780,239 | 8,554,326 |
| ප්‍රත්‍යාගණන ලැබීම් (අලාභ) | | 699,838,643 | |
| වෙනත් විස්තර කරන ලද ආදයම් මත බදු | | (217,685,664) | (1,197,606) |
| **බදු අඩු කල පසු වෙනත් විස්තර කරන ලද ආදයම්** | | **507,933,217** | **7,356,720** |
| **විස්තර කරන ලද මුළු ආදායම** | | **614,184,037** | **86,746,779** |

මෙම වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව**
**මූල්‍ය තත්ත්වයේ ස්ථානය පිළිබඳ සැසඳීම**
**දෙසැම්බර් 31 වන දිනට**

| *(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)* | සටහන | **2022** | **2021** නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත හා උපකරණ | 08 | 1,673,671,208 | 1,042,535,835 |
| රජයේ සතු සමාගම් වල ආයෝජන කිරිම | 09 | - | - |
| විලම්බිත වත්කම් බදු | 11 | 103,612,894 | 95,283,568 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,777,284,101** | **1,137,819,402** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 12 | 683,234,037 | 447,173,812 |
| අනෙකුත් ආයෝජන ඇතුළු වෙනත් ව්‍යුත්පන්නයන් | 10 | 98,652,577 | 30,000,000 |
| ආදයම් බදු වත්කම් | 13 | 55,905,373 | 55,905,373 |
| වෙළද සහ වෙනත් ලැබිම් | 14 | 4,692,595,531 | 4,824,148,857 |
| මුදල් හා ඒ සමාන දෑ | 15 | 285,120,536 | 275,113,128 |
| **මුළු ජංගම වත්කම්** | | **5,815,508,055** | **5,632,341,171** |
| **මුළු වත්කම්** | | **7,592,792,156** | **6,770,160,573** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ප්‍රාග්ධන | | 16,671,650 | 16,671,650 |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 51,140,000 | 51,140,000 |
| ප්‍රාග්ධන සංචිත | | 6,629,760 | 6,629,760 |
| රජයේ ප්‍රදානය | | 199,285,140 | 216,660,477 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 1,146,143,425 | 656,256,375 |
| රදවාගත් ලාභය | | (581,331,926) | (623,632,526) |
| **මුළු හිමිකම්** | | **838,538,048** | **323,725,737** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ණය හා ණය ගැනිම | 16 | 1,565,734,288 | 1,653,125,484 |
| විශ්‍රාමික ප්‍රතිලාභ | 17 | 58,983,584 | 59,408,198 |
| විලම්බිත බදු වගකිම් | 11 | 267,001,501 | 120,316,286 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,891,719,374** | **1,832,849,968** |
| **ජංගම වගකිම්** | | | |
| ගෙවිය යුතු වෙළද හා අනෙකුත් ගෙවිම් | 18 | 4,446,168,188 | 4,297,443,559 |
| ණය හා ණය හිමියන් | 16 | 282,515,292 | 171,633,802 |
| බැංකු අයිරා | 19 | 133,851,255 | 144,507,507 |
| **මුළු ජංගම වගකිම්** | | **4,862,534,734** | **4,613,584,868** |
| **මූල්‍ය හිමිකම් හා වගකිම්** | | **7,592,792,156** | **6,770,160,573** |

ප්‍රධාන මූල්‍ය නිළධාරි......................................
**2023-03-02** වන දින

මූල්‍ය ප්‍රකාශන සැකසිම හා ඉදිරිපත් කිරිම අධ්‍යක්ප මණ්ඩලය සතු වගකිමකි. අධ්‍යක්ප මණ්ඩලය වෙනුවට අත්සන් කරන ලදි.

සභාපති.................................... අධ්‍යක්පක .................................. සාමාන්‍යාධිකාරි.....................................
**2023-03-02** වන දින **2023-03-02** වන දින **2023-03-02** වන දින

මෙම වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව**
**හිමිකම් වල වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය**
**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
*:සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්-*

| | ප්‍රාග්ධන | ප්‍රාග්ධන ප්‍රදානයන් | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රජයේ ප්‍රදානයන් | රඳවාගත් ලාභ අලාභ | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| 2021-01-01 දිනට ශේෂය | **16,671,651** | **51,140,000** | **6,629,760** | **656,256,375** | **295,460,507** | **(710,379,305)** | **315,778,988** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | 79,390,059 | 79,390,059 |
| වර්ෂය තුල ආදයම ලෙස පිලිගත් රජයේ ප්‍රදානය | - | - | - | - | (25,800,030) | - | (25,800,030) |
| රජයේ ප්‍රදානය නැවත ප්‍රකාශිත (සටහන 26 ) | - | - | - | - | (53,000,000) | - | (53,000,000) |
| මුළු වෙනත් විස්තරාත්මක ආදායම් | - | - | - | - | - | 7,356,720 | 7,356,720 |
| **2021-12-31 දිනට ශේෂය** | **16,671,651** | **51,140,000** | **6,629,760** | **656,256,375** | **216,660,477** | **(623,632,526)** | **323,725,737** |
| පෙර වර්ෂය තුල ගනුදෙනු වල බලපෑම | | | | | | (81,996,388) | |
| **2022-01-01 දිනට ශේෂය** | **16,671,650** | **51,140,000** | **6,629,760** | **656,256,375** | **216,660,477** | **(705,628,914)** | **241,729,348** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | 106,250,820 | 106,250,820 |
| ප්‍රත්‍යාගණන | - | - | - | 489,887,050 | (735,714) | - | 489,151,336 |
| වර්ෂය තුල ආදයම ලෙස පිලිගත් රජයේ ප්‍රදානය | - | - | - | - | (16,639,623) | - | (16,639,623) |
| මුළු වෙනත් විස්තරාත්මක ආදායම් | - | - | - | - | - | 18,046,167 | 18,046,167 |
| **2022-12-31 දිනට ශේෂය** | **16,671,650** | **51,140,000** | **6,629,760** | **1,146,143,425** | **199,285,140** | **(581,331,926)** | **838,538,048** |

මෙම වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැළකිය යුතුය.

**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
**දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| *(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)* | සටහන | **2022** | **2021** නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | | |
| බදු වලට පෙර ලාභය | | 26,921,045 | 96,124,611 |
| **ගැලපුම් සඳහා** | | | |
| ක්ෂය වට්නාකම | | 110,887,151 | 101,559,870 |
| නිශ්චිත කරන ලද සැලසුම් ප්‍රතිලාභ | | 47,060,571 | 11,774,245 |
| දේපළල පිරියත හා උපකරණ බැහැර කිරීමේ (ලාභය) අලාභය | | (9,063,963) | (9,320,036) |
| විදේශ මුදල් ණය මත (ලාභය) අලාභය | | (68,669,722) | - |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් මත හානිකර පාඩු | | 86,781,117 | 121,904,988 |
| මූල්‍ය වියදම් | | 122,150,767 | 259,168,706 |
| විලම්බිත ආදායම් | | (17,375,337) | (78,800,030) |
| මන්දගාමී හා සංචරණය නොවන තොග සඳහා ප්‍රතිපාදන | | (359,238) | 352,321 |
| රජයේ ප්‍රදාන ලැබීම් | | | (53,000,000) |
| මූල්‍යමය ආදායම් | | (8,018,943) | (7,789,263) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය (අලාභය)** | | **290,313,448** | **441,975,413** |
| බඩු තොග (වැඩිවීම) / අඩුවීම | | (235,700,987) | (157,607,146) |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් (වැඩිවීම) අඩුවීම | | (90,115,140) | (1,110,037,476) |
| මිලදී ගැනීම සහ උප කොන්ත්‍රාත් අත්තිකාරම් (වැඩිවීම) අඩුවීම | | 130,344,241 | (247,725,392) |
| ණය සහ අත්තිකාරම් (වැඩිවීම)/ අඩුවීම | | (365,430,236) | 623,687,884 |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් වැඩිවීම/ (අඩුවීම) | | 541,633,592 | 493,985,039 |
| **මෙහෙයුම් වලින් මුදල් උත්පාදනය (භාවිතය)** | | **271,044,917** | **44,278,323** |
| මූල්‍ය පිරිවැය ගෙවුම් | | (140,935,703) | (247,780,947) |
| පාරිතෝෂිතය ගෙවුම් | | (21,787,932) | (23,144,108) |
| බදු ගෙවුම් | | - | - |
| **මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)** | | **108,321,282** | **(226,646,733)** |
| **ආයෝජන කටයුතු මගින් මුදල් ප්‍රවාහය (භාවිතය)** | | | |
| දේපළල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (46,277,850) | (78,124,838) |
| දේපළල පිරියත හා උපකරණ විකුණුම් ලැබීම් | | 20,384,242 | 10,567,764 |
| ස්ථාවර තැන්පතු ආයෝජන | | (68,652,577) | 27,925,796 |
| ලැබුණු මූල්‍යමය ආදායම | | 3,475,835 | 4,596,929 |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)** | | **(91,070,351)** | **(35,034,349)** |
| **මූල්‍යමය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)** | | | |
| ණය හා ණය ගැනුම් ආපසු ගෙවීම් | | (46,917,100) | (452,324,827) |
| ණය ගැනීමෙන් ලැබෙන මුදල් | | 50,329,828 | 868,005,959 |
| රජයේ ප්‍රදාන ලැබීම් | | - | 53,000,000 |
| **මූල්‍යමය කටුයතු මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (භාවිතය)** | | **3,412,728** | **468,681,133** |
| **මුදල් සහ මුදල් වලට සමාන වූ දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **20,663,659** | **207,000,051** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වූ දෑ | | **130,605,622** | (76,394,429) |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන වූ දෑ** | 15 | **151,269,281** | **130,605,622** |

මෙම වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය කොටසක් ලෙස සැලකිය යුතුය.

**1. සංස්ථාපිත තොරතුරු**

**1.1. පොදු**

රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර පිහිටුවා ඇති ආයතනයකි. මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය නො. 07 බොරුපන පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටුවා ඇත. ආයතනයේ ප්‍රධාන ඉදිකිරීම් කාර්යයන් ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය පැලියගොඩ සහ පේරාදෙණිය වෙත විමධ්‍යගතකර ඇත. රත්මලාන. බෝපිටිය. වේරගංතොට සහ මැදවච්චිය යන ස්ථානවල පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදන අංශය සහ අලෙවි මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇත.

**1.2. සංසන්දනාත්මක තොරතුරු**

පසුගිය වර්ෂයේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ වර්ෂයේද යොදා ගෙන ඇත. මෙම වර්ෂයේදී ගිණුම් ඉදිරිපත් කිරීමේදී පසුගිය වර්ෂයේ ඇතැම් සංඛ්‍යා සහ දත්තයන් සුදුසු පරිදි නැවත සංශෝධනය කර ඇත.

**1.3. ප්‍රධාන ව්‍යාපාර කටයුතු**

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු. ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම ඒ සඳහා කොන්ත්‍රාත්තු භාර ගැනීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා විදුලි සංඥා සවි කිරීම සහ ඒවා අලෙවි කිරීම සහ නඩත්තු කිරීම ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වේ.

**1.4. සේවක ප්‍රමාණය**

වර්ෂය අවසාන වන විට ආයතනයේ සේවකයන්ගේ ප්‍රමාණය **565** ක් විය. .

**1.5. නිකුත් කිරීම සඳහා බලයලත් දිනය**

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා **2023** ජූලි **06** වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබාදෙන ලදී.

**2. වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති පිලිබඳ සංක්ෂිප්ත සටහන**

**2.1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1.1. සැකසීමේ පදනම**

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍යමය තත්ත්වය, ආදායම් ලැබීමේ ක්‍රමවේදය විස්තර සහිතව, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, හිමිකම් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් සම්බන්ධ ප්‍රකාශන වලින් යුක්ත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අර්ථ නිරූපණ වලට අනුකූලව පිලියෙල කරනු ලැබේ.

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුගත වීම තුලින් පසුගිය අවස්ථාවල වාර්තා කරන ලද ආයතනයේ මූල්‍යම තත්ත්වය, මූල්‍යමය ක්‍රියාකාරීත්වයන් සහ මුදල් සංසරණය පිලිබඳ ප්‍රකාශන වලට සිදුවූ බලපෑම පිලිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ සටහන් ලෙස ඉදිරිපත් කර ඇත
මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් අයුරකින් සඳහන් කර ඇති අවස්ථාවකදී හැර සියලුම වර්ෂවල මූල්‍ය වාර්තා සැකසීමේදී මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතා කර ඇත.

.

**2.1.2. විදේශ මුදල් පරිවර්තනය.**

සියලුම විදේශ මුදල් ගණුදෙනු එම ගණුදෙනු සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශීය මූල්‍යමය වටිනාකම් වලින් යුක්ත මූල්‍යමය වත්කම් සහ බැරකම් වර්ෂ අවසානයේදී පැවති විනිමය අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ගණනය කරනු ලැබේ. මූල්‍යමය නොවන වත්කම් සහ බැරකම් වටිනාකම ගණනය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුව පරිවර්තනය කරනු ලැබේ. තිරවුල් නොකරන ලද මූල්‍යම වත්කම් සහ බැරකම් නැවත පරිවර්තනය කිරිමේදි විදේශ විනිමය ලාභ පාඩු ක්ෂණිකව හදුනාගනු ලබන අතර. එසේ නොකරන්නේ විදේශ මෙහෙයුම් හි ශුද්ධ ආයෝජනවල ඉදිරි රැකුමන් ලෙස සුදුසුකම් ලබන විදේශ මුදලින් ණය ගැනිමකදීය. එවැනි අවස්ථාවකදි විනිමය වෙනස්වීම් අනෙකුත් විස්තර කරන ලද අදායමක් ලෙස හදුනාගන්නා අතර. විදේශ විනිමය සංචිත වලට විදේශීය මෙහෙයුම් නැවත පරිවර්තනය කිරිමෙන් පැන නැගෙන විදේශ විනිමය වෙනස්කම් එකතු කරනු ලබයි.

**2.1.3** අනුබද්ධ සබඳතා

සංස්ථාවට Fujima State Corporation (Pvt.) Ltd සමග අනුබද්ධ සබඳතාවක් ඇත ඒකාබද්ධ ගිණුම් සකස් කීමේ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් ඒකාබද්ධ ගිණුම් සකස් කර නොමැති අතර අනුබද්ධ සමාගමෙහි ආයෝජනය පිරිවැයෙන් සටහන් වේ

**2.1.4. බදු තක්සේරු කිරීම**

**(අ) පවත්නා බදු**

මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ආදායම් හා වියදම් මත පාදක වී ආදායම් බදු ගණනය කිරීම පනත් අංක. 10 දරණ දේශිය ආදායම් බදු පනත 2006 සහ එයට සිදුකර ඇති සංශෝධනයන්ට අනුකූලව සිදු කරයි..

**(ආ) විලම්බිත බදු**

විලම්බිත බදු වෙනස් කිරිම වගකිම් ක්‍රමය භාවිතා කරමින් සිදු කරයි. මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තාකරන වත්කම් සහ වගකිම් සහ බදු අරමුණු සඳහා යොදා ගනු ලබන වත්කම් හා වගකිම් අතර ඇති කෙටි කාලින වෙනස්කම් සඳහා ප්‍රතිපාදන සිදු කරයි. වාර්තා කරන දිනට පවතින නීති මත පදනම් වි වගකිම් නිදහස් කරන විට තාවකාලික වෙනස්වීම් සඳහා යෙදා ගනු ලබන බදු අනුපාතය, විලම්බිත බදු ගණනය කිරිම සඳහා භාවිතා කරයි.

තාවකාලික වෙනස්කම් පියවා ගැනිමට ප්‍රමාණවත් තරම් අනාගත බදු අය කළ හැකි ලාභ ඉපයිමට සම්භාවිතාවන් ඇති විටදි ඊට සරිලන ප්‍රමාණයන් දන්වා විලම්බිත බදු වත්කම් හදුනාගනු ලැබේ.

සංස්ථාවේ ඉදිකිරීම් කටයුතු හා අනෙකුත් කටයුතු සඳහා වෙනස් බදු අනුපාත අදාල වන බැවින් විලම්බිත බදු ගණනය කිරිමේදි වෙන වෙනම ගණනය සිදුකරනු ලබයි.

සංස්ථාවේ ඉදිකිරීම් කටයුතු හා අනෙකුත් කටයුතු සඳහා වෙනස් බදු අනුපාත අදාල වන බැවින් විලම්බිත බදු ගණනය කිරිමේදි වෙන වෙනම ගණනය සිදුකරනු ලබයි. පවත්නා බදු වත්කම් සහ පවත්නා බදු වගකිම් හිලව් කිරිමට නෛතික බලාත්මක කළහැකි හිමිකමක් ඇති විටදි සහ විලම්බිත බදු එකම බදු අයකල හැකි ආයතනයකට සහ එකම බදු අධිකාරියකට සම්බන්ධ අවස්ථාවලදි විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකිම් හිලව් කලහැක.

**2.1.5. ණය පිරිවැය**

අපේක්ෂිත කාර්යය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාල සීමාවන් ගනු ලබන වත්කම් අත්පත් කරගැනීමේදී, ඉදිකිරීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී සෘජුව අදාල වන ණය පිරිවැය එම වත්කමේ වියදමේ කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ. අනෙකුත් සියලු ණය පිරිවැය අදාළ කාලය තුළ සිදුවූ වියදම් ලෙස ගණින් ගැනෙනු ඇත. ණය ලබා ගැනීමේදී ගෙවීමට සිදු වන පොලී සහ අනෙකුත් ගෙවීම් ණය පිරිවැය ලෙස සලකනු ලැබේ.

**2.2. වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ ඒවා තක්සේරු කිරීමේ පදනම**

**2.2.1. දේපළ පිරියත හා උපකරණ**

**පිරිවැය සහ වටිනාකම**

සියලු දේපළ, පිරියත සහ උපකරණ මූලික වශයෙන් පිරිවැයට ගිණුම්ගත කරනු ලැබේ. යම් දේපලක්, පිරියතයක් හෝ උපකාරයක් අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට හා එහි අපේක්ෂිත භාවිතය අත්පත් කරගැනීමට අවශ්‍ය ක්‍රියාකල හැකි තත්ත්වය ලබාගැනීම සඳහා දැරිය යුතු වියදම අදාළ වත්කමේ පිරිවැය වේ. මූලික වටිනාකම් තක්සේරු කිරීමෙන් පසුව සිදුකරන නැවත තක්සේරු කිරීම් වලදී වැයවීම් අනුපාතය අනුව අගය අඩුකිරීම් සිදු කිරීම මගින් නැවත සැකසීම සිදු කෙරේ. දේපළ, පිරියත හෝ උපකරණ වලට අයත් ප්‍රධාන අයිතමයක් සඳහා වෙනස් භාවිතා කල හැකි කාලයක් ඇති අවස්ථා වලදී ඒවා වෙනස් අයිතමයන් ලෙස ගිණුම් ගත කිරීම සිදුකරනු ලැබේ.

**පසු වියදම්**

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත්වැඩියා කිරීම් ඇතුළු වෙනම ගිණුම්ගත කර තිබූ දේපළ පිරියත සහ උපකරණ වල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දැරූ වියදම ප්‍රාග්ධනීගත කරනු ලැබේ. යම් පසු වියදම ඒ දේපළ පිරියත සහ උපකරණ වල අන්තර්ගත අනාගත ආර්ථික වාසි වර්ධනය කරන්නේ නම් පමණක් එම පසු වියදම් ප්‍රාග්ධනිගත කරනු ලැබේ. දේපළ පිරියත සහ උපකරණ මගින් ආරම්භයේදී ගණනය කරන ලද කාර්යය සාධන මට්ටම තුළින් ළගාකර ගැනීමට අපේක්ෂා කරන ලද අනාගත ආර්ථික වාසි ප්‍රතිෂ්ඨාපනය කිරීමට හෝ පවත්වාගෙන යාම සඳහා දරණ ලද අනෙකුත් සියළු වියදම් එම වියදම් දරන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

**ප්‍රත්‍යාගණනය**

දේපළ පිරියත සහ උපකරණ පසුකාලීනව ප්‍රත්‍යාගණනය කිරීමේදී, ප්‍රත්‍යාගණනය කරනු ලබන වත්කමේ පන්තියට ඇතුලත් සියළුම වත්කම් සාධාරණ අගයන්ට ප්‍රත්‍යාගණනය කළයුතුය. ප්‍රමාණවත් කාල සීමාවන් අතරතුරදී ප්‍රත්‍යාගණනයන් සිදුකරනු ලබයි. යම්කිසි වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණන අතිරික්තයන් ඇත්නම් එය අනෙකුත් විස්තරාත්මක ආදායමක් ලෙස හඳුනාගනු ලබන අතර, හිමිකම්හි ඇති වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලබයි. කෙසේ නමුත් එම වත්කම මීට පෙර ප්‍රත්‍යාගණනය හේතුවෙන් අගය අඩු වී ඇති විට සහ එය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති අවස්ථාවලදී නැවත ප්‍රත්‍යාගණනය මගින් පෙර කී අගය අඩුවීම පියවා ගතහැකි අවස්ථාවලදී ප්‍රත්‍යාගණනය අතිරික්තය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලබයි.

යම්කිසි වත්කමක් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන අලාභයන් ඇති වූ විට එම වත්කම් සම්බන්ධව පෙර වර්ෂ වල ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇත්නම් එම අලාභය සෘජුවම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති වටිනාකම දක්වා පියවා ඉතිරියක් ඇතිනම් වියදමක් ලෙස සලකනු ලබයි. ප්‍රත්‍යාගණන දිනට ඇති සමුච්චිත ක්ෂය වටිනාකම වත්කමේ දළ වටිනාකමින් ඉවත් කර ශුද්ධ වටිනාකම ප්‍රත්‍යාගණන වටිනාකමට සටහන් කරනු ලැබේ. වත්කම ඉවත් කිරීමේදී විකිණූ වත්කමට සම්බන්ධ ප්‍රත්‍යාගණන සංචිත රඳවාගත් ඉපයීම් වලට මාරු කරනු ලබයි.

**අපවය**

දේපළ පිරියත සහ උපකරණ වල වටිනාකම වාර්ෂිකව අපවය සඳහා සමාලෝචනය කිරීම හෝ වටිනාකම අයකරගත නොහැකි බවට සිද්ධි හෝ පවතින තත්ත්වයේ වෙනස්වීම් මගින් ඇඟවෙන විට සිදුකරනු ලබයි. එවැනි ඇඟවීම් ඇතිවිට එනම් වටිනාකම් ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකම ඉක්මවා යනවිට වත්කම් අයකරගත හැකි වටිනාකමට ලියාහරිනු ලබයි. මීට ඉහතදී කිසියම් වත්කමක් සඳහා ප්‍රත්‍යාගණනය අතිරික්තයක් නැති විටදී එම වත්කම සම්බන්ධයෙන් අපවය පාඩු ඇතිවිට එම පාඩු විස්තරාත්මක අදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

**ක්ෂයවීම්.**

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපළ පිරියත සහ උපකරණ ඒවායෙහි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනයට ගතහැකි ආයු කාලය පුරා වියදම මත හෝ ගණනය කල වටිනාකම මත සරල රේඛීය ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. වත්කමේහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගතහැකි ආයු කාලයන් පහත පරිදි වේ.

| **වත්කම් වර්ගය** | **කාලය (වර්ෂ)** |
|---|---|
| ඉඩම් | දීර්ඝ කාලීන |
| ගොඩනැගිලි | අවුරුදු 20 |
| කාර්යාල උපකරණ | අවුරුදු 10 |
| පිරියත සහ යන්ත්‍ර | අවුරුදු 10 |
| මෝටර් රථ වාහන | අවුරුදු 05 |
| පරිගණක සහ උපාංග | අවුරුදු 10 |
| වෙනත් වත්කම් | අවුරුදු 10 |

ක්ෂය අනුපාතයේ ප්‍රයෝජනයට ගතහැකි ආයු කාලය හෝ සුන්බුන් වටිනාකමේ සැලකිය යුතු වෙනසක් සිදුවී ඇතිබව පෙන්නුම් කරන්නේ නම් වත්කම් වල මූළ ජීවිත කාලයේ වටිනාකම සහ වත්කම්වල අවප්‍රමාණය වීම නව සංශෝධන සඳහා යොදාගනු ලැබේ.

**හඳුනාගැනීම නතර කිරීම.**

දේපළ, පිරියත සහ උපකරණ වලට අයත් යම් වත්කමක් ඉවත් කිරීමේදි හෝ එම වත්කම් පාවිච්චි කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික වාසියක් නොලැබෙන විටදි එම වත්කම හඳුනාගැනීම නතර කරනු ලබයි. යම්කිසි වත්කමක් හඳුනාගැනීම නතර කල විටදි පැන නැගෙන ලාභයන් හෝ අලාභයන් වෙතොත් එය සිදු වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

**2.2.2. කල්බදු**

**(අ) මූල්‍ය කල්බදු**

හිමිකාරීත්වයට සම්බන්ධ සියලු අවදානම් හා ප්‍රතිලාභ සංස්ථාව වෙත පවරා ඇති මූල්‍ය කල්බදු යටතේ ලබාගෙන ඇති දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ මුදල් වටිනාකමට ප්‍රාග්ධනීගත කරන අතර මූල්‍ය කල්බදු වශයෙන් හෙළිදරව් කරයි. තවද සංස්ථාවට මෙම කල්බදු වත්කම් භාවිතා කිරීමට අදහස් කෙරෙන කාල පරිච්ජේදය පුරා එම වත්කම් ක්ෂය කරනු ලැබේ. ඊට අනුරූපීව කල්බදු ණයහිමියාට ගෙවිය යුතු ප්‍රධාන වටිනාකම වගකීමක් ලෙස පෙන්නුම් කරයි. ගෙවිය යුතු වගකීම් ශේෂය වන නියත පොලී අනුපාතයක් ලබාගත හැකි ලෙස කල්බදු ගෙවීම්, මූල්‍ය පිරිවැය සහ කල්බදු වගකීම අඩුවීම ලෙස බෙදා වෙන්කරනු ලබයි. කල්බදු කාල සීමාව තුල ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත පොලී ගිණුමට මාරු කරනු ලබයි. එක් එක් වර්ෂයට අදාල ණය වාරික වගකීමේ අඩංගු පොලිය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙහි කල්බදු කාල සීමාව පුරා ගළපනු ලබයි.
වර්ෂය සඳහා අදාල පොලිය ගණනය කිරීම අභ්‍යන්තර ලැබීම් අනුපාතයට (IRR) අනුව සිදු කරනු ලබන අතර එය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

තිරණායකයන් සපුරා ඇත්නම් කල්බදු දේපල වැඩි දියුණු කිරිම සඳහා දැරූ වියදම් ප්‍රාග්ධන ගත කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ යටතේ කල්බදු වැඩි දියුණු කිරීම් ලෙස හෙලිදරව්කර වැඩි දියුණු කිරීම් වල ඇස්තමේන්තුගත භාවිතයට ගතහැකි ආයු කාලය පුරා ක්ෂය කරනු ලබයි.

**(ආ) මෙහෙයුම් කල්බදු**

කල්බදු ලෙස ඇති වත්කමේ අවදානම සහ ප්‍රතිලාභ කල්බදු සපයන්නා වෙත ඇති විට එය මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු සඳහා ගෙවනු ලබන මූලික වාරික කෙලින්ම වියදම් වශයෙන් ගණන් ගැනෙන අතර එය විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ සරල රේඛිය ක්‍රමයට සටහන් තබනු ලැබේ.

**2.2.3 මූල්‍ය උපකරණ (මූල්‍ය ආයතන)**

**1) මූල්‍යමය වත්කම්**

**මූලික හඳුනා ගැනීම සහ ඇගයීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 39) යටතේ  මූල්‍ය වත්කම් සුදුසු පරිදි ලාභ අලාභ, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම් දක්වා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් මගින් සාධාරණ අගයකට මූල්‍ය වත්කම් සේ පෙන්නුම් කරයි. වර්ගීකරණය ආරම්භක හඳුනාගැනිමේ අවස්ථාවේදි තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමින් පිළිගනු ලැබේ, ලාභ අලාභ හරහා ආයෝජන සාධාරණ වටිනාකමින් නොමැති විට ගනුදෙනු පිරිවැය වශයෙන් සළකනු ලබයි

මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටි කාලීන තැන්පතු, ලැබිය යුතු වෙළඳ භාණ්ඩ සහ අනෙකුත් මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

**පසුකාලීන මිනුම්**

මූල්‍ය වත්කම් වල පසුකාලීන මිනුම් පහත දැක්වෙන ලෙස ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

**(අ) ලාභ අලාභ මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්.**

ලාභ අලාභ මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුළට වෙළඳ කටයුතු සඳහා භාවිතයට ගන්නා මූල්‍යමය වත්කම් සහ ලාභ පාඩු මත පවතින සාධාරණ වටිනාකමක් සහිත මූල්‍යමය වත්කම් ඇතුළත් වේ. මෙහිදී මෙම මූල්‍ය වත්කම් විකිණීම හෝ නැවත මිලදී ගැනීම් සඳහා ලබාගෙන ඇත්නම් එම මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා තබාගන්නා බවට වර්ගීකරණය කරයි.

ලාභ අලාභ මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් සාධාරණ අගයකට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් කරයි. සාධාරණ අගයේ සිදුවන වෙනස්වීම් විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි. ලාභ අලාභ මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් මත සිදුවන ශුද්ධ ලාභ සහ ශුද්ධ අලාභ සඳහා විනිමය වෙනස්වීම්, පොළී සහ ලාභ ආදයම අයත් වේ.

**(ආ) ණය හා ලැබීම්**

ණය හා ලැබීම් යනු සක්‍රිය වෙළඳපොලේ ගෙනහැර දක්වා නොමැති නිශ්චිත ගෙවීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වත්කම් වේ. මෙවැනි මූල්‍යමය වත්කම්  මූලික ගණනය කිරීමෙන් පසුව ඵලදායි පොළී අනුපාත ක්‍රමය (EIR) යොදා ගනිමින් පිරිවැය මත හිලව් කිරීම මගින් අපවය වීම අවම කර ගැනීම සිදු කෙරේ.

ගාස්තු හෝ වියදම් මත ලබා දෙන්නා වූ වාරික හෝ වට්ටම්, පිරිවැය මත ණය හිලව් කිරිමේදී සැලකිල්ලට ගන්නා ප්‍රධාන කරුණක් වන අතර එය විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ලැබීම් යටතේ සඳහන් කරනු ලැබේ. අපවය නිසා සිදුවන කෙටිකාලීන අලාභ විස්තරාත්මක ආදයම් ප්‍රකාශනයේ සඳහන් කරයි. ලැබීම් වියදමට ගණනය කරනු ලැබේ.

**සේවක මණ්ඩල ණය**

සේවක මණ්ඩලය සඳහා ලබාදෙන ණය මූල්‍යමය වත්කමක් ලෙස සලකා ආයතනයේ මූල්‍ය තත්ත්ව වාර්තාවට ඇතුලත් කරනු ලැබේ. මෙහිදී එම ණය මුදල, එය අනුමත වන දිනට පවතින පොළී අනුපාතයට අනුව සාධාරණ වටිනාකම ගණනය කිරීම සිදු කරනු ලැබේ. ණය මුදල සහ සාධාරණ වටිනාකම අතර වෙනස ණය කාල සීමාව තුල අන්තර්ග්‍රහණය කිරීම සිදුකරනු ලැබේ. පොළිය ගණනය කිරීම පවතින වෙළඳපොළ පොළී අනුපාතය මත සිදුකරනු ලැබේ.

**ලැබිය යුතු වෙළඳ ණය**

ඉදිකිරීම් ණයකරුවන්, රඳවා ගැනීම්, ලැබිය යුතු ඇවර භාති සහ ක්‍රොන්ක්‍රීට් අංගන ණයකරුවන් ආදිය ආයතනයේ වෙළඳ ලැබීම් ලෙස සලකනු ලබන අතර ඒවා LKAS 39 යටතේ ණය සහ ලැබිය යුතු දේ ලෙස සලකනු ලබන අතර ගණුදෙනුව සිදු කිරීමේදී ගෙවූ හෝ ලැබුණු මිලට අනුව සටහන් තැබීම සිදු කරයි.
ණයකරුවන් මත සිදු කෙරෙන අපවය ප්‍රතිපාදනය පෙර ලැබීම් සිදු වූ ආකාරය සහ පැහැර හැරීමේ සම්භාවිතාවය මත ගණනය කිරීම සිදුකරන අතර අපවය පාඩු හෝ ආපසු හැරවීම් විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

**කල් පිරෙන ආයෝජන පවත්වා ගැනීම**

ආයතනයට කල්පිරෙන තෙක් ආයෝජන පවත්වා ගෙන යාම සඳහා ධණාත්මක අරමුණක් සහ හැකියාවක් ඇති විට ස්ථාවර ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හෝ ස්ථාවර නිශ්චිත ගෙවීම් සහිත සහ ස්ථාවර පරිණතයන් සහිත ආයෝජනයක් පවත්වා ගෙන යාම කල් පිරෙනතෙක් ආයෝජන පවත්වා ගැනීම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කල් පිරෙනතෙක් පවත්වාගෙන යන ආයෝජනයන් සඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් අන්තර්ග්‍රහණ පිරිවැය ගණනය කරනු ලැබේ. අපවය අඩුකරනු ලැබේ. කල් පිරෙනතෙක් පවත්වාගෙන යන ආයෝජන හඳුනාගැනීම නතර කරන විටදී හෝ අපවයට ලක් කිරීමේදී ඇති වන ලාභ අලාභ විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

**(ඇ) විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන**

කොටස් හා ණය සුරැකුම්පත් විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස සලකනු ලැබේ. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ කොටස් ආයෝජන ලෙස වෙළඳාම සඳහා හෝ ලාභ අලාභ තුලින් සාධාරණ වටිනාකමකින් යුක්ත කොටස් ආයෝජන හැර අනෙකුත් කොටස් ආයෝජනය වේ. මෙම ගණයට ඇතුලත් වන ණය සුරැකුම්පත් අවිනිශ්චිත කාල සීමාවක් සඳහා තබා ගන්නා අතර අවශ්‍ය විටකදී විකිණීම මගින් මුදල් බවට පත්කිරීම වෙළඳපොලේ වෙනස්වන තත්ත්වයන්ට ප්‍රතිචාර ලෙස සිදුකරයි.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට ගණනය කරනු ලැබේ. සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම් වල සිදුවන වෙනස්කම් වලදී ඇතිවන ලාභ හෝ පාඩු වෙනත් විස්තරාත්මක ලැබීම් ලෙස ගණන් ගන්නා අතර එය හිමිකම්හි ඇති විකිණීම සඳහා පවතින සංචිතයට එකතු කරනු ලැබේ. අපවය පාඩු මූල්‍යමය මෙවලම් මගින් ලැබෙන විනිමය ලාභ සහ පාඩු, කොටස් ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සඳහන් කරනු ලැබේ. මූල්‍යමය වත්කම් ඇවර කිරීමේදී අනෙකුත් විස්තරාත්මක ආදායම් පෙර එකතුව ඇති ලාභ හෝ පාඩු හිමිකම් ප්‍රකාශනයේ සිට විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

**හඳුනාගැනීම නතර කිරීම.**

වත්කමේ මුදල් ප්‍රවාහය සම්බන්ධ ගිවිසුම්ගත හිමිකම් කල් ඉකුත් වූ විට හෝ පසුකාලීනව මූල්‍ය වත්කමේ වගකීම සහ හිමිකාරත්වය අනෙක් පාර්ශවයට පැවරීම සිදුකල විට ආයතනය විසින් එම මූල්‍ය වත්කම්

ඉවත් කිරීම සිදුකරනු ලබන අතර මාරු කරන ලද මූල්‍ය වත්කම සම්බන්ධයෙන් සංස්ථාව ගොඩනගා හෝ රඳවාගත් පොලියක් ඇති විට එය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගනු ලබයි.

**මූල්‍ය වත්කම් අපවයට (අඩු කිරීමට) ලක් කිරීම.**

සෑම වාර්තා කරන දිනයකදීම ආයතනය විසින් එහි මූල්‍ය වත්කම් වටිනාකමේ යම් අපවයන් සිදුවී තිබේද යන්න පිළිබඳව තක්සේරු කිරීමක් සිදුකරනු ලැබේ. යම් මූල්‍ය වත්කමක මූලික වටිනාකම ගණනය කිරීමෙන් පසුව සිදුවූ යම් බලපෑමක් හෝ බලපෑම් හේතුවෙන් එහි මූලික වටිනාකම් අගය යම් අපවයකට භාජනය වී ඇති බවට හඳුනාගත හැකි පැහැදිලි සාක්ෂි පවතින්නේ නම් සහ ඒවා අනාගත මුදල් ප්‍රවාහයට යම් බලපෑමක් ඇතිකරන්නේ නම් එම මූල්‍ය වත්කම අපවය වූ බවට නිගමනය කරයි. අපවයට ලක් වූ පාඩුව විස්තරාත්මක ආදායම් වාර්තාවට ඇතුලත් කරනු ලැබේ.

**2). මූල්‍ය වගකීම්**

**මූලික හඳුනාගැනීම සහ අගය නිර්ණය කිරීම.**

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත (LKAS39) අනුව සංස්ථාව මූල්‍ය මෙවලමක් සම්බන්ධව ගිවිසුම්ගත ප්‍රතිපාදනයන්හි පාර්ශවකරුවෙකු වූ විටදි පමණක් මූල්‍ය වගකීම් හඳුනාගනු ලැබේ.
සියලු මූල්‍ය වගකීම් ආරම්භයේදි සාධාරණ අගයකට හඳුනාගනු ලබන අතර ණය ගැනිම් සහ අනෙකුත් මූල්‍ය වගකීම් අන්තර්ග්‍රහණය කල පිරිවැයට ගිණුම්ගත කරයි. මෙහි සෘජුව ආරෝපණය කල හැකි ගණුදෙනු පිරිවැයද ඇතුලත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් ලෙස වෙළඳ සහ අනෙකුත් ගෙවීම්, ණය දීම්, ණය ගැනිම් හා බැංකු අයිරාවන් ආදිය සලකනු ලැබේ.

**පසු ගණනය කිරීම්**

මූල්‍ය වත්කම් සම්බන්ධව සිදුකරන ගණනය කිරීම් පහත පරිදි වර්ගීකරණයට ලක්කරනු ලැබේ.

**ලාභ සහ පාඩු මගින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍යමය වගකීම්**

වෙළදාම සඳහා පවතින මූල්‍යම වගකීම් සහ මූලිකව හඳුනාගන්නා ලද ලාභ පාඩු මගින් සාධාරණ වටිනාකමක් සඳහා ඇති මූල්‍යමය වගකීම් ලෙස තීරණය කර ඇති මූල්‍ය වගකීම් මෙම වර්ගීකරණයට අයත් වේ.

කෙටිකාලීන විකිණීම් සඳහා තබාගෙන ඇති මූල්‍ය වගකීම්, වෙළදාම සඳහා පවතින මූල්‍යම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මෙහිදී ඇතිවන ලාභ සහ අලාභ විස්තරාත්මක ආදයම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

**ණය සහ ණය ගැනීම් සහ අනෙකුත් මූල්‍ය වගකීම්**

මූලික හඳුනා ගැනීමෙන් පසුව ණය ලබා ගැනීම් සඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් අන්තර්ග්‍රහණ පිරිවැයට ගණනය කරනු ලබයි. වගකීම් ඇවර කිරීමේදී ගණනය කරන ලද ලාභ සහ අලාභ විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. එමෙන්ම සඵලදායී පොළී අනුපාත ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලබයි. වට්ටම් හෝ වාරික සහ සඵලදායි පොලී අනුපාත ක්‍රමයේ කොටසක් වන පිරිවැයද ඇතුලත්වය. විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ අඩංගු පොලී වියදම තුල සඵලදායී පොළී අනුපාත අන්තර්ග්‍රහණය ඇතුලත් වේ.

සංස්ථාවේ කෙටිකාලීන වගකීම් ලෙස ගැනෙන වෙළඳ සහ අනෙකුත් ගෙවීම්, අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැය යටතේ ගණනය කරනු ලැබේ.

**හඳුනාගැනීම අවසන් කිරීම**

මූල්‍යමය වගකීම් සඳහා ආයතනයට ඇති බැඳීම් වලින් නිදහස් වූ හෝ අවලංගු වූ හෝ අවසන් වූ පසු එම මූල්‍ය වගකීම සඳහා ආයතනය සතු වූ වගකීම් අවසන් වේ. තවද දැනට පවතින මූල්‍ය වගකීම් පසුව එම ණය හිමියා විසින් පවතින කොන්දේසිවලට වෙනස් වෙනත් කොන්දේසි යටතේ අලුත් කරන විටදී පෙර පැවති වගකීම් අවසන් වී ආයතනය සතු නව වගකීමක් ලෙස සැලකෙන අතර අදාළ වටිනාකම් වල වෙනස්වීම් විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

**3). මූල්‍ය මෙවලම් සඳහා සාධාරණ වටිනාකම්**

සක්‍රිය වෙළඳපොලේ හුවමාරු වන මූල්‍ය මෙවලම් සඳහා සෑම වාර්තා කරන දිනයකටම සාධාරණ මිල තීරණය කිරීම වෙළඳපොලේ පවතින මිලට හෝ අලෙවි නියෝජිත මිල ගණන් කැඳවීම මගින් සිදුකරන අතර සක්‍රිය වෙළඳපොලේ අලෙවි නොවන මූල්‍යමය මෙවලම් සඳහා සාධාරණ මිල නියම කිරීම ඒ සඳහා සුදුසු තක්සේරු කිරීමේ ක්‍රමවේද යොදාගැනීම මගින් සිදුකරනු ලැබේ. මෙහිදී ආසන්න කාලසීමා වලදී සිදු කරන ලද වෙළඳපොළ ගණුදෙනු, සමාන මූල්‍යමය මෙවලම් සමග සංසන්දනය කිරීම, වට්ටම් මුදල් ප්‍රවාහක විග්‍රහ හෝ වෙනත් තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් යොදාගැනීම මගින් සිදුකරනු ලැබේ.

**2.2.4. වත්කම් අපවයට ලක් කිරීම.**

සෑම වාර්තා කරන දිනයකදීම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් වත්කම් සහ ආයෝජනයන් ඒවායේ වටිනාකම් වල යම් අපවය වීමක් සිදු වී ඇත්ද යන වග විමසා බලන අතර එවැනි අඩුවීමක් ඇතිනම් එම වත්කමෙන් අයකර ගැනීමට හැකි වටිනාකම එම වත්කමේ ගිණුම්ගත වටිනාකම සමග සංසන්ධනය කර බලනු ඇත. ගණන් බලන ලද අයකර ගත හැකි අගය කුඩා අගයක්නම් එම වටිනාකමට වත්කම අඩු කර, එම අඩු ප්‍රමාණය වහාම විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ. මේ ආකාරයට සෑම වාර්තා කරන දිනයකදීම තොගයන්හි වටිනාකම් අපවය වීම් සෑම තොග අයිතමයකම ගිණුම්ගත වටිනාකම සහ විකිණීමට දරණ පිරිවැය අඩුකල පසු ලැබෙන විකුණුම් මිල සසදා බලා කරනු ලබයි. යම්කිසි තොග අයිතමයක් අපවය සිදු වී ඇත්නම් එහි ගිණුම්ගත වටිනාකම, විකුණුමට දැරීමට අවශ්‍යය පිරිවැය අඩුකල පසු ලැබෙන විකුණුම් මිලට නැවත සඳහන් කරණු ලබයි. අපවය නිසා සිදු වූ අලාභ වහාම විස්තරාත්මක ගිණුම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි.

අපවය අලාභයන් පසු කාලීනව ප්‍රතිවර්ථනය වි ඇත්නම් වත්කමේ ගිණුම්ගත වටිනාකම අයකර ගත හැකි වටිනාකමට සංශෝධනය කරනු ලබයි. එසේ එය පෙර වර්ෂයන්හි සිදුකල අපවය අලාභ ප්‍රමාණය ඉක්මවා නොයා යුතුය. අපවය අලාභ ප්‍රතිවර්ථනය වහාම විස්තරාත්මක ආදයම් ප්‍රකාශනයන්හි හඳුනාගනු ලබයි.

**2.2.5. ආයෝජන**

**(අ) ජංගම ආයෝජන**

ජංගම ආයෝජන පිරිවැයට ගිණුම්ගත කරන අතර, අත්පත් කරගැනීමේදී දැරිය යුතු පිරිවැය, තැරව් කුලී, තීරුබදු සහ බැංකු ගාස්තු මෙයට ඇතුලත් වේ. ජංගම ආයෝජනයන් සඳහා වන ලබා නොගත් ලාභ සහ පාඩු වෙළඳපොළ වටිනාකමට ඉදිරියට ගෙනයනු ලබයි. එනම් වෙළඳපොළ වටිනාකම අඩුවීම සහ ජංගම ආයෝජන පිරිවැයට හෝ වෙළඳපොළ වටිනාකම සහ අගයන් දෙකක් අඩු අගයට පෙන්වීම සඳහා අවශ්‍යය අඩුවීම් ප්‍රතිවර්ථනයවීම් විස්තරාත්මක ආදායම් වාර්තාවට බැර කිරීම හෝ අඩු කිරීම කරනු ලබයි.

**(ආ) ආශ්‍රිත සමාගම් ආයෝජන**

ආශ්‍රිත සමාගම් වල සිදුකරන ආයෝජන හිමිකම් ක්‍රමයට සිදුකරන අතර මෙහිදී ආශ්‍රිත සමාගමේ ලාභයෙන් සමාගමට අයිති කොටස ආදායමක් ලෙස ගිණුම් ගත කරයි. ආයෝජනය එම මුදලට සමාන අගයකින් සංශෝධනය කරයි.

**2.2.6. භාණ්ඩ තොග**

සංස්ථාව විසින් භාණ්ඩ තොගවල අයිතිය සම්බන්ධව සැලකිය යුතු අවදානමක් සහ ප්‍රතිලාභය දැරිය යුතු විට එම තොග ගිණුම්ගත කරයි. පිරිවැය සහ ශුද්ධ විකුණුම් අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කල යුතුය. ශුද්ධ විකිණුම් අගය යනු විකිණීමේදී සිදුවන වියදම් අඩුකල පසු ලද ශුද්ධ විකුණුම් මිල වේ. බඩු තොග සදහා වියදම් කල මුදල යනු තොග ලබාගැනීම සදහා සහ එම තොග වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සදහා දරණ ලද පිරිවැය වේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | පළමු ඇතුලට පළමු පිටතට පදනම මත සැබෑ වියදමට |
| නිමි භාණ්ඩ-කොන්ක්‍රීට් නිෂ්පාදන | සැබෑ වියදම මත |
| කෙරෙමින් පවතින වැඩ | සෘජු යෙදවුම් සහ සෘජු සේවක පිරිවැය මත සහ සුදුසු සෘජු නිෂ්පාදන පිරිවැය මත පදනම්ව. |
| පරිභෝජන ද්‍රව්‍ය සහ අමතර ද්‍රව්‍ය | පළමු ඇතුලට පළමු පිටතට පදනම මත සැබෑ වියදමට |

**2.2.7. මුදල් හා මුදල් වලට සමාන දෑ**

අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ අවදානමක් නොමැතිව පවතින වටිනාකමට පහසුවෙන් මුදල් බවට පත් කරගත හැකි කෙටිකාලීන ආයෝජන මුදල් සහ මුදල් වැනි දෑ සලකනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සදහා අතේ ඇති මුදල්, බැංකු තැන්පත්තු, බැංකු අයිරා, මාස 03 හෝ අඩු කෙටි කාලීන ආයෝජන ආදිය මුදල් හා මුදල් වලට සමාන දේවල් ලෙස සලකනු ලැබේ.

**2.2.8. ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු සහ ගණදෙනුකරුට ගෙවිය යුතු දෑ හඳුනා ගැනීම.**

ගණදෙනුකරු විසින් ඉදිකිරීම් වැඩ සදහා සිදුකල යුතු ගෙවීම්වල දළ අගයන්

(අ) දැරීමට සිදුවූ වියදම හා හඳුනාගත් ලාභය : **අඩු කලා**

(ආ) හඳුනාගත් පාඩු සහ කල වැඩ සදහා බිල්පත් වටිනාකම

කරමින් පවතින ඉදිකිරීම් සඳහා දරන වියදම් ඉක්මවා බිල්පත් ඉදිරිපත් කර ඇති විටදී වියදමට ලාභය එකතු කරයි.

**2.3. වගකීම් සහ ප්‍රතිපාදන**

පසුගිය සිද්ධින් නිසා වර්තමානයේදී ඇතිවන වගකීම් සම්බන්ධව ඇතිවන බැඳීම් සහ ආර්ථිකමය ප්‍රතිලාභ සඳහා බලපාන සම්පත් පිටතට ගලායාම සම්බන්ධයෙන් සිදුකරන නිරාකරණය කිරීමද මූල්‍යමය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කරනු ලැබේ. ණය හිමියන්ගේ වගකීම් සඳහා වාර්තා කරනු ලබන දින සිට අවුරුද්දක් ඇතුලත සිදුකිරීමට සිදුවන ගෙවීම් ජංගම වගකීම් ලෙස සලකනු ලබන අතර, ඒවා ගෙවිය යුතු වගකීම් ලෙස මූල්‍යම තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කරනු ලැබේ. වාර්තාකරණ දින සිට අවුරුද්දක් පසුව, ඒවා ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

අතිත සිදුවීමක් නිසා සංස්ථාව වෙත අත්වී තිබෙන නීතිමය හෝ සාධනීය වගකීමක් නිසා සිදුවීමට හැකි ආර්ථිකමය ප්‍රතිලාභ පිටතට ගලා යාමක් සිදුවීමට හැකි අවස්ථාවලදී එය නිරාකරණය කිරීම සඳහා විශ්වාසනිය තක්සේරුවක් සිදුකල හැකි අවස්ථාවකදී එය මූල්‍යම තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් ලෙස ඇතුලත් කල යුතුය.

**2.3.1. විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්**

**අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිත**

පාරිතෝෂිත ගෙවීම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ක්‍රමයක් වේ. අදාළ පනත්වල නියමයන්ට අනුකූලව සංස්ථාව පාරිතෝෂිත ගෙවීම සම්බන්ධයෙන් බැඳී සිටි. මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා එම ලබා දීම් LKAS39 සඳහන් කර ඇති සූත්‍ර ක්‍රමය භාවිත කිරීම මගින් මුදල් ප්‍රමාණයට සමාන වන පරිදි ගණනය කර මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල ඉදිරියට ගෙන යාම සිදුකරනු ලැබේ.

**(ආ) අර්ථ දක්වන ලද දායකත්වය සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල**

අදාළ පනත් සහ රෙගුලාසි වලට අනුකූලව සේවකයන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල්වල දායකත්වයට හිමිකම් ලැබේ.

**2.4. ආදායම්**

**2.4.1. ආදායම් හඳුනාගැනීම.**

සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ලැබෙන බවට සම්භාවිතාවයක් ඇති විට ආදායම් හඳුනාගනු ලබන අතර, ආදායම් සහ ඒ හා සම්බන්ධ වියදම් විශ්වාසනීයව ගණනය කිරීමට හැකිවිය යුතු අතර භාණ්ඩ හෝ සේවා සැපයුම පිළිබඳ ඇති හිමිකාරත්වය සම්බන්ධයෙන් වන සැලකිය යුතු අවදානමක් සහ ප්‍රතිලාභ පාරිභෝගිකයා වෙත පැවරීමක් සිදුවිය යුතුය. අවසන් ප්‍රතිඵලය සම්බන්ධව පාලනයකින් තොරවිය යුතුය. ලැබූ හෝ ලැබිය යුතු සාධාරණ වටිනාකම වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කිරීමෙන් පසු ආදායම හඳුනාගැනීම සිදුකරනු ලැබේ. පහත සඳහන් විශේෂිත නිර්ණායක ආදායම් හඳුනාගැනීමේදී යොදා ගනී.

**(අ) ඉදිකිරීම් ආදායම්**

සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ලැබෙන බවට සම්භාවිතාවයක් ඇති විට ආදායම් හඳුනාගනු ලබන අතර, ආදායම් සහ ඒ හා සම්බන්ධ වියදම් විශ්වාසනීයව ගණනය කිරීමට හැකිවිය යුතු අතර භාණ්ඩ හෝ සේවා සැපයුම පිළිබඳ ඇති හිමිකාරත්වය සම්බන්ධයෙන් වන සැලකිය යුතු අවදානමක් සහ ප්‍රතිලාභ පාරිභෝගිකයා වෙත පැවරීමක් සිදුවිය යුතුය. අවසන් ප්‍රතිඵලය සම්බන්ධව පාලනයකින් තොරවිය යුතුය. ලැබූ හෝ ලැබිය යුතු සාධාරණ වටිනාකම වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කිරීමෙන් පසු ආදායම හඳුනාගැනීම සිදුකරනු ලැබේ. පහත සඳහන් විශේෂිත නිර්ණායක ආදායම් හඳුනාගැනීමේදී යොදා ගනී.

**(ආ) භාණ්ඩ විකිණීම.**

භාණ්ඩ වල අයිතියේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ මිලදී ගන්නට පවරා දී ඇති විටදී සහ සංස්ථාවට විකිණූ භාණ්ඩ හිමිකාරීත්වය සම්බන්ධව කිසිදු කළමණාකරන බැඳියාවක් හෝ පාලනයක් නොමැති විටදී ආදායම හඳුනාගනු ලබයි.

**(ඇ) පොලිය.**

පොලී ආදායම කාල සීමාව මත තිරණය කරනු ලැබේ.

**(ඈ) බදු කුලිය සහ අනෙකුත් ආදායම්.**

බදු කුලිය උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**(ඉ) ලාභ සහ අලාභ.**

| එ) සමාලෝචිත වර්ෂය තුළදී, ජර්නල් සටහනක් මගින් රු. 53,804,958ක් වටිනා නිමි භාණ්ඩ තොගයක් විකුණුම් පිරිවැයට ආරම්භක හා අවසාන තොගය ලෙස ගෙන ඇත. එබැවින්, වර්ෂයේ ලාභය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නව | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සටහන් කර ගන්නා ලදී. | මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්කරණ කටයුතුවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

1.4.3 නොසැසඳුන පාලන ගිණුම

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව රු. | අනුරූප වාර්තා අනුව රු. | වෙනස Rs. | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| අ) මිලදී ගැනීමේ අත්තිකාරම් - කොන්ක්‍රීට් අංගනය | 10,565,361 | 10,740,411 | 175,050 | නව | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | ලෙජර් කේත දෝෂ නිසා වෙනස්කම් ඇති වී ඇති අතර 2023 වර්ෂයේදී මේවා නිවැරදි කරනු ඇත. | අදාළ නිවැරදි ලේඛන සමඟ ගිණුම් පදනම සකස් කිරීමට පියවර ගත යුතුය. |
| ආ) විවිධ අත්තිකාරම් | 18,321,687 | 18,690,197 | 368,510 | නව | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | ලෙජර් කේත දෝෂ නිසා වෙනස්කම් ඇති වී ඇති අතර 2023 වර්ෂයේදී මේවා නිවැරදි කරනු ඇත. | අදාළ නිවැරදි ලේඛන සමඟ ගිණුම් පදනම සකස් කිරීමට පියවර ගත යුතුය. |

1.4.4 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රමිතියේ අංක 25 ඡේදය ප්‍රකාරව හා මූල්‍ය වාර්තාකරණ සංකල්පනාත්මක රාමුවේ 4.1 ඡේදය ප්‍රකාරව, අඛණ්ඩ පැවැත්ම සඳහා ආයතනයට ඇති හැකියාව සහ අඛණ්ඩ පැවැත්ම සඳහා ආයතනයට ඇති හැකියාව සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතා පිළිබඳව සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති කිරීමට සම්බන්ධ සිද්ධීන් හෝ තත්වයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් තක්සේරුවක් කළ යුතුය. එසේ වුවද, කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ වැදගත් යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය තුළ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අනාවරණය කර නොතිබුණි.<br>කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මුළු වත්කම රු. 7,592,792,156ක් වූ අතර බාහිර බැරකම් රු. 6,754,254,108ක් හෙවත් මුළු වත්කම්වලින් සියයට 88 ක් විය. තවද, මූල්‍ය අංශය විසින් දැනටමත් ආදායමක් ලෙස හඳුනාගත් නමුත් ඉන්වොයිස් නොකළ පාරිභෝගිකයන්ගෙන් අයවිය යුතු මුදල රු.1,898.863,720 ක ලැබීම අවිනිශ්චිත වූ නමුත් ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි. | නව | පුරෝකථනය කළ හැකි අනාගතය තුළ අඛණ්ඩ පැවැත්ම සඳහා සංස්ථාවට ඇති හැකියාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරුවක් සිදු කර ඇති අතර 2022 සඳහා වාර්ෂික ගිණුම් සකස් කිරිමේදී ව්‍යාපාරය ඇවර කිරීමට හෝ වසා දැමීමට ඇති අවශ්‍යතාවයක් පිළිබඳ පුරෝකථනයක් ඔවුන් විසින් සිදු කර නොමැත.<br><br>සාම්ප්‍රදායික මාර්ග සහ පාලම් ඉදිකිරීම් කටයුතු මත යැපීමෙන් තොරව වාහන නඩත්තුව හා අලුත්වැඩියාව, සිල්පර නිෂ්පාදනය හා නඩත්තු කටයුතු, හදිසි ඉදිකිරීම් වැඩ හා විදේශීය හා දේශීය රැකියාවන් සඳහා නිපුණතා පුහුණු ආදී විවිධ ව්‍යාපාර දෘෂ්ටිකෝණ කෙරෙහි සංස්ථාව 2023 වසරේ දී යොමු වී ඇති බව සඳහන් කිරීමට අවශ්‍ය වේ.<br><br>එහි මෙහෙයුම් අවශ්‍යතාවයන්ට සහයෝගය දක්වමින් 2023 වසරේ දී ලංකා බැංකුව සමග බැඳුම්කර පහසුකම් පිළිබඳ සාකච්ඡා කර ඇත. | කළමනාකරණය විසින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සාධාරණ තක්සේරුවක් සිදු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් හෙළිදරව්කිරීම් සිදු කළ යුතුය. |

### 1.4.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

**පහත සඳහන් ශේෂයන් සම්බන්ධයෙන් ඉල්ලා සිටි උපකාරක ලියකියවිලි විගණනයට ලබා දී නොමැත. එබැවින්, එම ශේෂයන්ගේ නිරවද්‍යතාවය සහ වලංගුභාවය සහතික කිරීමට නොහැකි විය.**

| | ගිණුම් අයිතමය | අගය රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | ------------------ | --------- | ----------------- | ----------- | -------------- | ------------------------ | ------------------ |
| (අ) | මිලට ගැනුම් අත්තිකාරම් - ඉදිකිරීම් | 3,802,323 | කාල විශ්ලේෂණය | නව | ක්‍රමවේදය හඳුන්වා දිය යුතුයි | මෙම අගය නිවැරදි කිරීම සඳහා කමිටුවක් පත් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගනුදෙනු සහ මුදල සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කර පිළිගැනීම සඳහා සියලුම ලේඛනගත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සේවා අතත්තිකාරම් | 76,806 | කාල විශ්ලේෂණය | නව | ක්‍රමවේදය හඳුන්වා දිය යුතුයි | කේත හා සම්බන්ධ දෝෂය 2023 වර්ෂයේදී නිවැරදි කෙරේ. | |
| (ඇ) | විවිධ අත්තිකාරම් | 15,655,787 | කාල විශ්ලේෂණය | නව | ක්‍රමවේදය හඳුන්වා දිය යුතුයි | කාල විශ්ලේෂණය 2023 දී සපයනු ලැබේ. | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඇ) | ණයවර ලිපි ආන්තික ගිණුම | 151,081,568 | විස්තරාත්මක උපලේඛනය සහ ලද භාණ්ඩවල විස්තර | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම මුදල නිවැරදි කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගනුදෙනු සහ මුදල සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කර පිළිගැනීම සඳහා සියලුම ලේඛනගත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | විවිධ ණයගැතියෝ | 29,914,674 | විස්තරාමක උපලේඛන | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | උපලේඛන 2023 දී ලබා දෙනු ලැබේ. | |
| (ඊ) | ණයගැති - Ready Mix | 34,802,842 | විස්තරාමක උපලේඛනය | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | ශේෂ සනාථ කිරීම්2023 වර්ෂයේ ලබා දෙනු ලැබේ. | |
| (උ) | ඉදිකිරීම් - ණයගැතියෝ | 399,374,382 | ණයගැති සනාථ කිරීම් | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | ශේෂ සනාථ කිරීම්2023 වර්ෂයේ ලබා දෙනු ලැබේ. | |
| (ඌ) | රඳවා ගැනීම් - ඉදිකිරීම් | 573,104,953 | ණයගැති සනාථ කිරීම් | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | ශේෂ සනාථ කිරීම්2023 වර්ෂයේ ලබා දෙනු ලැබේ. | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (උ) | මාර්ග සංඥා පද්ධති - ණයගැති යෝ | 28,474,571 | ණයගැති සනාථ කිරීම් | පවත්නා | පවතින ක්‍රමවේද ය වැඩිදියු ණු කිරීම අවශ්‍ය ය | ශේෂ සනාථ කිරීම2023 වර්ෂයේ ලබා දෙනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගනුදෙනු සහ මුදල සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ ය කර පිළිගැනීම සඳහා සියලුම ලේඛනගත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඌ) | කොන්ක්‍රීට් අංගන ණයගැති යෝ | 52,635,175 | ණයගැති සනාථ කිරීම් | පවත්නා | පවතින ක්‍රමවේද ය වැඩිදියු ණු කිරීම අවශ්‍ය ය | ශේෂ සනාථ කිරීම2023 වර්ෂයේ ලබා දෙනු ලැබේ. | |
| (එ) | ඇස්පෝල්ට් - ණයගැති යෝ | 1,622,511 | ණයගැති සනාථ කිරීම් | පවත්නා | පවතින ක්‍රමවේද ය වැඩිදියු ණු කිරීම අවශ්‍ය ය | ශේෂ සනාථ කිරීම2023 වර්ෂයේ ලබා දෙනු ලැබේ. | |

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු

සංස්ථාවේ පහත සඳහන් ණයගැති ශේෂය වසර 03 කට වැඩි කාලයක් අයකර නොගෙන පැවතුනි. මෙම ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන නොතිබූ අතර අවිනිශ්චිත ණය සඳහා පමණක් ප්‍රතිපාදන සලසා තිබුණි.

| විගණන නිරීක්ෂණ | | | | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|---|---|
| | **විස්තරය** ------------ | **මුළු ණයගැති ශේෂය** --------- | **වසර 03කට වැඩි ශේෂය** ----------------- | | | | |
| (අ) | ඉදිකිරීම් ණයගැතියන් | 488,946,699 | 59,936,277 | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව පසු විපරම් කරමින් සිටී. | හිඟහිටි ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ආ) | කොන්ක්‍රීට් අංගනය | 52,635,175 | 39,030,961 | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව පසු විපරම් කරමින් සිටී. | හිඟහිටි ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (c) | මාර්ග සංඥා පද්ධතිය | 34,884,101 | 11,454,026 | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව පසු විපරම් කරමින් සිටී. | හිඟහිටි ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (d) | ප්‍රමාද ගාස්තු | 236,033,768 | 185,263,944 | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව පසු විපරම් කරමින් සිටී. | හිඟහිටි ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (e) | ඉදිකිරීම් ණයගැතියන් - රඳවා ගැනීම | 715,479,503 | 357,088,802 | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව පසු විපරම් කරමින් සිටී. | හිඟහිටි ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (f) | මිලදී ගැනීම් අත්තිකාරම් | 217,090,971 | 38,458,082 | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම අත්තිකාරම් අයකර ගැනීම/පියවීම පිළිබඳව සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පසු විපරම් කරමින් සිටී. | හිඟහිටි ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

1.5.2 ගෙවියයුතු

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| සේවක අර්ථ සාධක අරමුදළ සඳහා දායක මුදල් සහ ඒ සම්බන්ධ අධිභාර වූ රු. 143,263,552 ක මුදලක් 2020 සිට සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවා නොතිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | 2020 මුල් කාර්තුවේ සිට බලපැවැත්වූ COVID 19 වසංගතය හේතුවෙන් සංස්ථාවේ මුදල් ප්‍රවාහ තත්ත්වය ඉතාමත් දුර්වල තත්ත්වයක පැවතුනි. ඒ හේතුවෙන් සඳහන් කරන ලද කාලපරිච්ජේදය තුළ සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායකමුදල් ගෙවීමට සංස්ථාව අපොහොසත් විය. තවද ආර්ථික අර්බුදය අහිතකර ලෙස කොන්ත්‍රාත් කර්මාන්තයට බලපෑ අතර ඒ හේතුවෙන් නොගෙවන ලද EPF දායක මුදල් විශාල ප්‍රමාණයක් නිරවුල් කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පාන ලදී. සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේදී එම මුදල නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මෙම ශේෂයන් පියවීමට පියවර ගත යුතුය. |

1.5.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| ලැබුණු රු.32,337,967ක සචලීකරණ අත්තිකාරම් නිරවුල් නොකර වර්ෂ 05 ක් පුරා පැවතුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සටහන් කර ගතිමි. | මෙම ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

1.6 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය සමග අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 756 | 2023 ඔක්තෝබර් 31 දක්වා සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පවත්නා | පවතින ක්‍රමයට අනුකූලව කටයුතු කළ යුතුය | එය 2023 වර්ෂයේදී ඉදිරිපත් කෙරේ. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූල වීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. |
| (b) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ / 2006 ජනවාරි 25 දිනැති NPA චක්‍රලේඛ අංක 08 හි 5.4.4 (iii) ඡේදය | ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ මට්ටමෙන් සියයට 90 දක්වා ළඟා වීමට පෙර ලැබුණු සචලීකරණ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම පියවිය යුතුය. එසේ වුවද, සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘති 12 ක් සම්බන්ධයෙන් වන රු. | පවත්නා | පවතින ක්‍රමයට අනුකූලව කටයුතු කළ යුතුය | සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛවලට අනුකූල වීම සඳහා නිසි අවධානය යොමු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 10,276,460 ක අත්තිකාරම් මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට පියවීමකින් තොරව ගිණුම් තුළ පැවතුණි. | | | | |

1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) සංස්ථාව විසින් සිදු කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු. 792,828,722 ක බිල්පත් වට්ටම් කර සංස්ථාව මාස 03 ක කාලයක් සඳහා රු. 596,121,535 ක ණය මුදලක් ලංකා බැංකුව වෙතින් ලබාගෙන තිබුණි. මෙම බිල්පත් නියමිත මාස 03ක් තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් බැංකුවට නොගෙවීම හේතුවෙන් සංස්ථාව රු. 17,523,517 ක පොලියක් ගෙවා තිබුණි. | නව | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | එකඟවේ | පොලී පිරිවැය අවම කරමින් සේවාදායකයාගෙන් බිල්පත් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ණය හිග ශේෂය රු.1,848,249,580 ක් වූ අතර එම ණය සඳහා පොලී වියදම රු.96,708,228 ක් සමාලෝචනයට භාජනය වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇත. | නව | පවතින ක්‍රමයට අනුකූලව කටයුතු කළ යුතුය | එකඟවේ | සුදුසු උපාය මාර්ග භාවිතා කිරීමෙන් පොලිය අවම කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකු දෙකකින් ලබාගෙන තිබූ කාලීන ණය ශේෂය රු.මිලියන 1,848.24 ක් වූ අතර කල්තැබූ ණය ශේෂවල වටිනාකම රු.මිලියන 1,727.18 ක් විය. මෙම ණය අතරින් භාණ්ඩාගාර ඇපකර යටතේ රු.මිලියන 990.61 ක් ලබාදී තිබූ අතර රු.මිලියන 518.60 ක් සඳහා සංස්ථාවේ ඉඩම් ඇපකර ලෙස සංස්ථාව විසින් ලබාදී තිබුණි. | නව | පවතින ක්‍රමයට අනුකූලව කටයුතු කළ යුතුය | බැංකු විසින් 2024 ජනවාරි මස අවසානය දක්වා ණය කල් තැබීමක් ලබා දී තිබුණි. ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර ඇපකර ණය කල්දැමීම සඳහා දැනටමත් අනුමැතිය ලබා දී ඇත. | සංස්ථාවේ කළමනාකාරිත්වය කාලීන ණය කලින් ගෙවීමට සහ පොලී වියදම් අඩු කිරීමට අවධානය යොමු කළ යුතුය. |

1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) 2002 අංක 14 එකතු කළ අගය මත බදු පනතට අනුව 2006 වසරේ සිට වැට් බද්ද සහ අධිභාර රු. 2,403,180,405 ක් ගෙවා නොතිබුණි . | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | - | සංස්ථාව බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ) 2009 අංක 09 ජාතිය ගොඩනැගීමේ බදු පනතට අනුව 2010 වසරේ සිට ජාතිය ගොඩනැගීමේ බදු සහ අධිභාරය රු. 7,148,826ක් ගෙවා නොතිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේදී ජාතිය ගොඩනැගීමේ බදු බැරකම පියවනු ලැබේ. | සංස්ථාව බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඇ) 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනතේ 02වන වගන්තිය අනුව ගෙවිය යුතු රු. 101,228,248 ආර්ථික සේවා ගාස්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සංස්ථාවේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී ආර්ථික සේවා ගාස්තු බැරකම පියවනු ලැබේ. | සංස්ථාව බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ **මෙහෙයුම් කටයුතු හේතුවෙන් ජනිත බදු පෙර ශුද්ධ ලාභය රුපියල් 26,921,045 ක්** වූ අතර පෙර වසරේ අදාළ බදු පෙර ශුද්ධ ලාභය රුපියල් 96,124,611 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල **රුපියල් 69,203,566 ක සැලකිය යුතු අඩුවීමක්** පෙන්නුම් කරයි. මෙම මූල්‍ය ප්‍රතිඵලයට **ආදායම් අඩුවීම සහ විකුණුම් පිරිවැය අඩුවීම** මෙන්ම **පරිපාලන වියදම් වැඩිවීම** ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචනයට භාජනය වන වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ මෙහෙයුම් අයිතමවල වැඩිවීමේ හෝ (අඩුවීමේ) ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය පහත දැක්වේ.

(අ) ආදායම

| | විස්තරය | මූල්‍ය ප්‍රකාශනයට අනුව මුදල | | විචලනය {හිතකර/ (අහිතකර) } | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | 2022 රු. | 2021 රු. | රු. | % |
| (i) | ඉදිකිරීම් ආදායම | 2,059,987,261 | 3,371,051,882 | (1,311,064,621) | (39) |
| (ii) | බාහිර විකිණීම - කොන්ක්‍රීට් අංගනය | 168,777,731 | 324,379,762 | (155,602,031) | (48) |
| (iii) | අභ්‍යන්තර විකුණුම් - කොන්ක්‍රීට් අංගනය | 118,877,060 | 139,653,904 | (20,776,844) | (15) |
| (iv) | මාර්ග සංඥා පද්ධති සහ වැඩ සේවා | 198,039,225 | 380,453,608 | (182,414,383) | (48) |

(ආ) මෙහෙයුම් වියදම්

| | විස්තරය | මූල්‍ය ප්‍රකාශනයට අනුව මුදල | | විචලනය {හිතකර/ (අහිතකර) } | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | 2022<br>රු. | 2021<br>රු. | රු. | % |
| (i) | සේවක ප්‍රතිලාභ | 643,740,912 | 755,840,745 | 112,099,833 | 15 |
| (ii) | සිමෙන්ති | 32,971,442 | 66,628,006 | 33,656,564 | 50 |
| (iii) | වැලි | 10,141,658 | 30,641,024 | 20,499,366 | 67 |
| (iv) | මෙටල් | 51,967,821 | 173,083,899 | 121,116,078 | 70 |
| (v) | වානේ | 152,637,430 | 573,907,397 | 421,269,967 | 73 |
| (vi) | ඉන්ධන සහ ලිහිසි තෙල් | 72,517,622 | 98,979,607 | 26,461,985 | 27 |
| (viii) | පෙරනිමි මිශ්‍ර කොන්ක්‍රීට් | 91,562,756 | 192,825,256 | 101,262,500 | 53 |
| (ix) | කොන්ක්‍රීට් නිෂ්පාදන | 144,706,973 | 89,528,722 | (55,178,251) | 62 |
| (x) | තාර පරිභෝජනය | 38,525,183 | 195,117,596 | 156,592,413 | 80 |
| (xi) | විදුලි අමතර කොටස් පරිභෝජනය | 70,549,763 | 125,798,866 | 55,249,103 | 44 |
| (xii) | වෙනත් තොග | 131,138,127 | 241,382,171 | 110,244,044 | 46 |
| (xiii) | බොරළු | 12,270,762 | 41,574,927 | 29,304,165 | 70 |
| (xiv) | කුලී ගාස්තු | 125,974,402 | 221,849,811 | 98,875,409 | 43 |
| (xv) | උප කොන්ත්‍රාත්තු | 416,782,728 | 691,780,174 | 274,997,446 | 40 |
| (xvi) | බැඳුම්කර සඳහා ගාස්තු | 18,012,242 | 43,904,434 | 25,892,192 | 59 |
| (xvii) | විවිධ වියදම් - වැඩ බිම | 9,777,103 | 35,896,241 | 26,119,138 | 73 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) මාර්ග සංවර්ධන අධිකාරිය සහ සංස්ථාව අතර විධිමත් කොන්ත්‍රාත්තු ගිවිසුමකට එළැඹීමකින් තොරව 2013 වර්ෂයේදී වාචික උපදෙස් මත රත්නපුර මුවගම පැරණි පාලමේ [illegible]මික ව්‍යාපෘතිය | නව | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම මුදල එකතු කිරීම සම්බන්ධයෙන් සංස්ථාව පසු විපරම් කරමින් සිටී. | හිඟ ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| අධිකාරිය භාරගෙන තිබුණි. 2019 දී ප්‍රතිකාර්මික ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසු සංස්ථාව විසින් රු.මිලියන 53,632,309 ක ඉන්වොයිසියක් ප්‍රතිකාර්මික පිරිවැය සහ ප්‍රවාහනය කිරීමේ පිරිවැය අයකර ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණි. මේ මුදල මෙතෙක් අයකරගෙන නොතිබුණි. | | | | |
| (ආ) සංස්ථාවේ පූර්ණ අයිතිය ඇති පරිපාලිත ආයතනය වන Devcoshowa (Pvt) Ltd කාලයක් තිස්සේ අක්‍රියව පවතින අතර, සමාගම ඈවර කිරීමට 2006 වර්ෂයේදී මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. ඈවර කිරීමේ ක්‍රියාවලිය 2023 ඔක්තෝබර් 31 වන විටත් අවසන් වී නොතිබුණි. | පවත්නා | ක්‍රමවේදය හඳුන්වා දිය යුතු අතර පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීමක් අවශ්‍ය ය. | 2023.09.15 දින පැවති ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ කමිටු (AMC) රැස්වීමේදී මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාට උපදෙස් දී ඇත. | සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් මොනරාගල මැණික් ගැරීමේ ව්‍යාපෘතියක් සඳහා රු.5,844,024 ක් වැය කර ඇතත් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර දක්වා ඉන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | එකඟවේ | පනතේ අරමුණ අනුව සංස්ථාව තීරණ ගත යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| ලාභ ගණනය කිරීමේ උපලේඛණය අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 92 කින් ඉදිකිරීම් ව්‍යාපෘති 17 කින් රු.128,913,023 ක අලාභ හඳුනාගෙන තිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | **අරමුදල් නොමැතිකම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර කරන ලදී.** අදාළ කාල සීමාව සඳහා පොදු වියදම් සඳහා නිෂ්ක්‍රීය හිමිකම් ඉල්ලීම් කරනු ඇත. කොවිඩ් කාලසීමාවේදී, ප්‍රවාහන සීමා කිරීම් සහ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් වැඩ කටයුතු නතර කරන ලදී. | වියදම් අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

3.3 ඌණ උපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු.114,975,000 ක වියදමින් මෝටර් රථ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ 39 ක් අලුත්වැඩියා කිරීමට තිබෙන බව රත්මලාන ප්‍රධාන කාර්යාලයේ භෞතික පරීක්‍ෂණයේ දී නිරීක්ෂණය විය. අළුත්වැඩියා සඳහා රු. 19,225,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, මේ දක්වා සංස්ථාව විසින් එම අලුත්වැඩියා සිදු කර නොතිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් වාහන සහ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමට නොහැකි වී ඇත. බොහෝමයක් ව්‍යාපෘති නවතා දමා ඇති බැවින් එකී වාහන සහ උපකරණ සඳහා ඉල්ලුමක් නොමැත. අනාගතයේදී අවශ්‍යතාවයක් ඇති වූ විට, ඉහත සඳහන් දෑ අලුත්වැඩියා කර භාවිතා ගනු ඇත. | වත්කම් නිසි ලෙස නඩත්තු කර ප්‍රයෝජනයට ගන්නා බව සහතික කිරීමට පියවර ගත යුතුය. |

3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| අ) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 489ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 565ක් විය. ඒ අනුව, විවිධ තනතුරු සඳහා සංස්ථාවට සේවකයින් 76ක් වැඩිපුර බඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල ශ්‍රම අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සංස්ථාවට සිදු විය . | වරින් වර කෙරෙන සමාලෝචන මගින් නියමිත සේවක සංඛ්‍යාව තහවුරු කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ආ) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ඉහළ කළමනාකාරීත්වයේ එක් තනතුරක් පුරප්පාඩු වී තිබුණි. මීට අමතරව | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | මෙම පුරප්පාඩුව පිරවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. | ඉහළ කළමනාකරණ තනතුරු බඳවා ගැනීම සමාලෝචන |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරුවන් (කොන්ක්‍රීට් අංගන) 02 ක් සහ ප්‍රධාන ඉංජිනේරු (සැලසුම්) වශයෙන් පුරප්පාඩු 03 ක් ඇති වී තිබුණි. | | | | ඒ අනුව පියවර ගත යුතුය. |
| ඇ) සිවිල් ඉංජිනේරුවන් සඳහා අනුමත සේවක සංඛ්‍යාව 19 ක් වුවද සිවිල් ඉංජිනේරුවන් 51 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල ශ්‍රම අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සංස්ථාවට සිදු විය | වරින් වර කෙරෙන සමාලෝචන මගින් නියමිත සේවක සංඛ්‍යාව තහවුරු කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ඇ) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ආරක්ෂක නිලධාරීන් 20 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | පවත්නා | පවතින ක්‍රමවේදය වැඩිදියුණු කිරීම අවශ්‍ය ය | 2022 වර්ෂයේදී දිවයිනේ විවිධ ප්‍රදේශවල ව්‍යාපෘති ස්ථානවල වත්කම් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීමට සංස්ථාවට සිදු විය. | අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. |

**4. ගිණුම්කරණභාවය සහ යහපාලනය**

**4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත භාර දිය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනය දින 134 ක් ප්‍රමාදයකින් පසු 2023 ජූලි 13 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | නව | පවතින ක්‍රමවේදයට අනුකූල වීම අවශ්‍ය වේ | සංස්ථාව 2022 වර්ෂයේ වාර්ෂික ගිණුම් සකස් කර 2023 මාර්තු 02 දින අධ්‍යක්ෂ මණ්ඩලය (BOD) වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය අළුතින් පත්කර ඇති බැවින් ඔවුන් සමාලෝචනය සඳහා කාලය ඉල්ලා සිටි අතර එය 2023 ජූලි 06 දින අනුමත කරන ලදී. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට නිසි අවධානය යොමු කළ යුතුය. |

4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නව හෝ පවත්නා ගැටලුව | පාලන අවදානම් නිරාවරණය | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| අ) 2022 වර්ෂය සඳහා අයවැයගත ආදායම රු. 6,963,390,000 ක් වුවද, සත්‍ය ආදායම වූයේ රු. 2,545,681,276 කි. එය අයවැයගත මුදල හා සැසඳීමේදී සියයට 63ක ආදායම් අඩුවීමක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව, සත්‍ය දළ ලාභය හා සැසඳීමේදී අයවැයගත දළ ලාභය සියයට 55කින් අඩු වී ඇත. | නව | පවතින ක්‍රමවේදයට අනුකූල වීම අවශ්‍ය වේ | එකගවේ<br><br>2022 වර්ෂය, කොවිඩ් - 19 අර්බුදයෙන් පසු **ඉදිකිරීම් කර්මාන්තයේ** යළි ප්‍රකෘතිමත් වීමක් අපේක්ෂා කළ ද, **ද්‍රව්‍ය හා ඉන්ධන හිඟය, ද්‍රව්‍ය මිල ඉහළ යෑම**, සහ මුදල් ප්‍රවාහ ගැටලු හේතුවෙන් රාජ්‍ය ව්‍යාපෘති තාවකාලිකව වසා දැමීම වැනි කරුණු සමඟ ඇතිවූ **මූල්‍ය අර්බුදය** නිසා එම ප්‍රකෘතිමත් වීම අඩාල විය. එබැවින්, **අපේක්ෂිත ආදායම සහ ලාභය** ළඟා කර ගැනීමට නොහැකි විය. | සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| ආ) පාලම් ව්‍යාපෘති 31 ක් සඳහා අයවැයගත වියදම රු. 3,315,430,000 ක් වුවද, එහි සත්‍ය වියදම රු. 990,410,000 ක් විය. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට බිංදුවේ (0) සිට 53 දක්වා පරාසයක | නව | පවතින ක්‍රමවේදයට අනුකූල වීම අවශ්‍ය වේ | ඉදිකිරීම් කර්මාන්තය මුහුණ දුන් මූල්‍ය අර්බුදය හේතුවෙන් **ව්‍යාපෘති ප්‍රගතිය** දැඩි ලෙස අඩාල විය. ද්‍රව්‍ය හා ඉන්ධන හිඟකම, | සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| පැවතිණි. | | | මිල ඉහළ යෑම, ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම හෝ සිදු නොවීම වැනි කරුණු, අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රගතිය සහ **අපේක්ෂිත වියදම** ළඟා කර ගැනීමට නොහැකි වීම සඳහා හේතු විය | |
| ඇ) මාර්ග ව්‍යාපෘති 15 ක් සඳහා අයවැයගත වියදම රු. 1,203,360,000 ක් වුවද, එහි සත්‍ය වියදම වූයේ රු. 184,140,000 කි. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 17 ට වඩා අඩු මට්ටමක පැවතිණි. | නව | පවතින ක්‍රමවේදයට අනුකූල වීම අවශ්‍ය වේ | ඉදිකිරීම් කර්මාන්තය මුහුණ දුන් මූල්‍ය අර්බුදය හේතුවෙන් **ව්‍යාපෘති ප්‍රගතිය** දැඩි ලෙස අඩාල විය. ද්‍රව්‍ය හා ඉන්ධන හිගකම, මිල ඉහළ යෑම, ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම හෝ සිදු නොවීම වැනි කරුණු, අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රගතිය සහ **අපේක්ෂිත වියදම** ළඟා කර ගැනීමට නොහැකි වීම සඳහා හේතු විය. | සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| ඇ) ජල සම්පාදන හා වාරිමාර්ග ව්‍යාපෘති 03 ක් සඳහා අයවැයගත වියදම රු. 198,000,000 ක් වුවද, සත්‍ය වියදම වූයේ රු. | නව | පවතින ක්‍රමවේදයට අනුකූල වීම අවශ්‍ය වේ | ඉදිකිරීම් කර්මාන්තය මුහුණ දුන් මූල්‍ය අර්බුදය හේතුවෙන් | සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 31,750,000 කි. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 12 ත් 32 ත් අතර පරාසයක පැවතිණි. | | | **ව්‍යාපෘති ප්‍රගතිය** දැඩි ලෙස අඩාල විය. ද්‍රව්‍ය හා ඉන්ධන හිඟකම, මිල ඉහළ යෑම, ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම හෝ සිදු නොවීම වැනි කරුණු, අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රගතිය සහ **අපේක්ෂිත වියදම** ළඟා කර ගැනීමට නොහැකි වීම සඳහා හේතු විය. | |

එච්.ඒ.ඩී. අබේසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවෙන්

K. NILMINI AMARASINGE (BSc.)
Sworn Translator
Govt. Translator - Class I
Reg . No. 2013 / SE /KL 021
English / Sinhala
315/A, 11th, Lane, Dikhenapura, Horana
Tel: 071 1922178

# කළමණාකරන විගණන වාර්තාව සඳහා පිළිතුර

මගේ අංකය : SDCC/2024/FIN/89 දිනය: 24.07.2024

විගණකාධිපති
(රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව)
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.
මහත්මයාණෙනි,

පිළිතුරු යොමුකිරීම:

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ද ඇතුළුව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව සම්බන්ධයෙන් සභාපති වෙත යොමු කරන ලදී.

උක්ත කාරණය සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 28 දිනැති CAE/C/SDCC/01/2022/12 දරණ ලිපිය හි බැඳේ.

1.4.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

(අ) වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කර ගැනීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කර ඇත.

(ආ) ප්‍රාග්ධන වැඩ කටයුතු දේපළ, පිරියත සහ උපකරණවලට එකතු කර තිබීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කර ඇත.

1.4.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ගෙවිය යුතු වැට් බදු ප්‍රමාණය රුපියල් 238,000,190 කින් අඩුවෙන් පෙන්වා තිබීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කර ඇත.

(ආ) වාර්තා නොකළ වැට් දඩ මුදල රුපියල් 904,788,328 ක් වාර්තා කර නිවැරදි කිරීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී සිදු කර ඇත.

(ඇ) NBT දඩ මුදල රුපියල් 806,721 ක් වාර්තා කර නිවැරදි කිරීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී සිදු කර ඇත.

(ඈ) ආර්ථික සේවා ගාස්තු සහ දඩ මුදල රුපියල් 23,415,620 ක් වාර්තා කර නිවැරදි කිරීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී සිදු කර ඇත.

(ඉ) 2022 දෙසැම්බර් මාසය සඳහා සේවක අර්ථසාධක අරමුදල් (EPF) දායකත්වය 2023 ජනවාරි මාසයේදී ගෙවා වාර්තා කර ඇත. එබැවින්, 2022.12.31 දිනට ගෙවිය යුතු මුදල සහ ගිණුම්ගත ශේෂය අතර වෙනසක් පවතී.

(ඊ) සේවක අර්ථසාධක අරමුදල් අධිභාරය රුපියල් 32,795,632 ක් වාර්තා කර නිවැරදි කිරීම 2023 මූල්‍ය ප්‍රකාශනවලදී සිදු කර ඇත.

(උ) පසුගිය වසරේ විගණන ගාස්තුව (2021) රුපියල් 3,812,400 ක් 2022 වසර සඳහා හඳුනාගෙන ඇත. එය සාපේක්ෂව කුඩා වූ අතර පෙර වසරට ගැලපීම් සිදු නොකරන ලදී.

(ඌ) දෝෂ සහගත ඇතුළත් කිරීම මූල්‍ය ලාභයට බලපෑමක් නොකරයි. කෙසේ වෙතත්, මෙවැනි වැරදි සිදු නොවීමට පියවර ගෙන ඇත.

(එ) එකම ජර්නල් සටහන ආරම්භක සහ අවසන් තොගය ලෙස ගෙන ඇති අතර, මෙවැනි වැරදි සිදු නොවීමට පියවර ගෙන ඇත.

1.4.3 නොසැසඳුන පාලන ගිණුම

(අ), (ආ) මිලදී ගැනීමේ අත්තිකාරම් සහ විවිධ අත්තිකාරම් වල වෙනස්කම් ලෙජර් කේත කිරීමේ දෝෂ නිසා සිදු වී ඇති අතර ඒවා 2023 මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කර ඇත.

1.4.4 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

2023 මූල්‍ය ප්‍රකාශනවල, අඛණ්ඩ පැවැත්ම සහ අධ්‍යක්ෂවරුන්ගේ මතය ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ ඇතුළත් කර ඇත.

1.4.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

(අ), (ආ), (ඇ), (ඉ) 2023 මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කර ඇත.

(ඇ), (ඊ) උපලේඛන සැපයීමට පියවර ගනු ඇත.

(උ), (ඌ), (එ), (ඒ), (ඔ) තහවුරු කිරීම් සැපයීමට පියවර ගනු ඇත.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු

(අ), (ආ), (ඇ), (ඈ), (ඉ) මෙම ණය හිමියන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් කටයුතු කරමින් සිටී.

(ඊ) සාමාන්‍යාධිකාරීගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් මෙම අත්තිකාරම් අයකර ගැනීම/පියවීම පිළිබඳව කටයුතු කරමින් සිටී.

1.5.2 කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික අර්බුදය ඉදිකිරීම් කර්මාන්තයට අහිතකර ලෙස බලපා ඇති අතර, එමගින් විශාල ප්‍රමාණයක පියවීමට නොහැකි වූ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් පියවීමට අපහසු වී ඇත. පියවීමට නොහැකි වූ EPF වලින් රුපියල් 38,053,806 ක් දැනටමත් 2024 දී පියවා ඇති අතර, ඉතිරි මුදලද පියවීමට පියවර ගනිමින් සිටී.

1.5.3 පියවර ගනිමින් පවතී.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

(අ) එය 2023 වසරේදී ඉදිරිපත් කරනු ඇත.

(ආ) කටයුතු කරගෙන යමින් පවතී.

1.7 මුදල් කළමනාකරණය

(අ), (ආ), (ඇ) විගණන සොයාගැනීම් සමග එකඟ වේ. බැංකු විසින් ණය කල්දැමීමේ පහසුකමක් ලබා දී ඇත. ශ්‍රී ලංකා මහ භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර ඇප ණය කල්දැමීම සඳහා දැනටමත් අනුමැතිය ලබා දී ඇත.

1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ), (ආ), (ඇ) සංස්ථාවට මුහුණ දීමට සිදු වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් වැට්, ජාතිය ගොඩනැගීමේ බදු සහ ආර්ථික සේවා ගාස්තු පියවා නොතිබූ අතර, සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඒවා පියවනු ඇත.

2 මූල්‍ය සමාලෝචනය

විගණන සොයාගැනීම් සමග එකඟ වේ. 2022 වසරේදී කොවිඩ්-19 අර්බුදයෙන් ඉදිකිරීම් කර්මාන්තය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කළද, ද්‍රව්‍ය හා ඉන්ධන හිඟය, ද්‍රව්‍ය මිල ඉහළ යාම, මුදල් ප්‍රවාහ ගැටලු හේතුවෙන් රජයේ ව්‍යාපෘති තාවකාලිකව වසා දැමීම මත ඇති වූ මූල්‍ය අර්බුදය නිසා එම යථා තත්ත්වයට පත්වීම අඩාල විය. එබැවින්, අපේක්ෂිත ආදායම සහ ලාභය ලබා ගැනීමට නොහැකි විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මෙම මුදල එකතු කර ගැනීම සඳහා සංස්ථාව විසින් කටයුතු කරමින් සිටී.

(ආ) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ කමිටු (AMC) රැස්වීමේදී මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාට උපදෙස් දී ඇත.

(ඇ) විගණන සොයාගැනීම් සමග එකඟ වේ.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අරමුදල් නොමැතිකම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර කරන ලදී. අදාළ කාල සීමාව සඳහා පොදු වියදම් සඳහා නිෂ්ක්‍රීය හිමිකම් ඉල්ලීම් කරනු ඇත. කොවිඩ් කාලසීමාවේදී, ප්‍රවාහන සීමා කිරීම් සහ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් වැඩ කටයුතු නතර කරන ලදී.

3.3 ඌණ උපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ

සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් වාහන සහ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමට නොහැකි වී ඇත. බොහෝමයක් ව්‍යාපෘති නවතා දමා ඇති බැවින් එකී වාහන සහ උපකරණ සඳහා ඉල්ලුමක් නොමැත. අනාගතයේදී අවශ්‍යතාවයක් ඇති වූ විට, ඉහත සඳහන් දෑ අලුත්වැඩියා කර භාවිතා ගනු ඇත.

3.4 මානව සම්පත් කළමනාකරණය

(අ) සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල ශ්‍රම අවශ්‍යතාවය මත පදනම්ව සංස්ථාවට කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සිදු විය.

(ආ) මෙම පුරප්පාඩුව පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර ඇත.

(ඇ) සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල ශ්‍රම අවශ්‍යතාවය මත පදනම්ව සංස්ථාවට කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සිදු විය.

(ඈ) 2022 වසරේදී රටේ විවිධ ප්‍රදේශවල ව්‍යාපෘති ස්ථානවල වත්කම් ආරක්ෂා කිරීම සඳහා සංස්ථාවට ආරක්ෂක කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සිදු විය.

4. ගිණුම්කරණභාවය සහ යහපාලනය

4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සංස්ථාව 2022 වර්ෂයේ වාර්ෂික ගිණුම් සකස් කර 2023 මාර්තු 02 දින අධ්‍යක්ෂ මණ්ඩලය (BOD) වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය අළුතින් පත්කර ඇති බැවින් ඔවුන් සමාලෝචනය සඳහා කාලය ඉල්ලා සිටි අතර එය 2023 ජූලි 06 දින අනුමත කරන ලදී.

4.2 අයවැය පාලනය

(අ),(ආ), (ඇ) (ඈ) විගණන සොයාගැනීම් සමග එකඟ වේ. කොවිඩ්-19 අර්බුදයෙන් 2022 වසරේදී ඉදිකිරීම් කර්මාන්තය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කළද, ද්‍රව්‍ය හා ඉන්ධන හිඟය, ද්‍රව්‍ය මිල ඉහළ යාම, මුදල් ප්‍රවාහ ගැටලු හේතුවෙන් රජයේ ව්‍යාපෘති තාවකාලිකව වසා දැමීම නිසා ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් එම යථා තත්ත්වයට පත්වීම අඩාල විය. එබැවින්, අපේක්ෂිත ආදායම සහ ලාභය ලබා ගැනීමට නොහැකි විය.

ස්තුතියි,

මෙයට විශ්වාසී,
රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

ඉංජිනේරු එස්.එම්. කුෂාන් දේවින්ද
සභාපති

K. NILMINI AMARASINGE (BSc.)
Sworn Translator
Govt. Translator - Class I
Reg . No. 2013 / SE /KL 021
English / Sinhala
315/A, 11th, Lane, Dikhenapura, Horana
Tel: 071 1922178

# අමාත්‍ය මණ්ඩලයේ අවධානයට ලක්විය යුතු කරුණු

**රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ආරක්ෂා කිරීම සඳහා සාධාරණීකරණය**

රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව වසා දැමීමේ විභවය ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනයට සහ එහි ඉදිකිරීම් කර්මාන්තයේ ස්ථාවරත්වයට සැලකිය යුතු ඍණාත්මක ප්‍රතිවිපාකවලට හේතු වනු ඇත. රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව අත්‍යවශ්‍ය වන්නේ මන්දැයි පහත කරුණු ඉස්මතු කරයි.

<u>ඉදිකිරීම් අංශයේ (SD&CC) හි අද්විතීය කාර්යභාරය</u>

ඉංජිනේරු කටයුතු පිලිබඳ රාජ්‍ය කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ක්‍රියාත්මක වන ආයතන කිහිපයෙන් එකක් (SD&CC) රාජ්‍ය සංවිධාන අතර සුවිශේෂී ස්ථානයක් ගනී ප්‍රසම්පාදනය සහ සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කරන සේවාදායක සංවිධාන ලෙස ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) , ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, විදුලිබල මණ්ඩලය සහ මහවැලි අධිකාරිය වැනි අනෙකුත් රාජ්‍ය සංවිධාන මෙන් නොව (SD&CC) රට පුරා ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි එහි අසමසම ධාරිතාව, විශේෂඥතාව සහ පුළුල් අත්දැකීම් නිසා එය මහා පරිමාණ සහ විවිධාකාර ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක සංවිධානයක් බවට පත් කරයි.

<u>පිරිවැය-ඵලදායී සහ උසස් තත්ත්වයේ ව්‍යාපෘති</u>

වසර 54ක ඉතිහාසය තුළ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව රජයේ ව්‍යාපෘති 1,300කට අධික සංඛ්‍යාවක් සාර්ථකව නිම කර ඇති අතර, එමඟින් අඩු වියදමකින් උසස් තත්ත්වයේ ප්‍රතිඵල අඛණ්ඩව ලබා දී ඇත. ජාතික ලංසු තැබීම හරහා පෞද්ගලික අංශය සමඟ තරඟ කිරීමෙන් රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව රජයේ සැලකිය යුතු අරමුදල් ඉතිරි කර ගෙන ඇති අතර, එසේ නොවුවහොත් එය පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත යොමු කිරීමට ඉඩ තිබුණි.

<u>අර්බුද ප්‍රතිචාර දැක්වීම සහ හදිසි අවස්ථා වලදී රජයේ ප්‍රමුඛතා සඳහා සහාය</u>

2024 ජුනි 1 වන දින පැවති සමාරම්භක උත්සවයේදී ජාතික ජන බලවේගය විසින් රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවල අත්‍යවශ්‍ය කාර්යභාරය අවධාරණය කළ පරිදි, ස්වාභාවික විපත් වැනි හදිසි අවස්ථා වලදී සම්පත් සහ පිරිස් ඉක්මනින් බලමුලු ගැන්වීම සඳහා රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වැනි රාජ්‍ය ආයතනවලට අසමසම හැකියාවන් ඇත. කොන්ත්‍රාත් සීමාවන් හෝ ලාභය මත පදනම් වූ ප්‍රමුඛතා වැනි අභියෝගවලට මුහුණ දිය යුතු පුද්ගලික ආයතන මෙන් නොව, රජයේ නියෝග යටතේ වහාම ක්‍රියාත්මක විය හැකිය. තාවකාලික නිවාස ඉදිකිරීම, යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ සහන මෙහෙයුම් කාර්යක්ෂමව පහසු කිරීම සඳහා මෙම ප්‍රතිචාරාත්මක බව ඉතා වැදගත් වේ. එබැවින්, ජාතික හදිසි අවස්ථා සහ ආපදා අවස්ථාවන්හිදී රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව මිල කළ නොහැකි වත්කමක් බව ඔප්පු වී ඇත. යුද්ධය අතරතුර මැණික් ෆාම් හි අවතැන් වූ පුද්ගලයින් සඳහා තාවකාලික නිවාස ඉදිකිරීම, මීගමුව සහ හලාවත රෝහල්වල කොවිඩ්-19 රෝගීන් සඳහා රෝහල් වාට්ටු ඉදිකිරීම සහ කොවිඩ් -19 රෝගීන් සඳහා ඇඳන් නිෂ්පාදනය කිරීම උදාහරණ වේ සුනාමිය හේතුවෙන් අලුත්ගම දුම්රිය සහ දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ පුනරුත්ථාපනය කිරීම. මීට අමතරව, 2015 දී, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව විසින් වර්ග අඩි 76,000 ක මුළු ගොඩනැගිලි හතරක්, මීගමුව රෝහලේ ව්‍යුහාත්මකව හානි වූ අට මහල් ගොඩනැගිල්ලේ රෝගීන්ට පහසුකම් සැලසීම සඳහා රුපියල් මිලියන 250 ක් වෙන් කර රෝහලේ ව්‍යුහාත්මක ස්ථායිතාව යථා තත්ත්වයට පත් කරමින් අමතර මහලක් එක් කළ අතර එමඟින් රජයට ආසන්න වශයෙන් රුපියල් බිලියන 9 ක් ඉතිරි කර දෙන ලදී.

වෙළඳපල තුලනය සහ විනිවිදභාවය පවත්වා ගැනීම

රජය සතු ආයතනයක් ලෙස රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව ලංසු තැබීමේ ක්‍රියාවලින්හි විනිවිදභාවය වර්ධනය කිරීමෙන් ඉදිකිරීම් වෙළඳපොළේ සමතුලිතතාවය පවත්වා ගැනීමට උපකාරී වේ. එහි පැවැත්ම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් අතර අධික ලාභය මත පදනම් වූ හැසිරීම් සීමා කරයි, උද්ධමනය වූ ව්‍යාපෘති පිරිවැය වළක්වයි සහ මහජන අවශ්‍යතා ආරක්ෂා කරයි  තවද, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව හි උපායමාර්ගික කාර්යභාරය තීරණාත්මක රජයේ ව්‍යාපෘතිවල ජාතික සංවර්ධන ඉලක්ක සමඟ පෙළගැස්වීම සහතික කරයි.

ඉදිකිරීම් මිල දර්ශක සඳහා දායකත්වය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) රජයේ ව්‍යාපෘතිවල මිල උච්චාවචනයන් කළමනාකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන ඉදිකිරීම් මිල දර්ශක සකස් කිරීම සඳහා රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වෙතින් ලැබෙන දත්ත මත දැඩි ලෙස විශ්වාසය තබයි. රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව විසුරුවා හැරියහොත්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බොහෝ විට පෞද්ගලික ආයතනවලින් ලැබෙන දත්ත මත රඳා පවතිනු ඇති අතර, එමඟින් පක්ෂග්‍රාහී හෝ අසම්පූර්ණ දත්ත හේතුවෙන් රජයේ ව්‍යාපෘති පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත.

කර්මාන්ත ව්‍යාප්තිය සඳහා ශ්‍රම බලකාය පුහුණුව

ඉදිකිරීම් කර්මාන්තය විදේශීය වෙළඳපොළවල් දක්වා ව්‍යාප්ත කිරීමේ රජයේ දැක්ම රඳා පවතින්නේ කුසලතා ඇති සහ අනුවර්තනය කළ හැකි ශ්‍රම බලකායක් මතය. රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව එහි පුළුල් ව්‍යාපෘති සහ රාජ්‍ය අංශයේ වරම සමඟින්, සැබෑ තත්වයන් යටතේ ශ්‍රම බලකා පුහුණුව සඳහා අද්විතීය වේදිකාවකි.  න්‍යායාත්මක දැනුම ස්ථානීය අත්දැකීම් සමඟ ඒකාබද්ධ කිරීමෙන් රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව හට ගෝලීය ප්‍රමිතීන් සපුරාලීමට හැකියාව ඇති වෘත්තිකයන් බිහි කළ හැකි අතර එමඟින් ජාත්‍යන්තර වෙළඳපල තුළ කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩි දියුණු කළ හැකිය.

තවද, වර්තමානයේදී, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව විශ්ව විද්‍යාල ඉංජිනේරු සිසුන්ට සහ කාර්මික පුහුණු ආයතනවලින් පුහුණුවන්නන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම ඇතුළුව දහස් ගණනක් තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීමේදී උපකාරී වී ඇත.  සංස්ථාව රජයේ සහ පෞද්ගලික සංවිධාන දෙකටම දායක වන දක්ෂ හා පළපුරුදු ඉංජිනේරුවන් රාශියක් බිහි කර ඇත. රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වසා දැමීම රැකියා අහිමිවීමට හේතු වන අතර රාජ්‍ය අංශය තුළ තාක්ෂණික විශේෂඥතාවයේ සැලකිය යුතු පරතරයක් ඇති කරන අතර එමඟින් තීරණාත්මක යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රටේ ධාරිතාවයට බාධා ඇති වේ.

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් අංශයේ ස්ථාවරත්වය

මෑත කාලීන ආර්ථික අර්බුදය හේතුවෙන් සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් අංශය සැලකිය යුතු පසුබෑමකට මුහුණ දී ඇති අතර, පසුගිය වසර දෙක තුන තුළ තියුණු පහත වැටීමක් අත්විඳිමින් සිටී.  මෙම පසුබෑම තරුණ, පළපුරුදු ඉංජිනේරුවන්, විශේෂයෙන් කොන්ත්‍රාත් ව්‍යාපෘති වල නියැලී සිටින අය විශාල වශයෙන් පිටව යාමට හේතු වී ඇති අතර, බොහෝ දෙනෙක් විදේශයන්හි අවස්ථා සොයමින් සිටිති.  මෙම කාලය තුළ, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාවේ ඉංජිනේරුවන්ගෙන් 60% කට වඩා වැඩි පිරිසක් සංවිධානයෙන් ඉවත් වී ඇති අතර, සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් රටවලට සංක්‍රමණය වී ඇත.  මෙවැනි ස්වයං මූල්‍යකරණ රාජ්‍ය ආයතනයක් වසා දැමීම මෙම ගැටළුව තවදුරටත් උග්‍ර කරන අතර රජයේ ප්‍රතිපත්ති සමඟ ඇති පරස්පර තත්ත්වය ද ඇති කරයි.

## තවදුරටත් වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා

සීමිත ව්‍යාපෘති සංඛ්‍යාව, ආදායම් උත්පාදනයට සාපේක්ෂව ප්‍රධාන කාර්යාලයේ ඉහළ පොදු කාර්ය පිරිවැය සහ පෙර රජය විසින් සිදු කරන ලද දේශපාලන මැදිහත්වීම්වල අහිතකර බලපෑම් ඇතුළුව සංස්ථාව මුහුණ දෙන මූල්‍ය අභියෝග සැලකිල්ලට ගනිමින්, මෙම යෝජනාව මඟින් මෙහෙයුම් උපායමාර්ගිකව අඩු කර සංස්ථාව සුමටව පවත්වාගෙන යාමට උත්සාහ කරයි. මෙම යෝජනාව සාධාරණීකරණය කිරීමේදී සඳහන් කර ඇති පරිදි ජාතික අවශ්‍යතා සපුරාලන අතරම සහ රටට දිගුකාලීන ප්‍රතිලාභ ලබා දෙන අතරම මෙම අභියෝගවලට මුහුණ දීම ඉලක්කයයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග යෝජනා කෙරේ.

### මූල්‍යමය වශයෙන් ශක්‍ය ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කිරීම

ඉදිකිරීම් කටයුතුවලට ප්‍රමුඛත්වය දීම, විශේෂයෙන් කොන්ක්‍රීට් අංගන, රථවාහන ආලෝක සංඥා පද්ධති සහ කෙටි කාලීන ආදායම් උත්පාදන විභවයක් සහිත මූල්‍යමය වශයෙන් හොඳ ව්‍යාපෘති ඇතුළත් වේ. මෙය සංස්ථාවේ මූල්‍ය ස්ථාවර කිරීමට උපකාරී වනු ඇත.

### මූල්‍ය ස්ථාවරත්වය සඳහා ඉහළ වටිනාකමක් ඇති දේපළ භාවිතා කිරීම

කොළඹ 07, ග්‍රෙගරි මාවතේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලක් ඇතුළුව පර්චස් 140 ක දේපළක් බදු දීමෙන් සංස්ථාව මාසිකව රුපියල් මිලියන තුනක් පමණ උපයමින් සිටී. 2005 වන විට ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් බිලියන 4 ක් වන මෙම දේපළ නිසි උපදේශනයකින් හෝ වන්දි ගෙවීමකින් තොරව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට පැවරීමට යෝජනා කර ඇත (කැබිනට් පත්‍රිකාව අංක අමප/24/1684/608/032-I 2024 09 10 දිනැති) සංස්ථාවේ මූල්‍ය වගකීම් පියවීම සඳහා, පැවරීමට පෙර දේපළෙහි වත්මන් තක්සේරු වටිනාකමට සමාන ආදායමක් උපයා ගැනීමට යෝජනා කෙරේ. ඊට අමතරව, යෝජිත ඉලක්කගත ආයෝජන සැලැස්මේ දක්වා ඇති මූල්‍ය හිඟයන් පියවීම සඳහා රුපියල් බිලියන 1 ක වෙන් කිරීමක් යෝජනා කෙරේ. මෙම ප්‍රවේශය සංස්ථාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන අතර පවතින වගකීම්වල ප්‍රමාණය අවම කරනු ඇත.

### රජයේ ව්‍යාපෘති සෘජුවම ප්‍රදානය කිරීම

සංස්ථාව ශක්තිමත් කිරීම සහ එහි දායකත්වය හඳුනා ගැනීම සඳහා, සංස්ථාවට සාධාරණ රජයේ ව්‍යාපෘති සංඛ්‍යාවක් සෘජුවම ප්‍රදානය කිරීමට යෝජනා කෙරේ. මෙය ජාතික සංවර්ධනයට සහාය වන අතරම රජයට පිරිවැය අඩු කරනු ඇත. උදාහරණයක් ලෙස සංස්ථාවේ කොන්ක්‍රීට් අංගන දැනට තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා විදුලිබල මණ්ඩලය සඳහා විදුලි කණු සහ දුම්රිය මාර්ග සඳහා රේල් සිල්පර නිෂ්පාදනය කරයි. මෙම ක්‍රියාවලියට ලංසු බැඳුම්කර ඇතුළත් වන අතර එය රජයේ වියදම්වලට එකතු වේ. මෙම ව්‍යාපෘති සෘජුවම සංස්ථාව වෙත ප්‍රදානය කිරීමෙන්, ලංසු තැබීම සහ ලංසු බැඳුම්කර ආශ්‍රිත පිරිවැය ඉවත් කළ හැකි අතර නිෂ්පාදන පිරිවැය අඩු කළ හැකි අතර එමඟින් රජයට සැලකිය යුතු ඉතිරියක් සිදු වේ.

### ව්‍යාපෘති බැඳුම්කර නිකුත් කිරීම

මූල්‍ය බාධාවන් ලිහිල් කිරීමට සහ මුදල් ප්‍රවාහය වැඩිදියුණු කිරීමට, අනෙකුත් රාජ්‍ය සංවිධාන සඳහා කරන පරිදි, රජයේ ව්‍යාපෘති සඳහා සංස්ථාව විසින් දරනු ලබන ලංසු, කාර්ය සාධන සහ අත්තිකාරම් බැඳුම්කර නිකුත් කිරීමට යෝජනා කිරීම.

<u>ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම</u>

කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ශ්‍රම යැපීම අඩු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම සාම්ප්‍රදායික ක්‍රමවලින් පරිගණක පාදක පද්ධති වෙත සංක්‍රමණය වීම සහනාධාර, ප්‍රසාද දීමනා, වාර්ෂික වැටුප් වර්ධක සහ සේවක උසස්වීම් ගණනය කිරීම ඇතුළු මෙහෙයුම් විධිමත් කරනු ඇත. මෙම මිනුම් සුදුසුකම්, කාර්ය සාධනය, ආදායම් දායකත්වය සහ වැඩ කාර්යක්ෂමතාව මත පදනම් වන අතර, පරිගණක පාදක මගින් කුසලතා පාදක පද්ධති විශ්ලේෂණයක් ප්‍රවර්ධනය කරනු ඇත.

<u>තිරසාරභාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ</u>

හානිකර දේශපාලන බලපෑම්වලින් සංස්ථාව ආරක්ෂා කිරීම සඳහා නව ප්‍රතිපත්ති හඳුන්වා දීම සහ බලාත්මක කිරීම. මෙම ප්‍රතිසංස්කරණ මගින් සංස්ථාවේ දිගුකාලීන තිරසාරභාවය සහ වර්ධනය සහතික කිරීම, ස්ථාවර මෙහෙයුම් පරිසරයක් පෝෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

ජාතියේ සංවර්ධන අරමුණු සඳහා දායක වෙමින් මූල්‍ය ප්‍රතිසාධනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා සංස්ථාව ස්ථානගත කිරීම මෙම පියවරයන්හි අරමුණයි.

# දස අවුරුදු කාර්ය සාධන සාරාංශය

රු. මි.

| විස්තරය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. පිරිවැටුම | 3,566 | 3,466 | 2,430 | 2,103 | 2,348 | 2,878 | 4,192 | 1,449 | 4,216 | 2,546 |
| 2. මෙහෙයුම් වියදම් | 3,440 | 3,234 | 2,193 | 1,834 | 2,175 | 2,696 | 4,584 | 1,338 | 3,812 | 2,182 |
| 3. දල ලාභය | 126 | 232 | 236 | 269 | 173 | 182 | (392) | 111 | 403 | 363 |
| 4. අනෙකුත් ආදායම් | 199 | 171 | 177 | 148 | 172 | 192 | 119 | 327 | 259 | 177 |
| 5. පරිපාලන වියදම් | 170 | 180 | 201 | 199 | 197 | 200 | 229 | 211 | 177 | 310 |
| 6. අනෙකුත් වියදම් | 10 | 23 | 77 | 104 | 28 | 23 | 125 | 281 | 138 | 89 |
| 7. මූල්‍ය ආදායම් | 9 | 6 | 3 | 6 | 11 | 12 | 7 | 6 | 8 | 8 |
| 8. මූල්‍ය වියදම් | 68 | 93 | 87 | 96 | 119 | 145 | 224 | 209 | 259 | 122 |
| 9. බදු වලට පෙර ශුද්ධ ලාභය | 97 | 112 | 50 | 23 | 12 | 19 | (844) | (257) | 96 | 27 |
| 10. මුළු වත්කම් | 4,893 | 4,374 | 4,224 | 4,472 | 5,111 | 6,148 | 5,472 | 5,799 | 6,770 | 7,593 |
| 11. ශුද්ධ වත්කම් | 1,793 | 1,750 | 1,555 | 1,500 | 1,588 | 1,556 | 637 | 310 | 324 | 839 |
| 12. යෙදවූ ප්‍රාග්ධනය මත ඉපැයීම් % | 5.89 | 6.85 | 3.5 | 6.71 | 6.43 | 5.41 | -32.69 | -3.37 | 16.11 | 5.17 |
| 13. වත්කම් මත ඉපැයීම් % | 1.99 | 2.57 | 1.19 | 2.53 | 2.35 | 2.46 | -11.15 | -0.99 | 5.13 | 1.86 |
| 14. දළ ලාභය % | 3.54 | 6.7 | 9.71 | 12.70 | 7.38 | 6.33 | -7.75 | 7.65 | 9.56 | 14.28 |
| 15. ශුද්ධ ලාභය % | 2.73 | 3.2 | 2.0 | 1.1 | 0.52 | 0.64 | -16.68 | -17.76 | 2.28 | 1.06 |
| 16. ජංගම අනුපාතය | 1.06 | 1.02 | 1.04 | 1.04 | 1.1 | 1.4 | 1.16 | 1.10 | 1.22 | 1.20 |